# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 14,838 — 1969 ජනවාරි 24 වැනි සිකුරාද — 1969.1.24

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)

## I වැනි කොටස: (II) වැනි ඡේදය—පළකිරීම්

(වෙන වෙනම ගොනුකරගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොද ඇත.)


| | පිට | | පිට |
|---|---|---|---|
| තනතුරු—ඇබෑර්තු ... ... ... | 103 | කොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම ... ... | 127 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 118 | ආණ්ඩුවේ නොවන දන්වීම් ... ... | — |
| ටෙන්ඩර් කැඳවීමේ දන්වීම් ... ... ... | 119 | රට බීම විකිණීමේ බලපත්‍ර සඳහා වූ අයදුම් පත් ... ... | — |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දන්වීම් ... ... | 125 | වෙන්දේසි කිරීම් පිළිබඳ දන්වීම් — ... | — |
| බඩු බාහිරාදිය විකිණීම ... ... ... | 127 | විවිධ දන්වීම් ... ... — | — |


### තනතුරු — ඇබෑර්තු

### ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළ කෙරෙන රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත්කිරීම් සම්බන්ධයෙන් අදාලවන පොදු කොන්දේසි

**දීමනා.**—ගෙවල් කුලී දීමනාව, තාවකාලික ජීවන දීමනාව, තාවකාලික විශේෂ දීමනාව යන මෙම දීමනා ඒ සම්බන්ධයෙන් අන්‍යාකාරයෙන් සඳහන් කොට නැති අවස්ථාවන් හිදී ආණ්ඩුවේ රෙගුලාසි අනුව ගෙවනු ලැබේ.

2. **සේවා කොන්දේසි.**—පත්වීම් වූ කලී රාජ්‍ය සේවා කොමිෂන් සභා ව්‍යවස්ථා, මුදල් රෙගුලාසි, කාර්ය සංවිධාන සංග්‍රහ රෙගුලාසි, දෙපාර්තමේන්තු විධාන හෝ රෙගුලාසි, යන මේවාට සහ ආණ්ඩුවෙන් කලින් කල නිකුත් කෙරෙන සෙසු නීතිවිධානවලට හෝ රෙගුලාසිවලට යටත් වන්නේ ය.

3. **සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි.**—(i) විශ්‍රාම වැටුප් රහිත සංස්ථාවලට කරන පත් කිරීම්වල දී (දවස් පඩි ලබන්නන් හැර), ඒ තනතුරුවලට පත්වන්නන්ට සෑම පඩියෙන් සියයට 6ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට ගෙවීමට නියම කරනු ලැබේ. ඊට අතිරේක වශයෙන් ස්වකීය මාසික පඩියෙන් සියයට 5ක් එක් කිරීමට ඔවුන්ට ඉඩ දෙනු ලැබේ. නිලධාරියා මේ දෙකොටස් සවරණ් ගෙවීවත් එක් එක් මුදල් අවුරුද්ද අවසානයේ දී මුළුව ගෙවා ඇති සම්පූර්ණ මුදලෙන් සියයට 7½ කට සමාන වන මුදලක් ඒ අරමුදලට සම්භාදම් වශයෙන් ආණ්ඩුවෙන් ද ගෙවනු ලැබේ.

(ii) ඒ ඒ තනතුරුවලට පත්වන්නන් විසින් "ඇප තැබීම කළ යුතුය" යි ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් තීරණය කරනු ලැබුවහොත් එවිට ආණ්ඩුවේ නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත අනුකූලව ඇප තබන ලෙස ඔවුන්ට නියම කෙරෙනු ඇත.

(iii) තනතුරුවලට පත්වන්නන් අතුරෙන් දැනටම රාජ්‍ය සේවයේ සිටින්නන් හැර සෙසු අයට ලංකාවේ ස්ථිර පෙදෙසක ස්ථිරව සේවය කිරීමට ඔවුන් සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම සඳහා ආණ්ඩුවේ වෛද්‍ය නිලධාරියකු විසින් පවත්වන වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටීමට නියම කරනු ලැබේ.

4. **රාජ්‍ය සේවයට ඇතුළු වන ප්‍රවේශයන්.**—(i) යම් තනතුරක් සඳහා වඩා දීර්ඝ කාලයක් නියම කොට ඇත්තම් මිස, අදාළවන පරිදි විශ්‍රාම වැටුප් සහිත/විශ්‍රාම වැටුප් රහිත තනතුරුවලට පත් කරන ලද නව ප්‍රවේශක නිලධාරීන්ගේ ආධුනික/අත්හදා සේවා කාල පරිච්ඡේදය අවුරුදු තුනක් විය යුතුය.

---

**සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා එවනු ලබන දන්වීම් පිළිබඳ**

### විශේෂ නිවේදනයයි

ඉදිරියට පළවන සාමාන්‍ය සතිපතා ගැසට් පත්‍රවල පළකිරීම සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දන්වීම් බාරගන්නා අන්තිම වේලාවන් සහ පළකිරීමේ දින දැක්වෙන, මෙම ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙළවරෙහි පළකර ඇති විශේෂ නිවේදනය කෙරෙහි සියළුදෙනාගේ අවධානය යොමු කෙරේ. යථෝක්ත නිවේදනයේ සඳහන් නියමිත වේලාවන්ට පසුව මෙහි ලැබෙන සියළුම දන්වීම් ඒවා එවන ලද අය වෙත ආපසු එවනු ලැබේ.

1968 දෙසැම්බර් මස 20 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණාලය,
කොළඹ.

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
වැඩබලන ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

---

පැමිණිලි ගැන සලකා බැලිය නොහැකිය. අවසාන දිනයත් දක්වා ඉල්ලුම් පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදු විය හැකි අලාභ හානි අයදුම්කරුවන් විසින්ම විඳ දරා ගත යුතු ය.

(iii) පිටරටවල අයදුම්කරුවන්ට මුද්‍රිත ඉල්ලුම් පත්‍ර පෝරම විදේශයෙහි සිටින ලංකා නියෝජිතයන්ගේ කාර්යාලවලින් ලබා ගත හැකි ය. තම ඉල්ලුම්පත්‍ර රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත එවනු සඳහා, තමන් පදිංචි හෝ තමන්ට ආසන්නම හෝ රටට පත්කොට සිටින ලංකා නියෝජිතයාගේ කාර්යාලයට නියමිත කාල සීමාව ඇතුළත දී භාර දීමට අයදුම්කරුවන්ට සිය අභිමතය පරිදි පිළිවන.

(iv) **වෛද්‍ය පරීක්ෂණය සහ යානපත්‍ර.**—ලංකාණ්ඩුව යටතේ සේවය සඳහා පත් කරනු පිණිස විදේශයන්ගෙන් තෝරාගනු ලබන ලාංකික නිලධාරියා ඔහු සේවය සඳහා ශාරීරික වශයෙන් යෝග්‍යදැයි දැනගනු පිණිස පිළිගත් වෛද්‍යවරයකු ඉදිරියෙහි පරීක්ෂණයක් සඳහා පෙනී සිටිය යුතුය. එම පරීක්ෂණය සඳහා ගාස්තුවත් ලංකාවට පැමිණීම සඳහා ඔහුගේ යානපත්‍ර ගාස්තුවත් ඔහු විසින්ම ගෙවිය යුතු වෙයි.

2. සේවයේ නියුක්ත කරවීමේ වගන්ති සහ කොන්දේසි :

(අ) මේ තනතුර ස්ථිරය, විශ්‍රාම වැටුප් සහිතය. පත් කරනු ලබන ලබන අයදුම්කරු තුන් අවුරුදු කාලසීමාවකට පරිවාස තත්ව යේ සිටිනවා ඇත. ඔහු විසින් දෙපාර්තමේන්තුවේදී පුහුණු වීමේ කාලයක් ගත කළ යුතු අතර එක්සත් රාජධානියට ගොස් ලන්ඩනයේ වතුපාලනය පිළිබඳ විද්‍යාලයෙහි, කේම් බ්‍රිජ් විශ්ව විද්‍යාලයෙහි හෝ වෙනත් පිළිගත් ආයතනයක අවුරුදු තුනක් අනුමත කරන ලද පුහුණුවීමේ පාඨමාලාවක් හැදෑරීම ද සහකාර තක්සේරුකරු තනතුරුවල ස්ථිර කරනු ලැබීමට පෙර වතුපාලනය පිළිබඳ උපාධි තත්ත්වයේ විභාගය කින් සමත් වීමද අවශ්‍ය විය හැකිය. පුහුණුවීමේ කාලය තුළ සතුටුදායක දියුණුවක් නොදක්වුවහොත් පත් කරන ලද අපේක්ෂකයා ඕනෑම විටෙකදී තනතුරෙන් පහකරනු ලැබීමට ඉඩ ඇත.

(ආ) තෝරාගනු ලබන අයදුම්කරු ලංකාණ්ඩුව සමග ගිවිසුමකට ඇතුළත් විය යුතු අතර, ඇපකරුවන් දෙදෙනෙකු සමග ඇප ඔප්පුවකින්ද සම්බන්ධවී,

(i) පොරොන්දු විය යුතු වෙනත් දේවල් අතර නියමිත අභ්‍යාස පාඨමාලාව අවංක ලෙස සහ උද්‍යොගීමත්ව හදාරා සතුටුදායක අන්දමින් නිමකිරීමටත් එසේ නිම කිරීමෙන් පසුව නියමිත කාල පරිච්ඡේදයක් තුළ ලංකාණ්ඩුවේ සේවය කළ යුතුයයි කියා සිටියහොත් (කාලපරිච්ඡේදය නියම කිරීම ලංකාණ්ඩුව විසින් කෙරෙනු ඇත.) එසේ සේවය කිරීමටද,

(ii) ගිවිසුමේ රෙගුලාසි සහ කොන්දේසි පිළිපැදීමට තමා අපොහොසත් වුවහොත් අධ්‍යයන පාඨමාලාවේ මුළු ගාස්තුව, එනම් ලංකාණ්ඩුව විසින් ඉගැන්වීමේ මුළු කාර්යය වෙනුවෙන් දරන්නට යෙදුන සියලු විය හියදම් (එනම් වැටුප්, දීමනා, යානපත්‍ර ගාස්තු සහ වෙනත් ගාස්තු ආදිය) ලංකාණ්ඩුවට ආපසු ගෙවීමටද පොරොන්දු විය යුතුයි.

3. **වැටුප් සහ දීමනා.**—මේ තනතුරට හිමි වැටුප් ක්‍රමය මෙසේය :— වර්ෂයකට රුපියල් 4,080—360 ක 12 ක් හා 480 ක 6ක්—රුපියල් 11,280 දක්වා වැඩිවන වැටුපක්. රුපියල් 8,400 යේ වාර්ෂික වැටුපට පෙර කාර්යක්ෂමතා කඩඉමකි.

සැ. යු.—පහත 4 (ඇ) (ii) හි සඳහන් සුදුසුකම් තිබෙන අයදුම් කරුවන් තෝරාගනු ලැබුවහොත්, ඔවුන් රුපියල් 5,160 ක ආරම්භක වාර්ෂික වැටුපෙහි පිහිටුවනු ලැබේ.

4. **අවශ්‍ය සුදුසුකම්.**—සෑම අයදුම්කරුවකුම පහත සඳහන් කරුණු සනාථ කිරීමට සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුය :—

(අ) විශිෂ්ඨ චරිතයෙන් හා හොඳ ශාරීරික සනීපයෙන් යුක්ත බව.

(ආ) 1969. 2. 7 වැනි දිනට වයස අවුරුදු 21 ට නොඅඩු බව හා අවුරුදු 30 ට නොවැඩි බව, පහත (ඇ) (ii) හි සඳහන් සුදුසුකම් තිබෙන අයට ඉහළම වයස් සීමාව අවුරුදු 35 වේ. (අනිත් සියලුම සුදුසුකම් තිබෙන දැනට රජයේ සේවයේ නියුක්ත නිලධාරීන්ට මෙම වයස් සීමාව බලපාන්නේ නැත.)

(ඇ) (i) තම උපාධි පරීක්ෂණයේදී අඩුම වශයෙන් දෙවැනි පන්තියේ ගෞරව සාමාර්ථයක්වත් ලබාගත පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධිධරයෙක් බව හා උසස් පාඨශාලා සහතික පත් පරීක්ෂණයේදී හෝ පොදු සහතික පත්‍ර උසස් පෙළ පරීක්ෂණයේදී හෝ මීට සමාන පරීක්ෂණයකදී ගණිතය විෂයයක් ලෙස ගෙන සමත් වී ඇති බව.

(ii) සහකාර තක්සේරුකරුවන්ගේ ශ්‍රේණියට කෙළින්ම බඳවා ගැනීම පිණිස, ලන්ඩන් විශ්ව විද්‍යාලයේ බී. ඇස්. සී. (වතුපාලනය) උපාධිය හෝ කේම්බ්‍රිජ් විශ්ව විද්‍යාලයේ බී.ඒ. (වතුපාලනය හෝ ඉඩම් අර්ථ ක්‍රමය) උපාධිය හෝ අධිකාරි පත්‍ර ලත් මිනින්දෝරුවන්ගේ රාජකීය ආයතනයෙහි (තක්සේරු අංශයෙහි) අවසාන පරීක්ෂණයෙන් හෝ අධිකාරි පත්‍ර ලත් වෙන්දේසිකරුවන්ගේ හා වතු නියෝජිත යන්ගේ ආයතනයෙහි (පලාත් අංශයෙහි) අවසාන පරීක්ෂණ යෙන් හෝ සමත් වී ඇති අයදුම්කරුවන්ගෙන් ද ඉල්ලුම් පත්‍ර භාරගනු ලැබේ.

සැ. යු.—ඉහත (ඇ) (ii) හි සඳහන් සුදුසුකම් ඇති අය ගැන වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.

5. පහත සඳහන් ලියකියවිලි එකක් හෝ සියල්ලම හෝ ඉල්ලා සිටි විටක ඉදිරිපත් කිරීමට සෑම අයදුම්කරුවෙක්ම සූදානම්ව සිටිය යුතුය :—

(අ) උප්පැන්න සහතිකය (සැ. යු.—අධ්‍යාපන රෙගුලාසි අනුව උපකෘත පාසැලක ප්‍රයෝජනය සඳහා ඉදිරිපත් කරනලද සහතික හෝ බව්තීස්ම සහතික භාරගනු නොලැබේ.)

(ආ) ලබාගත ඇති උසස්ම අධ්‍යාපන සහතිකය.

(ඇ) චරිත සහතික දෙකක්. මින් එකක් ඉගැන්වීම භාර අධ්‍යක්ෂගෙන්, විද්‍යාලීය ආචාර්යවරයා ගෙන් හෝ මහාචාර්යවරයාගෙන් විය යුතුය.

(ඈ) වෘත්තීය සහ/හෝ ශිල්පීය සුදුසුකම් පිළිබඳ සහතික.

(ඉ) සිංහල විෂයයෙන් සමත් උසස් ම විභාගය පිළිබඳ සහතිකය.

සැ. යු.—(i) අයදුම්පතට කිසිම ලියවිල්ලක් හෝ එහි පිටපතක් හෝ නොඇමිනිය යුතුය.

(ii) ඉල්ලූ අවස්ථාවක ලියකියවිලි ඉදිරිපත් කිරීමට නොහැකිවන අපේක්ෂකයන්ගේ අයදුම්පත් සලකා බලනු නොලැබේ.

6. රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් විසින්ම තමතමන්ගේ ඉල්ලුම්පත්‍ර ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. එනෙකුදු වුවත්, තම ඉල්ලුම් පත්‍ර එසේ එව්වේ කවදාදැයි ඉල්ලුම්පත්‍ර භාර ගන්නා අවසාන දිනදී හෝ ඊට පෙර හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ට දැනගන්නට ලැබෙනසේ ඔහුවෙත කෙළින්ම ලියා එවිය යුතුය. ඉල්ලුම්පත්‍ර පෝරමය සමග තමන්ට එවන ලද ("ආ" සලකුණ දරණ) මුද්‍රිත තැපැල්පත මේ සමග භාවිතා කල හැකිය.

7. අයදුම්පත් හෝ ඒ සම්බන්ධ අනෙක් ලියකියවිලි සියල්ලක්ම රාජ්‍යසේවා කොමිෂන් සභාවේ ලේකම්තැනට හැර මෙම දෙපාර්ත මේන්තුවේ කිසියම් නිලධාරියෙකුගේ නමට පුද්ගලිකව නොඑවිය යුතුය.

8. මෙම ගැසට් පත්‍රයේ I කොටසේ (II) ඡේදයේ ආරම්භයේ සඳහන් රාජ්‍යසේවා තනතුරුවලට කරන පත්කිරීම්වලට අදාල පොදු කොන්දේසිවලට අවධානය යොමු කරනු ලැබේ.

9. අයදුම්කරුවන් විසින්, ඉල්ලුම්පත්‍ර පෝරමය සමග තමතමන්ට නිකුත් කරන ලද ("අ" සලකුණ දරණ) මුද්‍රිත තැපැල්පත, එහි සඳහන්කොට ඇති පරිදි සම්පූර්ණකොට ආපසු එවිය යුතුය. එවිට ඉල්ලුම්පත්‍ර පෝරමය මේ කාර්යාලයට ලැබුනුබව ඔවුන්ට දන්වනු ලැබේ. මේ නියමය නොපිලිපදින අයදුම්කරුවන්ගේ ඉල්ලුම්පත් ලැබුණු බව ඔවුන්ට දන්වනු නොලැබේ. මේ නියමය පිළිපදින්නාවූද ඉල්ලුම්පත්‍ර භාරගන්නා අවසාන දිනයේ සිට සති තුනක් ඇතුළත තම ඉල්ලුම්පත්‍රය ලැබුනුබවට දැන්වීමක් නොලැබෙන්නාවූද අයදුම් කරුවන් විසින් ඒ බව වහාම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ට දැනුම්දිය යුතුය. මේ විධානය ඉටුකිරීම පැහැර හැරියහොත් අයදුම්කරුවෙකු ගැන සලකා බලනු ලැබීම සම්බන්ධයෙන් ඔහුට ඇති අයිතිය අහිමිවේ.

ඩී. ආර්. එල්. බාලසූරිය,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1969. 1. 16,
කොළඹ 1, ගාලු මුවදොර මහලේකම් ගොඩනැගිල්ලේ,
රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේදීය.
නැ. පෙ. 500.

ඔහුවෙත කෙලින්ම ලියා එවිය යුතුය. ඉල්ලුම්පත්‍ර පෝර්මය සමග තමන්ට එවන ලද ("බී" සලකුණ දරණ) මුද්‍රිත තැපැල්පත මේ සමග භාවිතා කල හැකිය.

8. අයදුම්පත් හෝ ඒ සම්බන්ධ අනෙක් ලියකියවිලි සියල්ලක්ම රාජ්‍යසේවා කොමිෂන් සභාවේ ලේකම්තැනට හැර මෙම දෙපාර්තමේන්තුවේ කිසියම් නිලධාරියෙකුගේ නමට පුද්ගලිකව නොඑවිය යුතුය.

9. මෙම ගැසට් පත්‍රයේ I කොටසේ (II) ඡේදයේ ආරම්භයේ සඳහන් රාජ්‍යසේවා තනතුරුවලට කරන පත්කිරීම් සම්බන්ධයෙන් අදාලවන පොදු කොන්දේසිවලට අවධානය යොමු කරනු ලැබේ.

10. අයදුම්කරුවන් විසින්, ඉල්ලුම්පත්‍ර පෝර්මය සමග තමතමන්ට නිකුත් කරන ලද ("ඒ" සලකුණ දරණ) මුද්‍රිත තැපැල්පත, එහි සඳහන්කොට ඇති පරිදි සම්පූර්ණකොට ආපසු එවිය යුතුය. එවිට ඉල්ලුම්පත්‍ර පෝර්මය මේ කාර්යාලයට ලැබුනුබව ඔවුන්ට දන්වනු ලැබේ. මේ නියමය නොපිලිපදින අයදුම්කරුවන්ගේ ඉල්ලුම්පත් ලැබුණු බව ඔවුන්ට දන්වනු නොලැබේ. මේ නියමය පිළිපදින්නාවූද ඉල්ලුම්පත්‍ර භාරගන්නා අවසාන දිනයේ සිට සති තුනක් ඇතුළත තම ඉල්ලුම්පත්‍රය ලැබුනුබවට දැන්වීමක් නොලැබෙන්නාවූද අයදුම් කරුවන් විසින් ඒ බව වහාම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ට දැනුම්දිය යුතුය. මේ විධානය ඉටුකිරීම පැහැර හැරියහොත් අයදුම්කරුවෙකු ගැන සලකා බලනු ලැබීම සම්බන්ධයෙන් ඔහුට ඇති අයිතිය අහිමිවේ.

ඩී. ආර්. එල්. බාලසූරිය,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1969.1.16,
කොළඹ 1, ගාලු මුවදොර මහලේකම් ගොඩනැගිල්ලේ,
රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේදීය,
තැ. පෙ. 500.

1–978/3—69.1.24 දින අංක 14 838 දරන ගැසට් පත්‍රය

---

අංකය : ඒඒ 103/එක්ස් 2051/68.

## ලංකාණ්ඩුවේ දුම්රිය සේවය

### කණිෂ්ඨ සහකාර ප්‍රාදේශීය ප්‍රවාහන අධිකාරි තනතුරු

ලංකාණ්ඩුවේ දුම්රිය සේවයේ යාන්ත්‍රික අංශයෙහි පුහුණු කිරීම පිණිස කණිෂ්ඨ සහකාර ප්‍රාදේශීය ප්‍රවාහන අධිකාරි තනතුරු සඳහා ඉල්ලුම් පත් එවන ලෙස මෙයින් ආරාධනා කරනු ලැබේ. මෙම කායඹාලය මගින් සපයන මුද්‍රිත ආකෘති පත්‍රයන්හි වූ ඉල්ලුම් පත් පහත සඳහන් දිනයට හෝ ඊට පෙර කොළඹ 1, තැ. පෙ. 500, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත ලැබෙන සේ එවිය යුතුය:—

(ඒ) මෙරට ඉල්ලුම් පත්‍ර: 1969 පෙබරවාරි මස 7 වැනිදා.

(බී) විදේශීය ඉල්ලුම් පත්‍ර: 1969 පෙබරවාරි මස 14 වැනිදා.

**සටහන :**

(i) මුද්‍රිත ඉල්ලුම් පත්‍ර පෝර්ම තැපෑලෙන් එවන ලෙස ඉල්ලුම් කරන විට අයදුම්කරු රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරියෙක්ද, නැද්ද යනු ඉතාමත් පැහැදිලිව සඳහන් කරමින් 9"×4" ප්‍රමාණයට කුඩා නො වූද, තම ලිපිනය ලියන ලද්දාවූ ද, මුද්දර නො ගැසුවාවූ ද ලියුම් කවරයක් එවිය යුතු ය.

(ii) ඉල්ලුම් පත්‍රයක් හෝ ඒ හා සම්බන්ධිත ලියමනක් තැපෑලේදී නැති වූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සළකා බැලිය හැකි නොවේ. අවසාන දිනයන් දක්වා ඉල්ලුම් පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදු විය හැකි අලාභ හානි අයදුම්කරුවන් විසින්ම විඳ දරා ගත යුතු ය.

(iii) පිටරටවල අයදුම්කරුවන්ට මුද්‍රිත ඉල්ලුම් පත්‍ර පෝර්ම විදේශයෙහි සිටින ලංකා නියෝජිතයන්ගේ කාර්යාලවලින් ලබා ගත හැකි ය. තම ඉල්ලුම්පත්‍ර රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත එවනු සඳහා, තමන් පදිංචි හෝ තමන්ට ආසන්නතම හෝ රටට පත්කොට සිටින ලංකා නියෝජිතයාගේ කාර්යාලයට නියමිත කාල සීමාව ඇතුළත දී භාර දීමට අයදුම්කරුවන්ට සිය අභිමතය පරිදි පිළිවන.

(iv) **වෛද්‍ය පරීක්ෂණය හා නැව් ගාස්තු.**—ලංකාණ්ඩුව යටතේ සේවය සඳහා පත් කරනු පිණිස විදේශයෙන් තෝරා ගනු ලබන ලාංකික නිලධාරීන්, ඔවුන් සේවය සඳහා ශාරීරික වශයෙන් යෝග්‍ය දැයි දැනගනු පිණිස, පිළිගත් වෛද්‍යවරයෙකු ඉදිරියෙහි පරීක්ෂණයක් සඳහා පෙනී සිටිය යුතුය. එම පරීක්ෂණය සඳහා ගාස්තුවත් ලංකාවට පැමිණීම සඳහා ඔවුන්ගේ නැව් ගාස්තුවත් ඔවුන් විසින්ම ගෙවිය යුතු වෙයි.

2. **සේවයේ නියුක්ත කරවීමේ වගන්ති හා කොන්දේසි :**

(i) තෝරාගත් අයදුම්කරුවන් අවුරුදු පහක කාලයක් පුහුණුව ලැබිය යුතු අතර, මෙම කාලය ඇතුළත ඔවුන් පරීක්ෂණ තත්ත්වයෙහි තබනවා ඇත. එම කාලය තුළ දී ඔවුන්ට රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් ගෙවීමට සිදුවිය හැකිය.

තෝරාගත් අයදුම්කරුවෝ, පත්වීම ලැබීමට පෙර, සම්මත අක්ෂි දෘෂ්ටි පරීක්ෂණයකින් ද සමත් විතාව, ශාරීරික යෝග්‍යතාවය නිගමනය කිරීම සඳහා පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකින් සමත් විය යුත්තාහ. ඔවුන් පස් අවුරුදු පුහුණුව විශ්වාසවන්තව ද, අනලස්ව ද සපුරාලීමේ සහ පුහුණුව සාර්ථක ලෙස අවසන් කිරීමෙන් අනතුරුව යටත් පිරිසෙයින් අවුරුදු 15 ක් වත් රජය සඳහා සේවය කිරීමේ ගිවිසුමකට සහ බැඳුම්කරයකට ද ඇතුළත් විය යුතුය. බැඳුම්කරයේ මුදල රුපියල් 30,000 ක් වේ.

(ii) පුහුණුවීමේ පාඨමාලාව පහත සඳහන් අයුරු වේ:—

(අ) මාස 36 ක්—රත්මලානේ දුම්රිය කර්මාන්තශාලාවලට අනුයුක්තව සිටිය යුතු අතර, මින් මාස 2 ක් සැළසුම් කායඹාලයේ ද, මාස 1 ක් කාර්මික කායඹාලයේ ද, මාස භාගයක් ගිණුම් කායඹාලයේ ද විය යුතුය.

(ආ) (i) හත් මසක්—දෙමටගොඩ වාෂ්ප ධාවනාගාරයට අනුයුක්තවීම.

(ii) හය මසක්—දෙමටගොඩ ඩීසල් ධාවනාගාරයට අනුයුක්තවීම.

(iii) තුන් මසක්—මාලිගාවත්තේ ගැල් හා මැදිරි අංශයට අනුයුක්තව සිටිය යුතු අතර, මින් එක් මසක් කොළඹ අංගනයේ සහ කොළඹ අංගනයේ ඩිපෝ මාස්ටර් සමග වේ.

(iv) එක් මසක්—නාවලපිටියේ ධාවනාගාරයට අනුයුක්තවීම.

(ඇ) දෙමසක්—පාලකවරුන් සමග දුම්රිය පාලක කටයුතු.

(ඈ) පස් මසක්—ගමනාගමන අධිකාරී කායඹාලය (දුම්රිය අංශය), ප්‍රවාහන අධිකාරී (ධාවන බලය), සහකාර ප්‍රවාහන අධිකාරී (බැහැර ස්ථාන), දුම්රිය සාමාන්‍යාධිකාරි කායඹාලය (පාලක නිලධාරී සහ කායඹාල සහකාර), මරදානේ ගබඩා දෙපාර්තමේන්තුව යන මේ එක් එක් ස්ථානයන්හි මාසය බැගින් අනුයුක්තව සිටීම.

(ඉ) පත්වීම ලැබ අවුරුදු තුනක් ඇතුළත, දුම්රිය ආරක්ෂක නීති හා රෙගුලාසි පිළිබඳ පරීක්ෂණයෙන් විශිෂ්ඨ ලෙස සමත්වීම.

(ඊ) පත්වීම ලැබ අවුරුදු හතරක් ඇතුළත, දුම්රිය දෙපාර්තමේන්තුවට අදාල පමණින් දුම්රිය දෙපාර්තමේන්තු උපදේශ (පාලන), රාජ්‍ය සේවා කොමිෂන් සභා ව්‍යවස්ථා, කායඹ සංවිධාන සංග්‍රහයේ රෙගුලාසි, මුදල් රෙගුලාසි ආදිය පිළිබඳ පරීක්ෂණයෙන් විශිෂ්ඨ ලෙස සමත්වීම.

(උ) පස් අවුරුදු පරීක්ෂණ කාලය අවසන්වීමට පෙර, ලන්ඩන්හි යාන්ත්‍රික ඉංජිනේරු ආයතනයේ උපාධිධාරී සාමාජිකත්වය හෝ සමාන සුදුසුකමක් ලබා ගැනීම.

(ඌ) පුහුණුවීමේ දැවුරුද්දක්, දුම්රිය සේවයේ වැඩ පිළිබඳ පළපුරුද්දක් හා පුළුල් අවබෝධයක් මෙන්ම වගකීම ඉසිලීමේ හැකියාවක් ලබනු පිණිස අතිරේක දීමනාවක් නොමැතිව ඕනෑම තනතුරක වැඩ බැලීම හෝ ඕනෑම රාජකාරියක් ඉටු කිරීම.

(iii) පුහුණුව ලබන්නන්ගේ අවශ්‍යතාවන්ට සරිලන පරිදි කවර අංශයක හෝ පුහුණුව වෙනස් කිරීමට දුම්රිය සාමාන්‍යාධිකාරීට හැකිය. නියමිත කවර කොන්දේසියක් හෝ ඉටු කිරීමට අපොහොසත් වුවහොත් හෝ පුහුණුවීමේ කවර අවදියක දී වුවද ස්වකීය වැඩ සහ පැවැත්ම පිළිබඳ සතුටු දායක වාර්තා ලබා ගැනීමට නොහැකි වුවහොත් ඔවුන්ගේ පත්වීම් නතර කරනු ලැබේ.

(iv) පුහුණුව සාර්ථක ලෙස නිමකොට නියමිත පරීක්ෂණවලින් සමත්වන අපේක්ෂකයින් රු. 5,160—360×3—6,240/6,960—360×4—480×10—රු. 13,200 (වාර්ෂිකව රු. 11,280 ක වැටුපෙහි දැවුරුදු නැවතීමක් හා රු. 6,960 සහ රු. 11,280 ට පෙර කාර්යක්ෂමතා කඩඉම් සහිතව) යන වාර්ෂික වැටුප් පරිමාණය මත, සහකාර ප්‍රාදේශීය ප්‍රවාහන අධිකාරී ශ්‍රේණියේ ස්ථිර තනතුරුවලට පත්කිරීමේ බලාපොරොත්තුවෙන්, අතිරික්ත සහකාර ප්‍රාදේශීය ප්‍රවාහන අධිකාරීන් වශයෙන් පත් කරනු ලැබේ.

**3. වැටුප් සහ දීමනා.**—මෙම තනතුරුවලට හිමි වාර්ෂික වැටුප් ක්‍රමය මෙසේය : වර්ෂයකට රුපියල් 4,080—360—6,240.

**සටහන.**—පත්වීම ලබන්නන් ලන්ඩන්හි යාන්ත්‍රික ඉංජිනේරු ආයතනයේ උපාධිධාරී සාමාජිකත්වය හෝ සමාන සුදුසුකමක් ලබා ගත්විට වර්ෂයකට රුපියල් 5,160—360×3—6,240/6,960—360×4—480×10—13,200 (වර්ෂයකට රුපියල් 11,280 වැටුපෙහි ඇවුරුදු නැවතිමක් හා රුපියල් 6,960 සහ රුපියල් 11,280 ට පෙර කාර්යක්ෂමතා කඩඉම් සහිතව) යන වැටුප් ක්‍රමය මත තබනු ලැබේ. ලංකා විශ්ව විද්‍යාලයේ ඉංජිනේරු උපාධිය හෝ සමාන පිළිගත් උපාධියක් හිමි පත්වීම් ලබන්නන් ද ඉහත සඳහන් වැටුප් ක්‍රමයට හිමි වේ.

(i) ඉහත සඳහන් වැටුප් ක්‍රමයෙහි රු. 10,800 ක වාර්ෂික වැටුප ඉක්මවීමට ඔවුන් ලන්ඩන්හි යාන්ත්‍රික ඉංජිනේරු ආයතනයේ ආශ්‍රිත සාමාජිකත්වය ලබා ගත යුතුය.

(ii) ලන්ඩන්හි යාන්ත්‍රික ඉංජිනේරු ආයතනයේ ආශ්‍රිත සාමාජිකත්වය හිමි අයදුම්කරුවකු මේ තනතුරකට පත් කිරීම සඳහා තෝරාගනු ලැබුවහොත්, ඔහු ඉහත සඳහන් වැටුප් ක්‍රමයෙහි වර්ෂයකට රු. 7,320 ක ආරම්භක වැටුපක් ලැබීමට සුදුසුවේ. ඔහු පත්වීමේ දින සිට අවුරුදු දෙකක් ඇතුළත ඉහත 2 (II) (ඉ) හා (ඊ) වැනි ඡේදයේ සඳහන් දෙපාර්තමේන්තු පරීක්ෂණවලින් සමත් විය යුතුය.

(iii) තෝරාගන්නා ලද අයදුම්කරු ඉහත සඳහන් වැටුප් ක්‍රමයෙහි රු. 7,320 ක වැටුප් පියවරට එළඹීමට පෙර ලන්ඩන්හි යාන්ත්‍රික ඉංජිනේරු ආයතනයේ ආශ්‍රිත සාමාජිකත්වය ලබාගතහොත් ඒ සාමාජිකත්වය ලබා ගත් දින සිට වර්ෂයකට රු. 7,320 ක වැටුපක් ලැබීමට සුදුසුවේ. ඔහු එම වැටුප් පියවර ලබා අවුරුදු දෙකක කාලය හෝ පරීක්ෂණ කාල සීමාව හෝ යන දෙකින් කලින් එළඹෙන කාලසීමාව ඇතුළත ඉහත 2 (II) (ඉ) හා (ඊ) වැනි ඡේදයේ සඳහන් දෙපාර්තමේන්තු පරීක්ෂණවලින් සමත්විය යුතුය.

**4. අවශ්‍ය සුදුසුකම්.**—සෑම අයදුම්කරුවකුම පහත සඳහන් කරුණු සනාථ කිරීමට සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුය :—

(ඒ) විශිෂ්ඨ චරිතයෙන් හා හොඳ ශාරීරික සත්පයෙන් යුක්ත බව,

(බී) 1969 පෙබරවාරි මස 7 වැනි දිනට වයස අවුරුදු 21 ට නො අඩුවූ ද, අවුරුදු 30 කට නොවැඩිවූ ද බව,

(සී) (i) ලංකා විශ්ව විද්‍යාලයයේ ඉංජිනේරු උපාධිය හෝ සමාන පිළිගත් උපාධියක් ලබා ඇති බව ; **නැතහොත්**

(ii) ලන්ඩන්හි යාන්ත්‍රික ඉංජිනේරු ආයතනයේ උපාධිධාරී සාමාජිකත්වය හෝ සමාන සුදුසුකමක් ලබා ඇති බව ; **නැතහොත්**

(iii) ලංකා විශ්ව විද්‍යාලයයේ විද්‍යා උපාධිය හෝ සමාන උපාධියක් ඇති බව.

**සටහන.**—ඉහත සඳහන් සුදුකම් ලබා ඇති දුම්රිය දෙපාර්තමේන්තුවේ සේවකයින්ගේ වයස අවුරුදු 30 ට වැඩි වුවද, ඉල්ලුම් පත්‍ර භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 35 ට නොවැඩි නම් ඔවුන්ට අයදුම් කළ හැකිය.

5. පහත සඳහන් ලියකියවිලි එකක් හෝ සියල්ලම අවශ්‍ය විටෙක ඉදිරිපත් කිරීමට සෑම අපේක්ෂකයකුම සූදානම් විය යුතුය :—

(ඒ) උප්පැන්න සහතිකය. (සැ. යු. අධ්‍යාපන රෙගුලාසි පරිදි උපකෘත පාසැලක ප්‍රයෝජනය සඳහා ඉදිරිපත් කරන ලද සහතික හෝ බවුතීස්ම සහතික භාරගනු නොලැබේ.)

(බී) උපාධි හෝ උසස්ම අධ්‍යාපනික සහතිකය.

(සී) චරිත සහතික දෙකක්—මින් එකක් අධ්‍යාපන අධ්‍යක්ෂ තැනගෙන් හෝ විද්‍යාලයීය ආචාර්යවරයාගෙන්. හෝ මහාචාර්යවරයාගෙන් විය යුතුය.

(ඩී) වෘත්තීය සහ/හෝ කාර්මික සුදුසුකම් පිළිබඳ සහතික.

(ඊ) සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලින් සමත් උසස්ම විභාග පිළිබඳ සහතික.

සැ. යු.—(i) අයදුම්පතට කිසිම ලියවිල්ලක් හෝ එහි පිටපතක් හෝ නොඇමිණිය යුතුය.

(ii) ඉල්වූ අවස්ථාවක ලියකියවිලි ඉදිරිපත් කිරීමට නොහැකිවන අපේක්ෂකයින්ගේ අයදුම්පත් සළකා බලනු නොලැබේ.

6. රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් විසින් තම තමන්ගේ ඉල්ලුම් පත්‍ර ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. එසේකුදු වුවත්, තම ඉල්ලුම් පත්‍ර එසේ එව්වේ කවදදැයි ඉල්ලුම් පත්‍ර භාරගන්නා අවසාන දින දී හෝ ඊට පෙර හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ට දැනගන්ට ලැබෙන සේ ඔහු වෙත කෙලින්ම ලියා එවිය යුතුය. ඉල්ලුම් පත්‍ර පෝරමය සමග තමන්ට එවන ලද ("බී" සළකුණ දරණ) මුද්‍රිත තැපැල් පත මේ සඳහා භාවිතා කළ හැකිය.

7. අයදුම්පත් හෝ ඒ සම්බන්ධ අනෙක් ලියකියවිලි සියල්ලක්ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් තැනට හැර මෙම දෙපාර්තමේන්තුවේ කිසියම් නිලධාරියෙකුගේ නමට පුද්ගලිකව නොඑවිය යුතුය.

8. මෙම ගැසට් පත්‍රයේ 1 වැනි කොටසේ (II) වැනි ඡේදයේ ආරම්භයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත්කිරීම් සම්බන්ධයෙන් අදාලවන පොදු කොන්දේසිවලට අවධානය යොමු කරනු ලැබේ.

9. අයදුම්කරුවන් විසින්, ඉල්ලුම් පත්‍ර පෝරමය සමග තම තමන්ට නිකුත් කරන ලද ("ඒ" සළකුණ දරණ) මුද්‍රිත තැපැල් පත, එහි සඳහන් කොට ඇති පරිදි සම්පූර්ණකොට ආපසු එවිය යුතුය. එවිට ඉල්ලුම් පත්‍ර පෝරමය මෙම කාර්යාලයට ලැබුණු බව ඔවුන්ට දන්වනු ලැබේ. මේ නියමය නොපිළිපදින අයදුම්කරුවන්ගේ ඉල්ලුම් පත්‍ර ලැබුණ බව ඔවුන්ට දන්වනු නොලැබේ. මේ නියමය පිළිපදින්නා වූ ද ඉල්ලුම් පත්‍ර භාරගන්නා අවසාන දිනයේ සිට සති තුනක් ඇතුළත, තම ඉල්ලුම් පත්‍රය ලැබුණ බවට දැන්වීමක් නොලැබෙන්නාවූ ද අයදුම්කරුවන් විසින් ඒ බව වහාම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ට දැනුම් දිය යුතුය. මේ විධානය ඉටු කිරීම පැහැර හැරියහොත් අයදුම්කරුවකු ගැන සළකා බලනු ලැබීම සම්බන්ධයෙන් ඔහුට ඇති අයිතිය අහිමි වේ.

බී. ආර්. එල්. බාලසූරිය,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1969 ජනවාරි මස 16 වැනි දින,
කොළඹ 1, ගාලු මුවදොර මහ ලේකම් ගොඩනැගිල්ලේ,
රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයයේ දී ය,
තැ. පෙ. 500.

1–978/4—69.1.24 දින අංක 14 838 දරන ගැසට් පත්‍රය

---

## අධිකාරිවරයෙකු සඳහා පුරප්පාඩුව—ආණ්ඩුවේ මුද්‍රණාලය

ආණ්ඩුවේ මුද්‍රණාලයේ අධිකාරි තනතුරක් සඳහා ඉල්ලුම් පත්‍ර කැඳවනු ලැබේ. මෙම කාර්යාලයෙන් සපයනු ලබන ආකෘති පත්‍රවල සම්පාදිත ඉල්ලුම් පත්‍ර 1969 පෙබරවාරි 22 වැනි දින දවල් 12 ට පෙර, කොළඹ, ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති වෙත ලැබෙන සේ එවිය යුතු ය. ඉල්ලුම්පත්‍රයේ හෝ ඊට සම්බන්ධිත වෙන යම් ලියකියවිලි හෝ ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු අතර, දෙපාර්තමේන්තුවේ වෙනත් නිලධාරියෙකුට පෞද්ගලිකව නො එවිය යුතු ය.

2. **වැටුප් පරිමාණය.**—වාර්ෂික වැටුප 4,080 න් පටන් ගෙන රු. 360 බැගින් වූ වාර්ෂික වැඩිවීම් 12 කින් වර්ෂයකට රු. 8,400 දක්වා වැඩී වනවා ඇත.

3. **වයස් සීමාව.**—අවුරුදු 22 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 35 ට නොවැඩි විය යුතු ය. මෙම වයස් සීමාවන් දෙපාර්තමේන්තු අයදුම්කරුවන් සඳහා අදාල නොවේ.

4. **අවශ්‍ය අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම්.**—

(i) පිළිගත් විශ්ව විද්‍යාලයක රසායන විද්‍යාව විෂයයක් වශයෙන් ඇති විද්‍යා උපාධිධරයකු විය යුතු ය. භෞතික විද්‍යාව පිළිබඳ දැනීම අතිරේක සුදුසු කමක් වනු ඇත.

(ii) දෙපාර්තමේන්තු අයදුම්කරුවන් සම්බන්ධයෙන් ඔවුනට—

(අ) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ උසස් විභාගයකින් හෝ සමත් සහතිකයක් සහ රජයේ මුද්‍රණාලයේ මුද්‍රණ වෘත්තියේ කිනම් කාර්මික අංශයෙක හෝ යටත් පිරිසෙයින් අවුරුදු 10 ක පළපුරුද්දක් තිබීම.

**හෝ**

(ආ) රජයේ මුද්‍රණාලයේ, මුද්‍රණ වෘත්තියෙහි කිනම් කාර්මික අංශයට හෝ යටත් පිරිසෙයින් අවුරුදු 15 ක පළපුරුද්දක් තිබීම.

(ඇ) ඉහත සඳහන් (අ) හෝ (ආ) අනුව ඉල්ලුම් පත් භාරගනු ලබනුයේ රජයේ මුද්‍රණාලයේ මුද්‍රණ වෘත්තියේ කාර්මික අංශවල තනතුරක් එවකට (ඉල්ලුම් පත් එවන අවධියේ) දරන නිලධාරීන්ගෙන් පමණකි.

(iii) ලන්ඩන් ස්කූල් ඔෆ් ප්‍රින්ටින් ඇන්ඩ් ග්‍රාෆික් ආට්ස් හෝ මැන්චෙස්ටර් කොලේජ් ඔෆ් ටෙක්නොලොජි හෝ සිටි ඇන්ඩ් ගිල්ඩ්ස් ඉන්ස්ටිටියුට් ඔෆ් ලන්ඩන් හෝ බ්‍රිටිෂ් ෆෙඩරේෂන් ඔෆ් මාස්ටර් ප්‍රින්ටර්ස් හෝ වැනි පිළිගත් විද්‍යාල හෝ මුද්‍රණ ආයතනවල හෝ ඩිප්ලෝමා සහතික ප්‍රදානයන් ආදිය තිබීම අතිරේක සුදුසුකමක් වනු ඇත.

5. **බඳවාගන්නා ආකාරය.**—බඳවාගැනීම මේ සඳහා පිහිටුවනු ලබන මණ්ඩලයක් විසින් සම්මුඛ පරීක්ෂණයක් පැවැත්වීමෙනි.

6. **බඳවාගැනීමේ කොන්දේසි.**—තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය.

7. **සේවා කොන්දේසි.**—

(i) තෝරාගත් අයදුම්කරු ආණ්ඩුවේ මුද්‍රණාලය ඇතුළත් ශාඛා කීපයකටම මාරු කරනු ලැබීමට හැකිවේ.

(ii) තෝරාගත් අයදුම්කරු තමා අයත් ශාඛාවේ අවශ්‍යතාවය අනුව දිවා කාලයෙහි හෝ රාත්‍රි කාලයෙහි හෝ වැඩ කිරීම අවශ්‍යවන අතර, ඔහු (සාර්ථක අයදුම්කරු) පාර්ලිමේන්තු ශාඛාවට (රාත්‍රි අධිකාරී වශයෙන්) පත් කරනු ලැබුව හොත් නිත්‍ය රාත්‍රි සේවයේ නියුක්ත විය යුතුවේ.

(iii) සාර්ථක වූ අයදුම්කරු පාර්ලිමේන්තු ශාඛාවට (රාත්‍රි වැඩ මුරයට) යොදවනු ලැබුව හොත් වැටුපෙන් (මූලික වැටුපෙන්) සියයට පහළොවක දීමනාවක් ගෙවනු ඇත.

(iv) පත්වීම අවුරුදු තුනක ප්‍රවාසන (සෝදිසි) කාලයක් යටතේ ය.

(v) ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත සේවයෙහි නියුක්ත නිලධාරියෙකු තෝරාගනු ලැබුව හොත්, ඔහු පළමුකොට වැඩ බැලීමට පත් කරනු ඇත.

8. ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II) වැනි ඡේදයේ ආරම්භයේ පළකෙරෙන රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත්කිරීම් සම්බන්ධයෙන් අදාල වන පොදු කොන්දේසිවලට ඔබේ සැලකිල්ල යොමු කරවමි.

9. තෝරාපත්කර ගනු ලැබූ අයහට දෙපාර්තමේන්තුවේ උපදෙස් හා අනුමැතිය පිට මුද්‍රණ ශිල්පය, ලේඛන කලාව සහ මුද්‍රණ පරිපාලනය පිළිබඳව මෙරට හෝ පිටරට පාඨමාලාවක් හැදෑරීමට අවශ්‍ය වුවහොත් නියම කෙරෙනු ඇත. මේ සම්බන්ධව විධිවිධාන එවැනි පාඨමාලාවක් හැදෑරීමට කටයුතු පිළියෙල කළ විටෙකදී දැනුම් දෙනු ඇත.

10. සියළුම ඉල්ලුම් පත්‍ර ලැබුන බව දන්වනු ලැබේ. ඉල්ලුම් පත්‍ර භාරගැනීමේ අවසාන දිනට පසු දින 7 ක් ඇතුළත ඉල්ලුම්පත්‍ර ලැබුන බවට හැඟවීමේ දැනුම්දීමක් නොලැබුන හොත් වහාම ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති වෙත ඒ බැව් දැන්විය යුතු ය. මෙකී ප්‍රකාර ක්‍රියා නොකළ හොත් සලකා බැලීම සඳහා තැබෙන අයිතිවාසිකම් වලට ඉල්ලුම් කරුවන් අහිමිවනු ඇත.

11. අයදුම්කරුවන් නියමිත ඉල්ලුම් පත්‍රයෙහි පුරවන ලද ඉල්ලුම් පත්‍ර ඉදිරිපත් කිරීමට ප්‍රථම මෙම දැන්වීමෙහි සඳහන් අවශ්‍යතාවන් ප්‍රවේසමෙන් කියවා බලා තමා සර්වප්‍රකාරයෙන්ම ඊට සුදුසුදැයි ප්‍රත්‍යක්ෂ කරගත යුතු බවට අවවාද කරමි. අයදුම්කරුවන් මෙම දැන්වීමෙහි ඇති කරුණු යථා පරිදි අවබෝධ කර ප්‍රස්තුත තොරතුරු ආකෘති පත්‍රයෙහි සපයා ඇති බවට නිසැක විය යුතුය.

12. ලියවිලි කිසිවක් ඉල්ලුම් පත්‍රය සමග ඉදිරිපත් නොකළ යුතුය. එසේ වුවද අවශ්‍යවූ විටෙක, අයදුම්කරුවන් පහත සඳහන් ලියකියවිලි වලින් කීපයක් හෝ සියල්ලම ඉදිරිපත් කළ යුතු වේ. (1) උප්පැන්න සහතිකය, (2) උපාධි හෝ වෙනත් අධ්‍යාපන සහතික, (3) චරිත සහතික දෙකක්—මින් එකක් අධ්‍යාපන ආයතනයේ අධ්‍යක්ෂ (ප්‍රධානියා) විද්‍යාලයාධිපති, ප්‍රධානාචාර්‍ය හෝ මහාචාර්‍ය යන අයෙකුගෙන්, (4) වෘත්තීය සහ/හෝ කාර්මික සුදුසුකම් පිළිබඳ සහතික, (5) සිංහල හා/හෝ දෙමළ පිළිබඳව ලබා ඇති උසස්ම සහතිකය.

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
වැඩබලන ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1969 ජනවාරි මස 19 වැනි දින,
කොළඹ 8,
ආණ්ඩුවේ මුද්‍රණාලයේදීය.

1–1045—69.1.24 දින අංක 14,838 දරන ගැසට් පත්‍රය

---

## කෘෂිකර්ම හා ආහාර අමාත්‍යාංශය

### පුස්තකාලයාධිපති තනතුර

ඉහත සඳහන් තනතුර සඳහා 1968.11.29 වැනි දින අංක 14,830 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළවූ දැන්වීම අවලංගු කරන ලද බව පොදු දැනගැනීම සඳහා මෙයින් නිවේදනය කරනු ලැබේ.

කෘෂිකර්ම හා ආහාර අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

1–834/1—69.1.24 දින අංක 14,838 දරන ගැසට් පත්‍රය.

---

## කෘෂිකර්ම හා ආහාර අමාත්‍යාංශය

### පුස්තකාලයාධිපති තනතුර

කෘෂිකර්ම හා ආහාර අමාත්‍යාංශයේ පුස්ථකාලයාධිපති තනතුරක් සඳහා ඉල්ලුම් පත් කැඳවනු ලැබේ.

පහත දැක්වෙන ආකෘති පත්‍රය අනුව, පිළියෙල වූ අයදුම්පත් 1969.2.10 දිනට හෝ ඊට පෙර කොළඹ 2, යූනියන් පෙදෙසේ, කෘෂිකර්ම හා ආහාර අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් තැන වෙත ලැබෙන සේ එවිය යුතුය.

2. **සේවය නියුක්ත කරවීමේ කොන්දේසි.**—මෙම තනතුර ස්ථිරය, විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතුය. පත්වීම සාමාන්‍ය වශයෙන් තුන් අවුරුදු ආධුනික කාලසීමාවකට යටත්වේ.

3. **අවශ්‍ය සුදුසුකම්.**—මෙම තනතුර සඳහා ඉල්ලුම්කරන සෑම අයදුම්කරුවෙක්ම පහත දැක්වෙන සුදුසුකම් ඇති බවට පිළිගත හැකි සාක්ෂි ඉදිරිපත් කළ යුතුය :—

(i) 1969.2.10 වන දිනට වයස අවුරුදු 21 ට නොඅඩු, අවුරුදු 35 ට නොවැඩි බව, (දැනට රජයේ සේවයේ නියුක්ත නිලධාරීන්ට උපරිම වයස් සීමාව බලපාන්නේ නැත.)

(ii) විශිෂ්ඨ චරිතයෙන් හා මනා සෞඛ්‍ය තත්ත්වයෙන් යුක්ත බව,

(iii) (අ) ගණිතය, ආර්ථික විද්‍යාව, භූගෝල විද්‍යාව, භෞතික විද්‍යාව, කෘෂිකර්මය හෝ ජීව විද්‍යාව යන විෂයයන් ගෙන් හතරකින් සහ ඉංග්‍රීසි භාෂාවෙන්ද, සම්මාන සාමාර්ථයන් සහිත ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍රය හෝ,

(ආ) අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයෙන් සිංහල/දෙමළ සහ ගණිතය/අංක ගණිතය යන විෂයයන්ගෙන් සහ තවත් විෂයයන් හතරකින් (ගණිතය, ආර්ථික විද්‍යාව, භූගෝල විද්‍යාව, උද්භිද විද්‍යාව, සත්ව විද්‍යාව, රසායන විද්‍යාව, භෞතික විද්‍යාව, කෘෂිකර්මය හෝ ජීව විද්‍යාව යන විෂයයන්ගෙන් හතරකින් සහ ඉංග්‍රීසි භාෂාවෙන්ද සම්මාන සාමාර්ථයන් සහිතව) දෙවරකට නොවැඩි වාර ගණනකදී සාමාර්ථය.

4. **සේවය පිළිබඳ කොන්දේසි.**—(අ) රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියේ පරමාර්ථයන් සඳහා රාජ්‍ය සේවයට නව ප්‍රවේශකයෙකු වන්නේ නම්—

(i) ඔහුගේ ආධුනික කාලය අවුරුදු තුනක් විය යුතුය.

(ii) ඔහු 1956 අංක 33 දරණ රාජ්‍ය භාෂා පනතේ විධිවිධාන වලටත්, රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවතින්නාවූත්, හෝ මතුවට පනවනු ලැබිය හැකි වූ හෝ යම් නීති රීතිවලට සහ ව්‍යවස්ථාවලටත් එකඟව කටයුතු කිරීමේ කොන්දේසිය පිළිගත යුතුය.

(iii) ඔහුගේ ආධුනික කාලය තුළදී රාජ්‍ය භාෂාව වන සිංහලෙන් වැඩ කිරීමට සෑහෙන දැනුමක් ලබා ගත යුතුය.

(iv) ආධුනික කාලය අවසානයේ පත්වීම ස්ථිර කිරීම, අතිකුත් කරුණු අතර පත්වීමේ දිනයේ සිට පිළිවෙළින්, අවුරුද්දක්, අවුරුදු දෙකක් සහ අවුරුදු තුනක් ඇතුළත I වැනි ශ්‍රේණියේ II වැනි ශ්‍රේණියේ සහ III ශ්‍රේණියේ පරීක්ෂණයන්ගෙන් (නැතහොත් අදාල වන අවස්ථාවල අවුරුද්දක් සහ අවුරුදු 2 ක් ඇතුළත I වැනි සහ II වැනි ශ්‍රේණියේ පරීක්ෂණයන්ගෙන්) සමත්වීම උඩ රඳා පවතී. නියමිත කාල සීමාවක් තුළදී නියමිත පරීක්ෂණයන්ගෙන් සමත් නොවුවහොත්, එය ඔහුගේ වැටුප් වැඩිවීම අත්හිටුවීමට හේතුවේ. නියමිත කාලයෙන් පසු තවත් සමසක් ගතවන්නට පෙර පරීක්ෂණයෙන් සමත් නොවුවහොත්, වැටුප් වැඩිවීම අත්හිටුවීම, වැටුප් වැඩිවීම නතර කිරීමට පරිවර්තනය කර, පරීක්ෂණය සමත් වනතෙක් හෝ මෙහි පහත (v) වැනි අංකය යටතේ ඇති විධි විධාන අදාල වන කාලය වන තෙක් හෝ ඒවා නතර කිරීම ක්‍රියාත්මක වනු ඇත.

(v) ආධුනික කාලය අවසාන වන විට, නියමිත සිංහල ප්‍රවීණතා තත්ත්වය ලබා නොගතහොත්, අංක 120 සහ 121 යන පරිපාලන රෙගුලාසිවල විධි විධාන අදාල වනු ඇත.

(ඉහත සඳහන් (iii) (iv) (v) යන කොන්දේසි සිංහල මාධ්‍යයෙන් සේවයට බඳවා ගනු ලැබූවන්ට අදාල නොවේ.

(vi) කෘෂිකර්ම හා ආහාර අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්තුමා විසින් නියම කරන ආකාරයකින් ඇපයක් තැබිය යුතුය.

5. වැටුප් ක්‍රමය.—මෙම තනතුරට අයත් වැටුප් ක්‍රමය වර්ෂයකට රු. 960—72×24—රු. 2,688 වේ. රු. 1,608 ට සහ රු. 2,184 යන වාර්ෂික වැටුප් පියවරවලට පෙර කාර්යක්ෂමතා කඩඉම් ඇත.

6. සෑම අයදුම්කරුවෙකු විසින් තම ඉල්ලුම්පත්‍රයට පහත සඳහන් සහතික පත්‍රවල පිටපත් (මුල් පිටපත් නොවේ) අමුණා එවිය යුතුය :—

(අ) උප්පැන්න සහතිකය.

(ආ) ඉල්ලුම්කරු ලබා ඇති උසස්ම අධ්‍යාපන සුදුසුකම් පිළිබඳ සහතික පත්‍ර.

(ඇ) මෙම තනතුර සඳහා ඉල්ලුම්කරුගේ චරිතය පිළිබඳ මෑතදී ලබාගත් සහතික 2 ක් (දැනට රජයේ සේවයේ යෙදී සිටින ඉල්ලුම්කරුවන් මෙම උපඡේදය යටතේ සහතික ඉදිරිපත් කිරීම අවශ්‍ය නොවේ.)

7. දෙපාර්තමේන්තු ප්‍රධානීන් මාර්ගයෙන් ඉදිරිපත් කොට නියමිත දිනට පසුව මෙම කාර්යාලයට ලැබෙන කිසිම ඉල්ලුම්පත්‍රයක් එම දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත නියමිත දිනට කලින් ලැබී එහි ප්‍රමාදවීනම් ඊට හේතුව වශයෙන් පිළිගත හැකි කරුණු දක්වා එය භාරගන්නා ලෙස එම දෙපාර්තමේන්තු ප්‍රධානීන් නිර්දේශ කළොත් මිස භාරගනු නොලැබේ.

8. මෙම තනතුර සඳහා එවන ඉල්ලුම්පත්‍රද ඒ සම්බන්ධ එවන ලියුම් ආදියද එවිය යුත්තේ කෘෂිකර්ම හා ආහාර අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් වෙත මිස, මෙම අමාත්‍යාංශයේ කිසිම නිලධාරියෙකුගේ පෞද්ගලික නමට නොවේ.

————————,
කෘෂිකර්ම හා ආහාර අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

1969.1.12 වෙනි දින,
කොළඹ 2, යූනියන් පෙදෙසේ,
කෘෂිකර්ම හා ආහාර අමාත්‍යාංශයේ දී ය.

## කෘෂිකර්ම හා ආහාර අමාත්‍යාංශයේ පුස්තකාලයාධිපති තනතුර පිළිබඳ ආකෘති පත්‍රය

1. සම්පූර්ණ නම :————.
(පැහැදිලි අකුරෙන්)
2. ලිපිනය :————.
3. උපන් දිනය හා ස්ථානය :————.
4. 1969 පෙබරවාරි 10 වැනි දිනට නියම වයස :—
අවුරුදු :——, මාස :——, දින :——.
5. ජාතිය :————.
6. ලබාගත් දිනත් සමග අධ්‍යාපන සුදුසුකම් :————.
(ලබා තිබෙන උසස්ම අධ්‍යාපන සහතිකවල පිටපත් ඇමිණිය යුතුය)
7. වෘත්තීය සුදුසුකම් :————.
8. ඉගෙනීම ලැබූ පාඨශාලා හා විද්‍යාල :————.
(ඇතුළත් වූ දින හා අස් වූ දින සඳහන් කරන්න)
9. පුස්තකාල වැඩ පිළිබඳ පළපුරුද්ද :————.
10. චරිත සහතික ලබාගත් අයගේ (ඥාතීන් නොවේ) නම් සහ ලිපිනය :————.
11. වෙනත් සුදුසුකම් :————.

මා විසින් මෙම ඉල්ලුම් පත්‍රයෙහි සඳහන් කරන්නට යෙදුන විස්තර සත්‍ය හා නිවැරදි බවට මම මෙයින් සහතික කරමි. මෙම ඉල්ලුම් පත්‍රයෙහි යම් කිසි අසත්‍යයක් හෝ වැරදි දෙයක් සඳහන් කර තිබෙන බව තෝරා ගැනීමට ප්‍රථම අනාවරණය වුවහොත්, මා නුසුදුසු බවට පැමිණෙනවා පමණක් නොව, තෝරා පත් කිරීමෙන් පසු මේ බව දැනගන්නට ලැබුනොත් කිසිම වන්දි ගෙවීමක් නොමැතිව මා රජ කාරියෙන් පහ කරනු ලැබීමට යටත් බවද මම දනිමි.

————————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

1–834/2—69.1.24 දින අංක 14 838 දරන ගැසට් පත්‍රය

අංකය : විආ/5/158

## අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශය

### චෙකෝස්ලෝවැකියාවේ විශ්ලේෂක රසායන විද්‍යාව පිළිබඳ පශ්චාත්-උපාධි පුහුණු පාඨමාලාව—1969-70

විශ්ලේෂක රසායන විද්‍යාව පිළිබඳව පශ්චාත් උපාධි පුහුණුව සඳහා යුනෙස්කෝ සංවිධානයේ මෙහෙයීමෙන් ප්‍රේග් නගරයේ චාර්ල්ස් විශ්ව විද්‍යාලයය මගින් ප්‍රදානය කරනු ලබන අධිශිෂ්‍යත්ව සඳහා ඉල්ලුම්පත්‍ර කැඳවනු ලැබේ. මෙම පාඨමාලාවේ කාර්යය හා අරමුණ වන්නේ—

(අ) විශ්ලේෂක රසායන විද්‍යාව, භෞතික රසායන විද්‍යාව සහ විශ්ලේෂණය පිළිබඳ භෞතික රසායනික ක්‍රම සම්බන්ධයෙන් සෛද්ධාන්තික හා විශේෂයෙන් ම ප්‍රායෝගික පුහුණුවක් ලබාදීම ;

(ආ) විද්‍යුත් විශ්ලේෂණය සහ විද්‍යුත් රසායනික විශ්ලේෂණ ක්‍රම, වර්ණ විද්‍යානුකූල දෘෂ්ටි ක්‍රම ආදියෙහි අත්හදා බැලීමේ පර්යේෂණ කාර්යයන් ද සුදුසුකම් සහිතව පුද්ගලික වශයෙන් සහභාගින් වය ;

(ඉ) විශේෂ සාකච්ඡා සම්මේලන වාරවලදී, රසායන විද්‍යාව ඉගැන්වීමේ නව ක්‍රම පිළිබඳව දේශන, ප්‍රදර්ශන හා සාකච්ඡා සංවිධානය කිරීම ;

(ඊ) විශ්ව විද්‍යාල අංශවල හා චෙකෝස්ලෝවැකියාවේ විද්‍යා ඇකඩමියේ ආයතනවල පර්යේෂණ කටයුතු සංවිධානය පිළිබඳව ද, රසායනික පර්යේෂණ සඳහා තරුණ විද්‍යාඥයින්ට පශ්චාත්-උපාධි පුහුණුවක් ලබාදීම පිළිබඳව ද, සහභාගී වන්නට දැනුම ලබාදීම.

පාඨමාලාවේ සම්පූර්ණ කාල පරිච්ඡේදය තුළ සියලුම ක්‍රියාකාරීත්වයන්ට නොකඩවා සහභාගි වී සිය කාර්යයන්හි සාර්ථකත්වයක් දක්වන අයට පැමිණීම පිළිබඳ සහතිකයක් ලැබෙනු ඇත.

ශිෂ්‍යත්වය සම්පූර්ණ කිරීමෙන් පසු ආපසු පැමිණ මෙරට ජීවයට සැලකිය යුතු සේවයක් ඉටු කරනු ඇතැයි බලාපොරොත්තු විය හැකි මනා බුද්ධිමතුන් සඳහා මේ ශිෂ්‍යත්ව අදහස් කෙරේ.

සංලක්ෂ්‍යය 1 : රජයේ සේවකයන්ගෙන් අයදුම් පත් භාරගනු ලබන්නේ, ශිෂ්‍යත්වයෙන් ලැබෙන පුහුණුව දෙපාර්තමේන්තුවේ යම්කිසි ව්‍යාපාරයක් සම්බන්ධයෙන් අවශ්‍ය බවට ඔහුගේ/ඇගේ දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් අංක 514 හා 1960.5.16 වැනි දින දරණ භාණ්ඩාගාර චක්‍ර ලේඛය අනුව සහතික කරන්නේ නම් පමණය. එසේ කිරීමේදී, එම චක්‍ර ලේඛය යටතේ අවශ්‍ය විස්තර ද දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් අයදුම්පත සමග ඉදිරිපත් කළ යුතු ය.

සංලක්ෂ්‍යය 2 : මණ්ඩල, සංයුක්ත මණ්ඩල, විශ්ව විද්‍යාල හා රජයේ ආධාර හෝ අනුග්‍රහ ලබන වෙනත් එවැනි ආයතනවල සේවකයින්ගේ අයදුම්පත්, ඒ ඒ ආයතනවල ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතුයි. එවැනි අයදුම්පත් ඉදිරිපත් කිරීමේදී, අයදුම් පතේ 27 වැනි කොටුවේ සහතිකය ආයතන ප්‍රධානීන් ලවා යථා පරිදි සම්පූර්ණ කරවා එවිය යුතු ය.

2. ශිෂ්‍යත්ව කාලය.—ශිෂ්‍යත්ව කාලය සාමාන්‍යයෙන් මාස දහයකි. 1969 ඔක්තෝබර් මස ආරම්භ වේ.

එහෙත්, අයථා හැසිරීම, අක්‍රමවත් පැමිණීම, බලධාරීන්ගේ අවසරය රහිතව විද්‍යාලයට හෝ ශිෂ්‍ය නිවාසයට නොපැමිණ සිටීම, ඉගෙනීමේ දියුණුවක් නොදක්වීම හෝ විභාගවලින් සමත් විය නොහැකි වීම නිසා හෝ සංවිධායක බලධාරීන්ගේ අභිමතය පරිදි ශිෂ්‍යත්ව කාලය තුළ ඕනෑම අවස්ථාවක ශිෂ්‍යත්වය අවසන් කරනු ලැබීමට පුළුවන. එවැනි අවස්ථාවකදී ශිෂ්‍යත්වධාරියාට තමාගේම වියදමින් ලංකාවට ආපසු පැමිණීමට නියෝග කිරීමට ඉඩ ඇත්තේ ය.

3. සුදුසුකම්.—අයදුම්කරුවන් විසින් පහත සඳහන් සුදුසුකම් ලබා සිටිය යුතුයි :—

(i) ලංකාවේ පුරවැසියන් විය යුතුයි ;
(ii) 1969.10.1 වැනි දිනට, වයස අවුරුදු 45ට අඩු විය යුතුයි ;
(iii) පිළිගත් විශ්ව විද්‍යාලයක රසායන විද්‍යාව පිළිබඳ යටත් පිරිසෙයින් ඇම්.ඇස්.සී. උපාධියක් හෝ ඊට සමාන උපාධියක් ලබා තිබීම ;
(iv) රස විද්‍යා පර්යේෂණාත්මක ප්‍රායෝගික වැඩ පිළිබඳව හෝ විශ්ව විද්‍යාලයයක හෝ වෙනත් විද්‍යාආයතනයක හෝ ඉගැන්වීම පිළිබඳව අවුරුද්දක පළපුරුද්දක් ලබා තිබීම.
(v) (කථාව හා ලිවීම සම්බන්ධයෙන්) ඉංග්‍රීසි පිළිබඳ උසස් ප්‍රවීණතාවක් ලබා තිබීම.

සංලක්ෂ්‍යය 1 : රජය යටතේ හෝ මණ්ඩලයක, සංයුක්ත මණ්ඩලයක, විශ්ව විද්‍යාලයක හෝ රජයෙන් ආධාර හෝ අනුග්‍රහ ලබන වෙනත් එවැනි ආයතනයක නියමිත කාලයක් සේවය කිරීමට බැඳුම්කරයකින් හෝ ගිවිසුමකින් හෝ බැඳී සිටින අපේක්ෂකයන්, ඒ කාල සීමාවේ සේවය සම්පූර්ණකොට 69.10.1 දින වන විට බැඳුම්කරයෙන් හෝ ගිවිසුමෙන් සම්පූර්ණ වශයෙන් නිදහස් වී ඇත්නම් මිස, මේ ශිෂ්‍යත්ව සඳහා අයදුම් කිරීමට සුදුසු නොවන්නේය.

4. ප්‍රදානයට අයත් ප්‍රතිලාභයන්.—ශිෂ්‍යත්ව ප්‍රදානයට පහත සඳහන් ප්‍රතිලාභයන් ඇතුළත් ය :—

(අ) ලංකාවේ සිට ප්‍රේග් නුවරට යාම ඊම සඳහා සංචාරක පංක්තියේ ගුවන් ගමන් පහසුව ;

(ආ) පාඨමාලාව පැවැත්වෙන කාල පරිච්ඡේදය තුළදී මසකට චෙකෝස්ලෝවැකියානු ක්‍රවුන් 1,600 බැගින් වූ දීමනාවක් ගෙවීම ;

(ඉ) ශිෂ්‍ය නිවාසයක නොමිළයේ නවාතැන් සැපයීම ;

(ඊ) නොමිළයේ වෛද්‍ය පහසුකම් සැපයීම (සහභාගි වන්නන්ගේ පවුල් සඳහා නවාතැන් හෝ අතිරේක මුදල් ආධාර සපයනු නොලැබේ).

**සංලක්ෂ්‍යය :** මේ ශිෂ්‍යත්ව සඳහා තෝරාගනු ලබන රජයේ සේවක යන්ට නිවාඩු දීම, අවස්ථාවට වලංගුව පවත්නා භාණ්ඩාගාර හා දෙපාර්තමේන්තු නීති රීතින්ට යටත් වන්නේ ය.

5. **සම්මුඛ පරීක්ෂණය :** සුදුසුකම් ලත් අයදුම්කරුවන්, නියමිත ස්ථානයක හා නියමිත වේලාවක කොළඹදී පැවැත්වෙන සම්මුඛ පරීක්ෂණයකට පෙනී සිටිය යුතුය. මෙම සම්මුඛ පරීක්ෂණය සම්බන්ධ යෙන් ගමන් හෝ වෙනත් වියදම් පිළිබඳ ගාස්තුවක් නොගෙවනු ලැබේ. සම්මුඛ පරීක්ෂණය සඳහා පැමිණෙන විට තමන්ගේ අධ්‍යා පනික සහතික, උප්පැන්න සහතිකය හා සුදුසුකම් පිළිබඳ වෙනත් ලියවිලිවල මුල් පිටපත් රැගෙන ඒමට සූදානම් වී සිටිය යුතු ය.

6. **ගිවිසුම.**—තෝරාගනු ලබන අපේක්ෂකයන් චෙකෝස්ලෝවැකියාව බලා පිටත්ව යාමට පෙර—

(අ) අනෙකුත් කරුණු අතර, නියමිත අධ්‍යයන පාඨමාලාව අවංකව හා අනලස්ව හදාරා සතුටුදායක ලෙස එය සම්පූර්ණ කිරීමට හා ශිෂ්‍යත්වය සම්පූර්ණ කිරීමෙන් පසු අවශ්‍ය වුවහොත්, රජය විසින් නියම කරනු ලබන යම්කිසි කාලසීමාවක් තුළ රජය යටතේ සේවය කිරීමට ද,

(ආ) තමාගේ ගිවිසුමේ සඳහන් කොන්දේසි හා නියමයන්ට අනුකූලව ක්‍රියා කිරීමට නොහැකි වන අවස්ථාවකදී, ශිෂ්‍යත් වයේ සම්පූර්ණ වටිනාකම (එනම්, සම්පූර්ණ ශිෂ්‍යත්වය සම්බන්ධයෙන් ලංකා රජයට හා ප්‍රදාන අධිකාරීන්ට දරන්නට සිදුවූ සියලුම වියදම් හා රජයේ සේවකයෙක් නම්, ඊට අමතරව වේතනය, දීමනා ආදිය ඇතුළු වියදම්) ලංකා රජයට ආපසු ගෙවීමට ද,

පොරොන්දු වන ගිවිසුමකට අත්සන් කළ යුතු ය.

7. **වෛද්‍ය පරීක්ෂණය.**—තෝරාගනු ලබන අපේක්ෂකයන් චෙකෝස් ලෝවැකියාවේ අධ්‍යයන පාඨමාලාවක් අනුගමනය කිරීමට සුදුසු ශාරීරික හා මානසික යෝග්‍යතාවක් ඇති බවට රජය විසින් පත් කරනු ලබන විශේෂ වෛද්‍ය මණ්ඩලයක් මගින් පැවැත්වෙන වෛද්‍ය පරීක්ෂණයකින් සමත් විය යුතුයි.

8. රජයේ සේවකයන් සම්බන්ධයෙන්, බලාපොරොත්තු වන පුහුණුව, ඔවුන් විසින් දැනට දරන තනතුරෙහි වැඩි වේතනයක් හෝ උසස් වීමක් ලැබීමට සුදුසුකමක් නොවන්නේ ය. සෙසු අය සම්බන්ධයෙන් ශිෂ්‍යත්වය සම්පූර්ණ කොට ආපසු පැමිණීමෙන් පසු රක්ෂා ලබාදීමට රජය පොරොන්දු නොවන්නේ ය.

9. මෙම ඉල්ලුම්පත්‍රයෙහි යම්කිසි වැරැදි ප්‍රකාශයක් කර ඇති බව තෝරා ගැනීමට කලින් අනාවරණය වුවහොත් අයදුම්කරු එයින් නුසුදුසු බවට පත්වේ. තෝරා ගැනීමෙන් පසුව ඒ බව අනාවරණය වුවහොත් ප්‍රදානය අවලංගු කරනු ලැබේ.

10. තෝරාගනු ලැබූ අපේක්ෂකයෙකු තෝරා ගැනීමෙන් පසු නාම යෝජනා කරනු ලැබීම හෝ නාමයෝජනා කිරීමෙන් පසු ප්‍රදානයක් පිළිගැනීම හෝ ප්‍රතික්ෂේප කළහොත්, අවුරුදු දෙකක කාල පරිච්ඡේදයක් ගතවන තුරු, අන් කවර ශිෂ්‍යත්ව ප්‍රදානයක් සඳහා හෝ ඔහු සලකා බලනු නොලැබේ.

11. කිසියම් අපේක්ෂකයකු ලංකා අධිකාරීන් විසින් නාමයෝජනා කරනු ලැබීම, ශිෂ්‍යත්ව ප්‍රදානයක් සඳහා තමා පිළිගනු ලැබීමක් ලෙස නොසිතිය යුතු බව පැහැදිලිව අවබෝධ කටයුතු ය. ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම, සම්පූර්ණයෙන්ම, නාමයෝජනා ඉදිරිපත් කරනු ලබන ප්‍රදාන අධිකාරීන්ගේ අභිමතය පරිදිම සිදුවන්නක් හෙයිනි.

12. යම් අපේක්ෂකයකු තෝරා ගැනීම සම්බන්ධයෙන් කවර අන්දමකින් හෝ අයථා අනුග්‍රහයක් ලබා ගැනීමට හෝ බලපැවැත් වීමකට හෝ උත්සාහයක් දරනු ලැබුවහොත්, ඒ හේතුවෙන්ම එම අපේක්ෂකයා නුසුදුසු බවට පත් වන්නේ ය.

13. මේ නිවේදනයේ හා අයදුම්පත් ආකෘතියේ සඳහන් අවශ්‍ය තාවන් සියල්ල සෑම ආකාරයෙන්ම සම්පූර්ණ නොකෙරෙන අයදුම් පත් ප්‍රතික්ෂේප කරනු ලබන්නේ ය.

14. මේ කාර්යාලයෙන් ලබාගත යුතු විශේෂ ආකෘතියක පිළියෙල කළ යුතු අයදුම්පත්, 1969.2.8 වැනි දින හෝ ඉන් පෙර ලැබෙන සේ, කොළඹ 2, මැලේ වීදියේ, අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් වෙත එවිය යුතු ය. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

15. සෑම අයදුම්පතක් සම්බන්ධයෙන්ම රුපියල් 10ක මුද්දර ගාස්තුවක් ගෙවිය යුතු වන්නේ ය. අයදුම්පත් ආකෘතියේ මුල් පිටුවේ ඒ සඳහා වෙන්කොට ඇති කොටුවේ රුපියල් 10 ක මුද්දර අලවා ඒ මත අයදුම්කරුගේ අත්සන යෙදීමෙන් අවලංගු කළ යුතුය. කවර හේතුවක් නිසාවත් මුද්දර ගාස්තුව ආපසු ගෙවනු නොලැබේ.

16. රජයේ සේවකයින් විසින් එවන අයදුම්පත් සිය දෙපාර්ත මේන්තු ප්‍රධානීන් මගින් ද, මණ්ඩල, සංයුක්ත මණ්ඩල, විශ්ව විද්‍යාල හා රජයේ ආධාර හෝ අනුග්‍රහ ලබන වෙනත් එවැනි ආයතනවල සේවකයින් විසින් එවන අයදුම්පත් ඒ ඒ ආයතන ප්‍රධානීන් මගින් ද එවිය යුතු යි. සේවයෙන් ඉල්ලා අස්වීමට සූදානම් වුවද මේ අවශ්‍යතාව සපුරාලිය යුතුය.

17. සියළුම අයදුම්පත් ලැබුණු බව දන්වනු ලැබේ. අයදුම්පත් භාරගනු ලබන අවසාන දින සිට දින 7ක් ඇතුළත අයදුම්පත් ලැබුණු බවට දැන්වීමක් නොලදහොත්, ඒ බව අධ්‍යාපන හා සංස් කෘතික අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් වෙත වහාම දැනුම් දිය යුතුය. එසේ නොකිරීමේ හේතුවෙන් අයදුම්කරු ගැන සලකා බැලීමට ඇති අයිතිවාසිකම් ඔහුට අහිමි වන්නේ ය.

——————,
අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

1969 ජනවාරි මස 12 වැනිද,
කොළඹ 2, මැලේ වීදියේ,
අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ දිය.

1–887—69.1.24 දින අංක 14,838 දරන ගැසට් පත්‍රය

---

## ලංකා පිඟන් කර්මාන්ත සංයුක්ත මණ්ඩලය

### මාණ්ඩලික පුහුණුවන්නන් සඳහා වූ තනතුරු

ලංකා පිඟන් කර්මාන්ත සංස්ථාවෙහි මාණ්ඩලික පුහුණුවන්නාගේ තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

2. සෑම අයදුම්කරුවකු විසින්ම පහත සඳහන් කරුණු සනාථ කළ යුතුය :—

(අ) පාරම්පරිකව හෝ ලියාපදිංචිවීමෙන්, ලාංකික පුරවැසියෙක් බව

(ආ) මනා ශරීර සෞඛ්‍යයෙන් හා යහපත් චරිතයකින් යුතු බව

(ඇ) වයස, 1969 පෙබරවාරි මස 7 වන දිනදී අවුරුදු 20 ට නො අඩු හා අවුරුදු 30 ට නොවැඩි බව

(ඈ) යටත් පිරිසෙයින් පහත දැක්වෙන සුදුසුකම් ලබා ඇති බව :—

(1) පිළිගත් විශ්ව විද්‍යාලයක රසායන විද්‍යාව, භෞතික විද්‍යාව සහ ගණිතය සහිතව ලබාගත් විද්‍යාවේදී උපාධිය

3. **වේතන පරිමාණය.**—පුහුණුව ලබන කාලය තුළදී, මසකට සියළු දීමනා සහිතව රු. 450—5×රු. 30—රු. 600 දක්වා ගෙවේ. සතුටුදායක පරිදි පුහුණුව අවසන් කර සේවය ස්ථිර වන්නාවූ පුහුණුවන්නන් හට, මසකට සියළු දීමනා සහිතව රු. 880—2×40—5×50—රු. 1,250 දක්වාවූ වැටුප් ක්‍රමයක් හිමිවනු ඇත.

**සටහන.**—පසුගිය වරට පවත්වන ලද විද්‍යාවේදී උපාධි පරීක්ෂණය සඳහා පෙනී සිට විභාග ප්‍රතිඵල බලාපොරොත්තුව සිටින අපේක්ෂකයින් හටද මෙම තනතුරු සඳහා ඉල්ලුම්පත් ඉදිරිපත් කළහැක. එසි ප්‍රතිඵල නිකුත්වී සතියක් ඇතුළත සමත් හෝ අසමත් බව සංස්ථාවේ සභාපති වෙත දැනුම් දිය යුතුය.

4. තෝරාගනු ලබන අයදුම්කරුවන්, 1956 අංක 33 දරණ රාජ්‍ය භාෂා පනතේ විධිවිධානවලටත් රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවතින් නාවූත්, මතුවට පණවනු ලැබියහැකිවූත් නීතිරීති හා ව්‍යවස්ථාවලටත් එකඟව කටයුතු කිරීමේ කොන්දේසි පිළිගත යුතුය. පරීක්ෂණාත්මක නියමිත කාලසීමාවෙන් පසු, තනතුරේ ස්ථිරකිරීම බලපවත්වනුයේ අනෙක් අවශ්‍යතාවයන් ඇතුළුව රාජ්‍ය භාෂා අවශ්‍යතාවයනට අනුකූලතාවය දැක්වුවහොත් පමණි.

5. මෙම තනතුර සඳහා තෝරාගනු ලැබූවනට ලංකා පිඟන් කර්මාන්ත සංස්ථාව මගින් මූලික පුහුණුවක් ලබාදෙනු ඇත. මෙම කාලය තුළදී ඔවුන්ගේ කාර්යයන් හා පැවැත්ම සතුටුදායක වී නම්, සංස්ථාව මගින් තෝරාගනු ලබන පරිදි, පිඟන් කර්මාන්තය පිළිබඳ විදෙස් පුහුණුවක් ලබාදීම සඳහා පිටත් කරනු ඇත. එහිදී තමා පුහුණුව ලැබූ විෂයය යටතේ උපාධියක් ලැබිය යුතුය.

6. පුහුණුව ලබන කාලසීමාව තුළදී, යම්කිසිවකුගේ කාර්යයන් හෝ පැවැත්ම අසතුටුදායක වී නම්, හෝ පුහුණුවන්නන් සඳහා පිළි යෙලවී ඇති පාඨමාලාව හැදෑරීම පිළිනොගතහොත් දැනුම්දීමක් නොමැතිව ඔහුගේ සේවය අත්හිටවනු ලැබේ. මෙවැනි අවස්ථාවකදී පුහුණුව සඳහා සංස්ථාවෙන් හර කරන ලද සියළු වියදම් මෙසේ සේවය අත්හිටවනු ලැබූ අය විසින් සංස්ථාවට ගෙවිය යුතුය.

7. පුහුණුව ලැබීමට අවශ්‍ය දෑ සංස්ථාව විසින් පිළියෙල කරදෙනු ලැබේ. පුහුණුව ලබන කාලය තුළදී, පුහුණුව සඳහා තෝරාගත්තාවූනට කාලානුරූප නියමයන් අනුව අමතර දීමනාවක් ගෙවනු ලැබේ.

8. මෙම කරුණු අතරම, පුහුණුව ලබන අය, සංයුක්ත මණ්ඩලය සමඟ ගිවිසුමකට සහ පොරොන්දු පත්‍රයකට බැඳිය යුතු අතර, මෙම පුහුණුව ලබන්නා විසින් විශ්වාසවන්ත ලෙස හා උද්‍යෝගිමත්ව තමා වෙත පිරිනමා ඇති පාඨමාලාව හදාරා දිවයිනට පැමිණ සංස්ථාව විසින් නියම කරනු ලබන කාලය තුළ සේවය කරනු ලැබේය යන්න සනාථ කිරීම සඳහා පුහුණුවන්නා වෙනුවෙන් ඇපකරුවන් දෙදෙනෙකු පොරොන්දු පත්‍රවල සහතික කළයුතුය. මෙම ගිවිසුමේ සහ පොරොන්දු පත්‍රයේ සඳහන් නියමයන්ට අනුකූලව කටයුතු කිරීමට නොහැකිවුවහොත්, පුහුණුව ලැබීම සඳහා සංස්ථාවෙන් වැය වූ මුළු මුදල සංස්ථාවට හෝ පාඨමාලාව පිරිනැමූ ආයතනය වෙත ගෙවිය යුතුය.

9. සෑම අයදුම්කරුවකු විසින්ම පහත සඳහන් ලියවිලි අවශ්‍යවූ විටෙක ඉදිරිපත් කළ යුතුය :—

(අ) උප්පැන්න සහතිකය.

(ආ) උපාධියේ හෝ සමත්වූ උසස්ම විභාග සහතිකය.

(ඇ) වෘත්තීය හෝ කාර්මික සුදුසුකම් දක්වන සහතික.

(ඈ) චරිත සහතික දෙකක්.

10. රජයේ දෙපාර්තමේන්තු හෝ සංස්ථාවන්හි සේවය කරන්නා වූ නිලධාරීන්ගෙන් වූ අයදුම්පත්, එම අය තෝරාගනු ලැබී නම් සේවයෙන් මුදාහැරිය හැකිවන බවට දන්වමින්, තම දෙපාර්තමේන්තු හෝ ආයතන ප්‍රධානීන් මගින් එවිය යුතුය.

11. ඉල්ලුම්පත්, පහත දැක්වෙන ආදර්ශ අයදුම්පත පරිදි, නියමිත ආකෘති පත්‍රයෙහි පළවිය යුතු අතර, 1969 පෙබරවාරි මස 7 වන දින හෝ ඊට ප්‍රථම ලැබෙන සේ සාමාන්‍යාධිකාරී වෙත එවිය යුතුය.

සභාපති,
ලංකා පිඟන් කර්මාන්ත සංයුක්ත මණ්ඩලය.

නො. 55, රොස්මිඩ් පෙදෙස,
කොළඹ 7.

### ආදර්ශ ඉල්ලුම්පත්‍රය

..............................සඳහා වූ තනතුර

1. සම්පූර්ණ නම—(අ) වාසගම :————.
(ආ) වෙනත් නම් :————.
2. තැපැල් ලිපිනය :————.
3. උපන් ස්ථානය හා දිනය :————.
4. ජාතිය :————.
5. ඉගෙනුම ලැබූ පාඨශාලා, විද්‍යාල හා විශ්ව විද්‍යාලය (ඇතුළත්වූ හා අස්වූ දිනයන් සහිතව) :————.
6. වෘත්තීය හා ශාස්ත්‍රීය සුදුසුකම්, ගත් විෂයයන් හා සුදුසුකම් ලබාගත් දිනයන් සඳහන් කරන්න :————.
7. පාසැලින් අස්වූ දින සිට කරන ලද රැකියාවන් පිළිබඳ විස්තර (බැඳුණු දිනයන් හා අස්වූ දිනයන් සඳහන් කරන්න.) :————.
8. ලබා ඇති පුහුණුවීම් පිළිබඳ විස්තර දින සහිතව සඳහන් කරන්න :————.
9. ප්‍රායෝගික පළපුරුද්ද පිළිබඳ විස්තර, විශේෂයෙන් තමන්ගේ පළපුරුද්ද හා දැනීම පිළිබඳව විස්තර සඳහන් කරන්න :————.
10. ඔබ පිළිබඳ තොරතුරු ලබා ගත හැකි තිදෙනෙකුගේ නම්, ලිපිනය හා තනතුරු සඳහන් කරන්න :————.
(1)
(2)
(3)
11. සහතික පත්‍ර ලබා ගත් අයගේ නම් සහ තනතුරු සඳහන් කරන්න. (සහතිකපත්‍ර ඉදිරිපත් කළ යුත්තේ සම්මුඛ පරීක්ෂණයේදීය) :————.
12. වෙනත් කරුණු :————.

මෙම අයදුම්පතෙහි මවිසින් ප්‍රකාශ කරන ලද කරුණු නිවැරදි හා සත්‍ය බවට මෙයින් ප්‍රකාර කරමි. මෙහි ඇති කරුණු වැරදි හෝ අසත්‍ය බව තෝරා ගන්නට පෙර අනාවරණය වුවහොත් මා නුසුදුස්සකු වෙනවා පමණක් නොව, පත්වීමෙන් පසුව අනාවරණය වුවහොත් කිසිම වන්දියක් රහිතව සේවයෙන් පහකිරීමට සිදුවන බවද මම හොඳහැටි දනිමි.

(කිසිම පත්වීමකින් මා අස්කර නොමැති බවත්, උසාවියකින් වැරදි කරුවකු වී දඩුවම් ලබා නොමැති බවත් මෙයින් දන්වමි.)

————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

1–983—69.1.24 දින අංක 14,838 දරන ගැසට් පත්‍රය

---

## ලංකා පිඟන් කර්මාන්ත සංයුක්ත මණ්ඩලය

### අත්හදා බැලීමේ නිලධාරි තනතුර

ලංකා පිඟන් කර්මාන්ත සංස්ථාවේ අත්හදා බැලීමේ නිලධාරි තනතුරක් සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

2. (අ) පාරම්පරිකව හෝ ලියාපදිංචිවීමෙන් ලාංකික පුරවැසියෙක් බව
(ආ) මනා ශරීර සෞඛ්‍යයෙන් හා යහපත් චරිත්‍රයකින් යුතු බව
(ඇ) 1969 පෙබරවාරි මස 7 වන දිනට අවුරුදු 22 ට නොඅඩු හා අවුරුදු 30 ට නොවැඩි බව
(ඈ) යටත්පිරිසෙයින්, පහත සඳහන් අධ්‍යාපන සුදුසුකම් ලබා ඇති බව :—

1. රසායන විද්‍යාව විෂයයක් සහිතව හා තාත්වික රසායන විද්‍යාව (සිලිකේට් රසායන විද්‍යාව නම් මැනැවි.) පිළිබඳ වර්ෂ 3 ක රසායනාගාර පළපුරුද් දක් හා පිළිගත හැකි රසායනාගාරයක තත්වය පාලනය කිරීම පිළිබඳ දැනීම.

විද්‍යාව පිළිබඳ මධ්‍යම හෝ ප්‍රථම පරීක්ෂණය හෝ අධ්‍යයන පො. ස. (උසස් මාධ්‍යය) සහ තාත්වික රසායන විද්‍යාව (සිලිකේට් රසායන විද්‍යාව නම් මැනවි) පිළිබඳ වර්ෂ 5 ක රසායනාගාර පළපුරුද්දක් සහ පිළිගත හැකි රසායනාගාරයක තත්ත්වය පාලන කිරීම පිළිබඳව දැනීම.

ප්‍රථම පළපුරුද්දක් නොමැති අයදුම්කරුවන් පුහුණුවන්නන් යටතේ බඳවාගනු ඇත.

3. වැටුප් පරිමාණය.—මසකට සියළු දීමනා ඇතුළුව රු. 600—7×45—රු. 915 දක්වා වේ.

4. තෝරාගනු ලබන අයදුම්කරු 1956 අංක 33 දරණ රාජ්‍ය භාෂා පනතේ විධිවිධානවලටත් රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවතින්නාවූත්, මතුවට පණවනු ලැබිය හැකිවූත් නීතිරීති හා ව්‍යවස්ථාවලටත් එකඟව කටයුතු කිරීමේ කොන්දේසි පිළිගත යුතුය. පරීක්ෂණාත්මක නියමිත කාලසීමාවෙන් පසු තනතුරේ ස්ථිර කිරීම බලපවත්වනුයේ අනෙක් කරුණුත් සමඟ රාජ්‍ය භාෂා අවශ්‍යතාවයනට අනුකූලතාවය දැක්වුවහොත් පමණි.

5. සෑම අයදුම්කරුවකු විසින්ම පහත සඳහන් ලියවිලි අවශ්‍ය විටෙක ඉදිරිපත් කළයුතුය :—

(අ) උප්පැන්න සහතිකය.

(ආ) උපාධියේ හෝ සමත්වූ උසස්ම විභාග සහතිකය.

(ඇ) වෘත්තීය හෝ කාර්මික සුදුසුකම් දක්වන සහතික.

(ඈ) චරිත සහතික දෙකක්.

6. රජයේ දෙපාර්තමේන්තු හෝ සංස්ථාවන්හි සේවය කරන්නාවූ නිලධාරීන්ගෙන්වූ අයදුම්පත්, එම අය තෝරාගනු ලැබී නම් සේවයෙන් මුදාහැරිය හැකිවන බවට දන්වමින්, තම දෙපාර්තමේන්තු හෝ ආයතන ප්‍රධානීන් මගින් එවිය යුතුය.

7. ඉල්ලුම්පත් නියමිත ආකෘති පත්‍රයෙහි පළවිය යුතුය. මෙම ගැසට් පතෙහි මාණ්ඩලික පුහුණුවන්නන් සඳහා වූ තනතුරු යටතේ වූ දැන්වීමත් සමඟම එහි ආදර්ශ අයදුම්පතක් සඳහන්ව ඇත. අයදුම්පත් 1969 පෙබරවාරි මස 7 වන දින හෝ ඊට ප්‍රථම සාමාන්‍යාධිකාරීතුමා වෙත ලැබිය යුතුය.

සභාපති.
ලංකා පිඟන් කර්මාන්ත සංයුක්ත මණ්ඩලය,

නො. 55, රොස්මිඩ් පෙදෙස,
කොළඹ 7.

1–983/2—69.1.24 දින අංක 14,838 දරන ගැසට් පත්‍රය

---

## කොළඹ දිස්ත්‍රික්කයේ කෝස්ගම කොට්ඨාශයේ උප්පැන්න හා මරණ සහ හේවාගම් කෝරළේ කොට්ඨාශයේ විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය

කෝස්ගම උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාශය තුළ ස්ථිර පදිංචියක් ඇත්තාවූ හෝ එහි කාලයක් පදිංචිව සිටීම හේතුකොටගෙන ගම්වාසීන්ගෙන් සැලකුම් ලබන, ඉල්ලුම් පත්‍ර භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු විසිපහට නොඅඩු ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයෙන්ම ඉහත සඳහන් ධුරය සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ. රජයේ සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා මෙම වයස් සීමාව අදාල නොවේ.

2. මෙම ධුරය සඳහා ඉදිරිපත්වන අයට තිබිය යුතු අධ්‍යාපනික හා අනිකුත් සුදුසුකම් ආදිය පිළිබඳ සියළු විස්තර මෙම කාර්යාලයේ සහ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කාර්යාල, ග්‍රාමසේවක කාර්යාල පළාත්පාලන ආයතන කාර්යාල, ග්‍රාමීය උසාවි. තැපැල් කාර්යාල, පොලිස් ස්ථාන, ප්‍රජාමණ්ඩල, ප්‍රසිද්ධ වෙළඳ පොළවල් සහ සමූපකාර සමිති ආදී කොට්ඨාශයේ ප්‍රසිද්ධ ස්ථාන සහ කාර්යාලවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වල ඇතුළත් වේ.

3. සියළුම ඉල්ලුම්පත් මෙම කාර්යාලයෙන් ලබාගතහැකි ආකෘතිපත්‍රවල සකස්විය යුතු අතර, ඒවා 1969 පෙබරවාරි 15 වැනි දින හෝ එදිනට ප්‍රථම මා වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

රිචඩ් ගුණසේකර,
දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් වෙනුවට.

1969 ජනවාරි මස 12 වැනි දින,
කොළඹ, දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේදීය.

1–810—69.1.24 දින අංක 14,838 දරන ගැසට් පත්‍රය

## සිවිල් ගුවන් සේවා දෙපාර්තමේන්තුව

### 1 වන පන්තියේ යාන්ත්‍රික (වායු සමීකරණ) තනතුර

සිවිල් ගුවන් සේවා දෙපාර්තමේන්තුවේ 1 වන පන්තියේ යාන්ත්‍රික (වායු සමීකරණ) තනතුර සඳහා අයදුම් පත් මෙයින් කැඳවනු ලැබේ. පහත දැක්වෙන ආදර්ශ ආකෘති පත්‍රය අනුව සම්පූර්ණ කරන ලද අයදුම් පත් 1969.2.7 වෙනිදාට හෝ එදිනට පෙර සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ, තැ. පෙ. 535, කොළඹ 1. යන ලිපිනයට ලැබෙනසේ එවිය යුතුය.

2. **වැටුප් ක්‍රමය.**—පළමු හය මස තුළ දිනකට රු. 3.86 බැගින් සහ ඊට පසු වර්ෂයකට රු. 1,170 කින් පටන්ගෙන රු. 42 බැගින් වන වාර්ෂික වර්ධකයන් 12 කින් රු. 1,674 දක්වා නගින්නකි.

3. **වයස් සීමාව.**—1969.2.7 වෙනි දිනට අවුරුදු 25ට නොඅඩු විය යුතු අතර අවුරුදු 35 ට නොවැඩි විය යුතුය. දැනටමත් රජයේ සේවයේ යෙදී සිටින්නන්ට උපරිම වයස් සීමාව බලපානු නොලැබේ.

4. **අපේක්ෂකයනට තිබිය යුතු සුදුසුකම් :—**

(i) යාන්ත්‍රිකයකු (වායු සමීකරණ) වශයෙන් දස අවුරුදු පළපුරුද්දක් තිබිය යුතු අතර ඉන් අඩු ගණනේ හය අවුරුද්දක්වත් පළමුවැනි පංතියේ වෘත්තිකයකු වශයෙන් ක්‍රියාකර තිබිය යුතුය.

(ii) වායු සමීකරණ ඒකකයන් ක්‍රියා කරවීමේ මූලධර්ම පිළිබඳ දැනුමක් තිබිය යුතුය.

(iii) රූප සටහන් කියවා තේරුම් ගැනීමට හැකිවිය යුතුය.

(iv) සියළුම වර්ගවල වායු සමීකරණ ඒකකයන් පිළිබඳව දැනුමක් තිබිය යුතුය.

5. **සේවයෙහි යෙදවීමේ වගන්ති.**—තනතුර ස්ථිරය. තනතුරට පත්කරන්නාගේ විශ්‍රාම වැටුප් හිමිකම් පිළිබඳව තීරණයක් ගනු ලබන්නේ, අංක 633 හා 1964.2.7 වැනි දින දරන භාණ්ඩාගාර චක්‍රලේඛය අනුව, රජය යටතේ දස අවුරුදු සේවයක් සම්පූර්ණ කිරීමෙන් පසුවය.

6. අයදුම්කරුවන් ඔවුන්ගේ අයදුම් පත්වලට පහත සඳහන් සහතික පිටපත් (මුල් පිටපත් නොවේ) අමුණා එවිය යුතුය.

(අ) උප්පැන්න සහතිකය (සැ. යු. බෞතීස්ම සහතිකය හෝ උපකෘත පාඨශාලා සඳහා වන නියෝග සංග්‍රහයෙහි කාර්ය යන් සඳහා නිකුත් කරන ලද උප්පැන්න සහතිකය හෝ භාරගනු නො ලැබේ.)

(ආ) අධ්‍යාපන සහතික.

(ඇ) කාර්මික සුදුසුකම් පිළිබඳ සහතික.

(ඈ) පළපුරුද්ද පිළිබඳ සහතික.

(ඉ) චරිත සහතික දෙකක්.

7. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ II වැනි ඡේදයෙහි ආරම්භයෙහි සඳහන් රාජ්‍ය සේවා තනතුරු වලට කෙරෙන පත්කිරීම් සම්බන්ධයෙන් අදාල වන පොදු කොන්දේසි කෙරෙහි අවධානය යොමු කරවනු ලැබේ.

8. අයදුම්පත් හා ඒ සම්බන්ධ අනෙක් ලියවිලි සියල්ලක්ම සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ තැනට හැර මෙම දෙපාර්තමේන්තුවේ කිසියම් නිලධාරියකුගේ නමට පෞද්ගලිකව නො එවිය යුතුය.

ඩබ්. එල්. පී. ද මැල්,
සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ.

සිවිල් ගුවන් සේවා දෙපාර්තමේන්තුව,
තැ. පෙ. 535,
ලෝටස් පාර,
කොළඹ 1.

### අයදුම් පත්‍රයෙහි ආකෘතිය

### 1 වන පන්තියේ යාන්ත්‍රික (වායු සමීකරණ) තනතුර

1. සම්පූර්ණ නම :————.
(පැහැදිලි අකුරෙන්)

2. තැපැල් ලිපිනය :————.

3. උපන් දිනය හා වයස :————.

4. ඔබ ලංකාවේ පුරවැසියකු වන්නේ—
(i) පරම්පරාවෙන් ද :————.
නැතහොත්
(ii) ලියාපදිංචි වීමෙන් ද :————.

5. සමත් වූ උසස්ම විභාගය :————.
(විෂයයන් සඳහන් කළ යුතුයි)

6. සමත් වූ කාර්මික විභාගය :————.

7. පළපුරුද්ද :————.

8. විශේෂ සුදුසුකම් හා හිමිකම් :————.

9. දැනට කරන/කලින් කළ රක්ෂාවල් පිළිබඳ විස්තර :————.

10. මේ අයදුම් පතෙහි මවිසින් සපයනු ලැබූ විස්තර සත්‍ය බවත්, නිවැරදි බවත් මෙයින් සහතික කරමි. මෙහි ඇතුලත් විස්තර කිසිවක් අසත්‍ය බවට හෝ වැරදි බවට ඔප්පු වුවහොත් මේ පදවියට මා පත්වීමට නුසුදුසු වන බව හා පත්වීමෙන් පසුව අසත්‍යතාවයක් ඔප්පු වුවහොත් කිසිම වන්දියකට මා අහිමිවී පදවියෙන් පහකර දමනු ලැබීමටද හේතුවන බව හොඳාකාර දන්නා බවද ප්‍රකාශ කරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

1–912—69.1.24 දින අංක 14,838 දරන ගැසට් පත්‍රය

---

## ලංකා රාජ්‍ය ලෝහ භාණ්ඩ සංස්ථාව

### ඇබෑර්තු—මිලට ගැනුම් කළමනාකාර

ලංකා රාජ්‍ය ලෝහ භාණ්ඩ සංස්ථාවේ මිලට ගැනුම් කළමනාකාර තනතුර සඳහා අපේක්ෂිත සුදුසුකම් ඇති ලාංකිකයන්ගෙන් අයැදුම් පත් කැඳවනු ලැබේ.

වයස : 1969 ජනවාරි මස 1 වැනි දිනට වයස අවුරුදු 45 ට නොවැඩි විය යුතුයි.

**සුදුසුකම් :**

(1) සම්පූර්ණ වෘත්තිය සුදුසුකම් සහිත 5 අවුරුදු විධායක පළපුරුද්ද ;

**හෝ**

(2) පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධියක් සහිතව 10 අවුරුදු විධායක පලපුරුද්දක් තිබිය යුතුය.

සැ. යු.—මෙරට හා පිටරට මිලට ගැනීම් හා ගබඩා වැඩ පිළිබඳ පළපුරුද්ද අවශ්‍ය වේ.

අංක 1 හා 2 යටතේ සුදුසුකම් ඇති අය සංස්ථාවේ පහත සඳහන් වැටුප් ක්‍රමයක් මත පිහිටුවීමට සළකා බලනු ඇත :—

රු. 1,400—රු. 50×4=රු. 1,600.

(3) පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධියක් සහිතව 5 අවුරුදු විධායක පළපුරුද්ද හෝ අට අවුරුදු ජ්‍යෙෂ්ඨ පරිපාලන පළපුරුද්ද ; මින් අවුරුදු 5 ක් මිලට ගැනුම් හා ගබඩා වැඩ සම්බන්ධයෙන් විය යුතුය.

**හෝ**

(4) පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධියක් සහිතව 10 අවුරුදු පළපුරුද්ද ; මින් අවුරුදු 3ක් මිලට ගැනුම් හා ගබඩා වැඩ පිළිබඳ විධායක පළපුරුද්ද විය යුතුය.

සැ. යු. මෙරට හා පිටරට මිලට ගැනීම් හා ගබඩා වැඩ පිළිබඳව පලපුරුද්ද අවශ්‍ය වේ.

අංක 3 සහ 4 යටතේ සුදුසුකම් ඇති අය සංස්ථාවේ පහත සඳහන් වැටුප් ක්‍රමයක් මත පිහිටුවීමට සළකා බලනු ඇත :—

රු. 1,150—රු. 50×5=රු. 1,400

සම්පූර්ණ කරන ලද ඉල්ලුම් පත් 1969 පෙබරවාරි මස 7 වැනි දිනට හෝ ඊට ප්‍රථම,

සභාපති,
ලංකා රාජ්‍ය ලෝහභාණ්ඩ සංස්ථාව,
තැ. පෙ. 670, 242, හැව්ලොක් පාර,
කොළඹ, 5.

යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

රජයේ අංශයේ/සංස්ථා/මණ්ඩල ඉල්ලුම් පත් සේව්‍යයාගේ මාර්ගයෙන් එවිය යුතු අතර. ඔහු මෙම සංස්ථාවේ සේවය සඳහා තෝරා ගනු ලැබුවහොත් මුදා හරින බව එකී සේව්‍යයා විසින් සඳහන් කළ යුතුය.

මෙහි පහත දැක්වෙන ආදර්ශ ආකෘති පත්‍රය අනුව සකස් කර ගත් ඉල්ලුම් පත් මගින් ඉල්ලුම් කළ යුතුය. මෙම කාර්යාලයෙන් ඉල්ලුම් පත් නිකුත් නොකරන අතර, ඉල්ලුම් පත් ලැබුණ බව දන්වා එවනු නොලැබේ. තැපෑලේ දී ප්‍රමාද වන හෝ නැතිවන ඉල්ලුම් පත් ගැන සංස්ථාව වගකීම භාර නොගනී.

සභාපති,
ලංකා රාජ්‍ය ලෝහ භාණ්ඩ සංස්ථාව.

තැ. පෙ. අංක 670,
242, හැව්ලොක් පාර,
කොළඹ, 5,
1969 ජනවාරි මස 15.

ආදර්ශ ආකෘති පත්‍රය

**ලංකා රාජ්‍ය ලෝහ භාණ්ඩ සංස්ථාවේ මිලට ගැනුම් කළමනාකාර තනතුර සඳහා ඉල්ලුම් පත**

1. සම්පූර්ණ නම :————.
2. තැපැල් ලිපිනය :————.
3. උපන් දිනය:————, වයස: අවු :——, මාස :——, දින :——.
4. ජාතිය :————.
5. කසාද බැඳලාද, නැද්ද යන වග :————.
6. ලබා ඇති උසස්ම අධ්‍යාපනික සුදුසුකම් :————.
7. වෘත්තීය සුදුසුකම් :————.
8. පාසැලෙන් අස් වූවාට පසු සේවය පිළිබඳ විස්තර :————
9. පලපුරුද්ද :————.
10. ඔබ සඳහන් කිරීමට කැමති වෙනත් විස්තර :————.

ම විසින් මෙම ඉල්ලුම් පතෙහි සඳහන් කර ඇති විස්තර නිවැර හා සත්‍ය බව මින් සහතික කරමි.

————,
අයැදුම්කරුගේ අත් සන

දිනය :————.

1–925/1—69.1.24 දින අංක 14,838 දරන ගැසට් පත්‍රය

---

## ලංකා රාජ්‍ය ලෝහ භාණ්ඩ සංස්ථාව

### ඇබෑර්තු—මිලට ගැනුම් නිලධාරි

ලංකා රාජ්‍ය ලෝහ භාණ්ඩ සංස්ථාවේ මිලට ගැනුම් නිලධාරි තනතුර සඳහා අපේක්ෂිත සුදුසුකම් ඇති ලාංකිකයන්ගෙන් අයැදුම් පත් කැඳවනු ලැබේ.

වයස : 1969 ජනවාරි මස 1 වැනි දිනට වයස අවුරුදු 35ට නොවැඩි විය යුතුයි.

සුදුසුකම් : පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධිය සමග 3 අවුරුදු විධායක පලපුරුද්ද ; මින් දැවුරුද්දක් මිලට ගැනුම් හා ගබඩා වැඩ පිළිබඳව හෝ මිලට ගැනුම් හා ගබඩා වැඩ පිළිබඳ හය අවුරුදු ජ්‍යෙෂ්ඨ පරිපාලන පලපුරුද්ද තිබිය යුතුය.

හෝ

(2) පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධිය සමග 8 අවුරුදු පලපුරුද්දක් තිබිය යුතුය ; මින් දැවුරුද්දක් මිලට ගැනුම් හා ගබඩා වැඩ පිළිබඳ විධායක පලපුරුද්දක් විය යුතුය.

හෝ

(3) විද්‍යා, කලා, නීති, හෝ වාණිජ්‍ය පිළිබඳ මධ්‍යම පරීක්ෂණය සහතිකය සමග 10 අවුරුදු පලපුරුද්ද ; මින් 3 අවුරුද්දක් විධායක පලපුරුද්ද හෝ 6 අවුරුදු ජ්‍යෙෂ්ඨ පරිපාලන පලපුරුද්දක් තිබිය යුතුය.

1, 2 හා 3 යටතේ සුදුසුකම් ලත් අය සංස්ථාවේ පහත සඳහන් වැටුප් ක්‍රමයක් මත පිහිටුවීමට සළකා බලනු ඇත :—

රු. 1,000—රු. 45×7=රු. 1,315.

(4) පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධිය සමග මිලට ගැනුම් හා ගබඩා වැඩ සම්බන්ධව සිව් අවුරුදු පලපුරුද්ද ;

හෝ

(5) විද්‍යා, කලා, නීති හෝ වාණිජ්‍යය පිළිබඳ මධ්‍ය පරීක්ෂණ සහතිකය සමග මිලට ගැනුම් හා ගබඩා වැඩ පිළිබඳ 8 අවුරුදු පලපුරුද්දක් තිබිය යුතුය.

4 හා 5 යටතේ සුදුසුකම් ලත් අය සංස්ථාවේ පහත සඳහන් වැටුප් ක්‍රමයක් මත පිහිටුවීමට සළකා බලනු ඇත :—

රු. 800—රු. 45×7=රු. 1,115.

සම්පූර්ණ කරන ලද ඉල්ලුම් පත් 1969 පෙබරවාරි මස 7 වැනි දිනට හෝ ඊට ප්‍රථම,

"සභාපති,
ලංකා රාජ්‍ය ලෝහභාණ්ඩ සංස්ථාව,
තැ. පෙ. 670, 242, හැව්ලොක් පාර,
කොළඹ, 5."

යන ලිපිනයට **ලියාපදිංචි තැපැලෙන්** එවිය යුතුය.

රජයේ අංශයේ/සංස්ථා/මණ්ඩල ඉල්ලුම් පත් සේවයාගේ මා යෙන් එවිය යුතු අතර, ඔහු මෙම සංස්ථාවේ සේවය සඳහා තෝරා ගැ ලැබුවහොත් මුදා හරින බව එකී සේවයා විසින් සඳහන් කළ යුතු

මෙහි පහත දැක්වෙන ආදර්ශ ආකෘති පත්‍රය අනුව සකස් කර ගැ ඉල්ලුම් පත් මගින් ඉල්ලුම් කළ යුතුය. මෙම කාර්යාලයෙන් ඉල්ලු පත නිකුත් නොකරන අතර, ඉල්ලුම් පත් ලැබුණ බව දන්වා එවා නොලැබේ. තැපෑලේදී ප්‍රමාද වන හෝ නැතිවන ඉල්ලුම් පත් ගැ සංස්ථාව වගකීම් භාර නොගනී.

සභාපති,
ලංකා රාජ්‍ය ලෝහ භාණ්ඩ සංස්ථාව.

තැ. පෙ. අංක 670,
242, හැව්ලොක් පාර,
කොළඹ, 5,
1969 ජනවාරි මස 15.

ආදර්ශ ආකෘති පත්‍රය

**ලංකා රාජ්‍ය ලෝහ භාණ්ඩ සංස්ථාවේ මිලට ගැනුම් නිලධාරි තනතුර සඳහා ඉල්ලුම් පත**

1. සම්පූර්ණ නම :————.
2. තැපැල් ලිපිනය :————.
3. උපන් දිනය:————, වයස: අවු :——, මාස :——, දින :—
4. ජාතිය :————.
5. කසාද බැඳලාද, නැද්ද යන වග :————.
6. ලබා ඇති උසස්ම අධ්‍යාපනික සුදුසුකම් :————.
7. වෘත්තීය සුදුසුකම් :————.
8. පාසැලෙන් අස් වූවාට පසු සේවය පිළිබඳ විස්තර :————.
9. පලපුරුද්ද :————.
10. ඔබ සඳහන් කිරීමට කැමති වෙනත් විස්තර :————.

ම විසින් මෙම ඉල්ලුම් පතෙහි සඳහන් කර ඇති විස්තර නිවැර හා සත්‍ය බව මින් සහතික කරමි.

————,
අයැදුම්කරුගේ අත් සන

දිනය :————.

1–925/2—69.1.24 දින අංක 14,838 දරන ගැසට් පත්‍රය

---

## ලංකා රාජ්‍ය ලෝහ භාණ්ඩ සංස්ථාව

### ඇබෑර්තු—මාණ්ඩලික සහකාර (ගබඩා)

ලංකා රාජ්‍ය ලෝහ භාණ්ඩ සංස්ථාවේ මාණ්ඩලික සහකාර (ගබඩා) තනතුර සඳහා අපේක්ෂිත සුදුසුකම් ඇති ලාංකිකයන්ගෙන් අයදුම් පත් කැඳවනු ලැබේ.

වයස : 1969 ජනවාරි මස 1 වැනි දිනට වයස අවුරුදු 35 ට නොවැඩි විය යුතුයි.

සුදුසුකම් : පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධිය සමග සිවු අවුරුදු පලපුරුද්ද තිබිය යුතුය ;

හෝ

(2) විද්‍යා, කලා, නීති හෝ වාණිජ්‍ය පිළිබඳ මධ්‍ය පරීක්ෂණ සහතිකය සමග අට අවුරුදු පලපුරුද්ද තිබිය යුතුය.

හෝ

(3) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතිකය හෝ සමාන සුදුසුකම් සමග 15 අවුරුදු පලපුරුද්දක් තිබිය යුතුය.

සැ. යු. මෙරට හා පිටරට මිලට ගැනීම් හා ගබඩා වැඩ පිළිබඳ පලපුරුද්ද අවශ්‍ය වේ.

**වැටුප් ක්‍රමය :** රු. 800—රු. 45×7—රු. 1,115.

සම්පූර්ණ කරන ලද ඉල්ලුම් පත් 1969 පෙබරවාරි මස 7 වැනි දින හෝ ඊට ප්‍රථම,

"සභාපති,
ලංකා රාජ්‍ය ලෝහභාණ්ඩ සංස්ථාව,
තැ. පෙ. 670, 242, හැව්ලොක් පාර,
කොළඹ, 5."

යන ලිපිනයට **ලියාපදිංචි තැපැලෙන්** එවිය යුතුය.

රජයේ අංශයේ/සංස්ථා/මණ්ඩල ඉල්ලුම් පත් සේවයාගේ මා යෙන් එවිය යුතු අතර. ඔහු මෙම සංස්ථාවේ සේවය සඳහා තෝරා ගැ ලැබුවහොත් මුදා හරින බව එකී සේවයා විසින් සඳහන් කළ යුතු

මෙහි පහත දැක්වෙන ආදර්ශ ආකෘති පත්‍රය අනුව සකස් කර ගත් ඉල්ලුම් පත් මගින් ඉල්ලුම් කළ යුතුය. මෙම කාර්යාලයෙන් ඉල්ලු පත් නිකුත් නොකරන අතර, ඉල්ලුම් පත් ලැබුණ බව දන්වා එවා

නොලැබේ. තැපෑලේ දී ප්‍රමාද වන හෝ නැතිවන ඉල්ලුම් පත් ගැන සංස්ථාව වගකීම භාර නොගනී.

සභාපති,
ලංකා රාජ්‍ය ලෝහ භාණ්ඩ සංස්ථාව.

තැ. පෙ. අංක 670,
242, හැව්ලොක් පාර,
කොළඹ, 5,
1969 ජනවාරි මස 15.

### ආදර්ශ ආකෘති පත්‍රය

**ලංකා රාජ්‍ය ලෝහ භාණ්ඩ සංස්ථාවේ මාණ්ඩලික සහකාර (ගබඩා) තනතුර සඳහා ඉල්ලුම් පත**

1. සම්පූර්ණ නම :————.
2. තැපැල් ලිපිනය :————.
3. උපන් දිනය:————, වයස: අවු :——, මාස :——, දින :——.
4. ජාතිය :————.
5. කසාද බැඳලාද, නැද්ද යන වග :————.
6. ලබා ඇති උසස්ම අධ්‍යාපනික සුදුසුකම් :————.
7. වෘත්තීය සුදුසුකම් :————.
8. පාසැලෙන් අස්වූවාට පසු සේවය පිළිබඳ විස්තර :————.
9. පලපුරුද්ද :————.
10. ඔබ සඳහන් කිරීමට කැමති වෙනත් විස්තර :————.

ම විසින් මෙම ඉල්ලුම් පතෙහි සඳහන් කර ඇති විස්තර නිවැරදි හා සත්‍ය බව මින් සහතික කරමි.

————,
දිනය :————. අයැදුම්කරුගේ අත්සන.

1–925/3—69.1.24 දින අංක 14,838 දරන ගැසට් පත්‍රය

---

## ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුව

### පළමුවැනි ශ්‍රේණියේ ගබඩා භාරකාර තනතුර

ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුවේ I ශ්‍රේණියේ ගබඩා භාරකාර තනතුරක් සඳහා ඉල්ලුම් පත් කැඳවනු ලැබේ. 1969 පෙබරවාරි මස 25 දිනට හෝ ඊට පෙර, පහත සඳහන් ආකෘති පත්‍රය අනුව, ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුවේ ගබඩා අධිකාරී වෙත ලැබෙන පිණිස ලියා පදිංචි කළ තැපෑලෙන් ඉල්ලුම් පත් එවිය යුතුය. කවරයේ වම් උඩ කෙළවරේ " ගබඩා භාරකරු තනතුර සඳහා ඉල්ලුම් පත්‍රය " යනුවෙන් සඳහන් කළ යුතුය.

2. වැටුප් පරිමාණය : රු. 2,700 කින් පටන් ගෙන එය අවුරුදු පතා රු. 120 බැගින් වැඩිවී, රු. 3,780 තෙක් නගින වැටුපක් මේ සඳහා අදාලය,

3. **අවශ්‍ය සුදුසුකම් :**

(අ) තමා විශිෂ්ඨ සදාචාර චරිතයකින් හෙබි අයෙක් බවට, සෑම අයදුම්කරුවකු විසින්ම සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.

(ආ) 1969. 2. 25 දිනට අවුරුදු 25 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

(ඇ) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගය හෝ ඒ හා සමාන විභාගයකින් හෝ ඊට වඩා උසස් විභාගයකින් අයදුම්කරුවන් සමත් වී සිටිය යුතුය.

**සංලක්ෂය :** සිංහල මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ සිංහල අයදුම්කරුවන් සම්බන්ධයෙන්, ඔවුන් ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයේ දී හෝ ඒ හා සමාන විභාගයකදී සිංහල භාෂාවෙන් හෝ ඒ හා සමාන විෂයයකින් සමත් වී තිබිය යුතුය.

(1961 ජනවාරි 1 වෙනි දිනට පෙර රජයේ සේවයෙහි යෙදී සිටි නිලධාරීන් සඳහා මෙම අවශ්‍යතාවය අදාල නොවේ.)

((ඈ) ගබඩා දෙපාර්තමේන්තුවක සේවය කර අවුරුදු පහක පළපුරුද්දක් තිබීමද, සාමාන්‍ය ගබඩා පිළිබඳ වැඩ කිරීමේ දැනීමක් තිබීමද, තොග පොත්, ලැජර් සහ අනිකුත් ගබඩා ලියකියවිලි සම්බන්ධ වැඩ කිරීමේ හැකියාවක්ද තිබිය යුතුයි.

(ඉ) සංවිධානය කිරීමේ හැකියාවක් තිබිය යුතු අතර, සේවක මණ්ඩල සහ කම්කරුවන් පාලනය කිරීමට ද හැකි විය යුතුය.

**සටහන :** දැනට මත් රජයේ සේවයෙහි නියුක්තව සිටින නිලධාරීන්ට වයස් ප්‍රමාණය හා අධ්‍යාපනික සුදුසුකම් නොසලකා, අන් කරුණුවලින් සුදුස්සන් වී තිබේ නම්, මේ සඳහා ඉල්ලුම් කළ හැක.

4. **සේවයෙහි නියුක්ත කරවීමේ වගන්ති :**

(i) තනතුර ස්ථිරය. තෝරා ගනු ලැබූ අයදුම්කරු, පළමුවෙනි අවස්ථාවට අර්ථ සාධක අරමුදල් ගෙවීමේ ක්‍රමයට, තුන් අවුරුදු කාල පරිච්ඡේදයක පරීක්ෂණ කාලයක් සඳහා පත් කරනු ලැබේ. මේ තනතුර විශ්‍රාම වැටුප් සහිතවීමට ඉඩ තිබේ. දැනටමත් රජයේ සේවයේ, ස්ථිර විශ්‍රාම වැටුප් සහිත තනතුරක් දරණ අයදුම්කරුවෙකු තෝරා ගනු ලැබුව හොත්, ඔහුව පළමුවෙනි අවස්ථාවට, වැඩ බැලීම සඳහා පත් කරනු ලැබේ.

(ii) ඔහු, රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරනු පිණිස ද, විශේෂයෙන්ම 1956 යේ අංක 33 දරණ රාජ්‍ය භාෂා පණතේ විධි විධාන ක්‍රියාවේ යෙදීම පිණිසද, දැනට පනවා ඇති හෝ මින් මතුවට පනවනු ලබන හෝ ව්‍යවස්ථාවලට අනුකූලව ක්‍රියා කළ යුතුය.

(iii) පරීක්ෂණ කාලය තුළදී, සිංහල පිළිබඳ ප්‍රවීණතාවය ඔහු විසින් ලබාගත යුතුය.

(iv) පරීක්ෂණ කාලය අවසානයේදී, තනතුරෙහි ස්ථිර කිරීම, අනෙකුත් කරුණු අතර නියමිත කාල පරිච්ඡේදයක් තුළදී නියමිත සිංහල ප්‍රවීණතා පරීක්ෂණවලින් සමත්වීම උඩ රඳා පවතී. මෙම ප්‍රවීණතා පරීක්ෂණවලින් අසමත්වීමේ ප්‍රතිඵල වනුයේ, වේතනාධිකය අත්හිටවීමට සිදුවීමයි. නියමිත කාලපරිච්ඡේදයට වඩා තවත් හයමසක කාලයක් තුළදී ප්‍රවීණතා පරීක්ෂණයෙන් අසමත් වුවහොත් වේතනාධිකය අත්හිටවීම, නතර කිරීමකට පරිවර්තනය කර එය පරීක්ෂණය සමත් වන තෙක් බල පාන්නේය.

(v) පරීක්ෂණ කාලය අවසානයේදී නියමිත සිංහල ප්‍රවීණතා තත්ත්වය ලබා නොගතහොත්, පාලන රෙගුලාසි 120 සහ 121 කේ විධි විධානයන් අදාල වේ. (දෙමළ/ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් බඳවා ගන්නා නිලධාරීන්ට ඉහත සඳහන් (iii) (iv) සහ (v) හි කොන්දේසි අදාල වේ.

(vi) **කායික්ෂමතා කඩඉම් :** තනතුරෙහි ස්ථිර කර අවුරුදු 2 ක් තුළදී, ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයට සමාන, සිංහල භාෂාමය නියමිත කායික්ෂමතා කඩඉම් පරීක්ෂණය කින් ඔවුන් සමත් විය යුතුය. මෙම විභාගය අසමත්වීමේ ප්‍රතිඵලය වනුයේ වේතනාධිකය ප්‍රමාද කිරීමයි.

(vii) තෝරා ගත් අයදුම්කරු විසින් මුදලින් රු. 5,000 කින් හා රු. 10,000 ක ඇප ඔප්පුවකින් ඇප තැබිය යුතුය. මුදලින් තබන ඇපය සම්බන්ධයෙන් රු. 1,500 ක මූලික තැන්පත් මුදලක් ඔහු විසින් බැඳිය යුතු අතර, ඉතිරි මුදල රු. 50 හේ සමාන මාසික කොටස් මුදල්වලින් ගෙවිය යුතුය.

5. අයදුම්කරුවන් තමන්ගේ අයදුම් පත්වලට අමුණා එවිය යුතු පිටපත් (මුල් පිටපත් නොවේ) :—

(අ) උප්පැන්න සහතිකය (බෞතීස්ම සහතිකය හෝ උපකෘත පාඨශාලා ව්‍යවස්ථා සංග්‍රහයේ සඳහන් කටයුතු පිණිස නිකුත් කර ඇති සහතික පිළිගනු නොලැබේ.)

(ආ) ලබා ඇති උසස්ම අධ්‍යාපනික සහතිකය.

(ඇ) මෑතකදී ලබාගත් චරිත සහතික තුනක්. (දැනට රජයේ සේවයේ නියුතු වූවන් මෙම ඡේදයෙහි සඳහන් චරිත සහතික ඉදිරිපත් කිරීම අවශ්‍ය නොවේ)

6. රජයේ සේවයේ නියුතු නිලධාරීන්ගේ ඉල්ලුම් පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තුවේ ප්‍රධානියාගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුයි. නියම දිනට පසු එවන එවැනි අයදුම් පත් භාරගනු නොලැබේ. එහෙත් දෙපාර්තමේන්තුවේ ප්‍රධානියාට නියම දිනට හෝ ඊට පෙර ඉල්ලුම් පත් ලැබී, ප්‍රමාදය සඳහා සැලකිය යුතු කාරණා ඉදිරිපත් කර දෙපාර්තමේන්තු ප්‍රධානියා නිර්දේශ කළහොත් පමණක්, යථෝක්ත ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් භාරගනු ලැබේ.

7. මෙම ගැසට් නිවේදනයේ, I වැනි කොටසේ (II) වැනි ඡේදයේ රාජ්‍ය සේවා තනතුරු පිළිබඳ පොදු කොන්දේසි කෙරෙහි අවධාන යොමු කරවනු ලැබේ.

එස්. ඒ. පී. රූපසිංහ,
ගබඩා අධිකාරී.

1969 ක්වූ ජනවාරි මස 15 වෙනි දින,
ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුව,
තැ. පෙ. 418,
කොළඹ.

### ආදර්ශ ඉල්ලුම් පත්‍රය

**ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුවේ I වැනි ශ්‍රේණියේ ගබඩා භාරකාර තනතුර සඳහා ඉල්ලුම් පත්‍රය**

1. සම්පූර්ණ නම :————.
   (පැහැදිලි අකුරෙන්)
   (අ) වාසගම :————.
   (ආ) අනිකුත් නම් :————.
2. තැපැල් ලිපිනය :————.
3. 1969. 2. 25 දිනට ඉල්ලුම්කරුගේ නියම වයස :————.
   (උප්පැන්න සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුය)
4. (අ) ලංකාවේ පුරවැසියෙක් දැයි සඳහන් කරන්න :————.
   (i) පරම්පරාවෙන්ද ?
   (ii) ලියා පදිංචි කිරීමෙන්ද ?

(ආ) උපන් ස්ථානය :————.

(i) අයදුම්කරු :————.

(ii) අයදුම්කරුගේ පියා :————.

(iii) අයදුම්කරුගේ පිය පක්ෂයේ පියා :————.

(iv) අයදුම්කරුගේ පිය පක්ෂයේ පියාගේ පියා :————.

සංලක්ෂය : අයදුම්කරු සහ ඔහුගේ පියා ලංකාවේ උපන් අයවලුන් වේ නම් (i) (ii) පමණක් පිරවිය යුතුය. අයදුම්කරු හෝ ඔහුගේ පියා ලංකාවේ උපන් අය නොවේ නම්, (i), (ii), (iii), (iv) පිරවිය යුතුය.

5. අධ්‍යාපනික හා අනිකුත් සුදුසුකම් :————.

(අ) සාමාර්ථය ලද උසස්ම විභාගය :————.
(විභාග සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුය.)

(ආ) සිංහල මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ සිංහල අයදුම්කරුවෙක් නම්, ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයේදී හෝ ඒ හා සමාන විභාගයකදී, සිංහල භාෂාවෙන් හෝ ඒ සමාන විෂයකින් සාමාර්ථය ලබා ඇත්දැයි සඳහන් කරන්න.

(ඇ) ගබඩා දෙපාර්තමේන්තුවක සේවය කර අවුරුදු 5 ක පළපුරුද්දක් තිබේදැයි සඳහන් කරන්න. එසේ නම්, පත්වීමේ දිනයත්, කරන ලද වැඩෙහි ස්වභාවයත් පිළිබඳ විස්තරයක් ද සඳහන් කරන්න.
(පළපුරුදුකම් පිළිබඳ සහතික පිටපත් ඇමිණිය යුතුය)

(ඈ) වෙනත් හිමිකම් පෑම් හෝ සුදුසුකම් :—

(i) සම්පූර්ණ සේවා විස්තර සහ දිනයත් සමග පාසැලෙන් අස්වූවාට පසු කරන ලද රැකියාවල් ;

(ii) ආණ්ඩුවේ සේවයෙහි කලින් නියුක්තව සිටියේ නම්, සේවය අවසන් කරන ලද හේතුන් සමග විස්තර කළ යුතුයි.

(iii) සේවා මුක්ත භටයෙක් නම්, සිවිල් හමුදා ඒකකය, දැරූ තනතුර සහ බැඳුනු දිනයත්, අස්කල දිනයත් පිළිබඳ විස්තරයක් දිය යුතුයි.

7. චරිත සහතිකය ලබා ගත්තේ කාගෙන් ද යන වග සහ ඔවුන්ගේ නම් සහ ලිපිනය, සහතිකවල පිටපත් සමග ඇමිණිය යුතුයි.

8. (අ) අපරාධ වරදකට වරදකරුවී හෝ චෝදනා ලැබ හෝ සිතාසි කර තිබේදැයි සඳහන් කරන්න.
(නඩුවේ නොම්මරයත් දිනයත් සඳහන් කළ යුතුයි.)

(ආ) ආණ්ඩුවේ සේවයෙන් පහකර හෝ සේවය අවසන් කර තිබේද ;

(ඇ) ආණ්ඩුවේ සේවයේ කිසියම් තනතුරක් අත්හැර ගොස් තිබේද.

මා විසින් සඳහන් කිරීමට යෙදුන, ඉහත සඳහන් විස්තර නිවැරදි හා සත්‍ය බව සහතික කරමි. මෙහි සඳහන් කරුණු අසත්‍ය හෝ වැරදි සහගත යයි ඔප්පු වුවහොත් තෝරා පත් කර ගැනීමට පෙර නම් මා තෝරා පත්කර ගැනීමට නුසුදුසු වන බවත්; සේවයට පත් කර ගැනීමෙන් පසුව වැරදි සහගත විස්තර අනාවරණය වුවහොත් කිසිම වන්දියක් නොමැතිව මා සේවයෙන් පහකරනු ලබන බවත් හොඳාකාර දනිමි.

————,
අපේක්ෂකයාගේ අත්සන.

දිනය :————.

1–888—69.1.24 වැනි දින අංක 14,838 දරන ගැසට් පත්‍රය

---

## දුෂ්කර ප්‍රදේශවල පිහිටි රජයේ පාසල් වල ඉංග්‍රීසි උප ගුරුවරුන් වශයෙන් සේවය කිරීම සඳහා ඉංග්‍රීසි උප ගුරුවරුන් බඳවා ගැනීම

යථෝක්ත මැයින් අංක 14,830 හා 1968.11.29 වැනි දින දරන ගැසට් පත්‍රයේ I කොටසේ II වැනි ඡෙදයේ පළ කරන්නට යෙදුන නිවේදනය කෙරෙහි මෙයින් අවධානය යොමු කරවනු ලැබේ.

2. එම නිවේදනය යටතේ ඉල්ලුම්පත් භාර ගැනීම 1969.2.14 වැනි දින තෙක් දීර්ඝ කරනු ලැබේ. එම නිවේදනය යටතේ දැනටමත් අයදුම්පත් එවා ඇති අයදුම්කරුවන් නැවත වරක් අයදුම්පත් නො එවිය යුතුය.

3. තවද යථෝක්ත නිවේදනයෙන් සඳහන් ව ඇති ඡන්ද කොට්ඨාශවලට අමතරව පහත සඳහන් ඡන්ද කොට්ඨාශ ද ඇතුලත් කර ඇති බව සැලකිය යුතුයි :—

**සිංහල මාධ්‍ය පාසල් වල පුරප්පාඩු :**

පොතුවිල් ... කල්මුනේ ප්‍රදේශය

**දෙමළ ජාතික අපේක්ෂකයින් සඳහා දෙමළ මාධ්‍ය පාසල් වල පුරප්පාඩු :**

වවුනියාව ... වවුනියාව ප්‍රදේශය

නුවරඑළිය, මස්කෙළිය, කොත්මලේ, වලපනේ, වැලිමඩ, ඌව-පරණගම ... නුවරඑළිය ප්‍රදේශය

බණ්ඩාරවෙල, හපුතලේ, පස්සර, බදුල්ල ... බණ්ඩාරවෙල ප්‍රදේශය

බිබිල ... මොනරාගල ප්‍රදේශය

නිවිතිගල, බලංගොඩ, රක්වාන ... රත්නපුර ප්‍රදේශය

පොතුවිල් ... කල්මුනේ ප්‍රදේශය

**මුස්ලිම් ජාතික අපේක්ෂකයින් සඳහා දෙමළ මාධ්‍ය මුස්ලිම් පාසල් වල පුරප්පාඩු :**

කල්මුනේ ... කල්මුනේ ප්‍රදේශය

නින්තාවූර්, පොතුවිල් ... ත්‍රිකුණාමලය ප්‍රදේශය

එහෙත් දැනටමත් ඉල්ලුම්පත් එවා ඇති අය මේ අනුව තමා අභිමත අලුත් ඡන්ද කොට්ඨාශ පිළිබඳව නැවත දැනුම් දීමක් මේ අවස්ථාවේ දී නො කළ යුතුය. ඔවුන් තම කැමැත්ත සම්මුඛ පරීක්ෂණ පවත්වන අවස්ථාවේදී ප්‍රකාශ කළ යුතුය.

4. මෙතෙක් අයදුම් පත් එවා නැති අය පමණක් අයදුම්පත් 1968.11.29 වැනි දින දරන ගැසට් නිවේදනයෙහි දක්වා ඇති ආදර්ශ ආකෘති පත්‍රය අනුව පිළියෙල කර ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

5. 1969.2.14 වැනි දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

ඩී. ජී. දයාරත්න,
ස්ථිර ලේකම් හා අධ්‍යාපන අධ්‍යක්ෂ ජනරාල්.

1969 ජනවාරි මස 16 වෙනි දින,
කොළඹ 2, මලයි විදියේ,
අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ දී ය.

1–972—69.1.24 දින අංක 14,838 දරන ගැසට් පත්‍රය

---

## අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශය

### ඉංග්‍රීසි උප ගුරුවරුන් බඳවා ගැනීම

යථෝක්ත මැයින් අංක 14,830 හා 1968.11.29 වැනි දින දරණ ගැසට් පත්‍රයේ I කොටසේ (II) වැනි ඡේදයේ පළ කරන්නට යෙදුන නිවේදනය කෙරෙහි මෙයින් අවධානය යොමු කරවනු ලැබේ.

2. එම නිවේදනය යටතේ අයදුම් පත් භාර ගැනීම 1969.2.14 වැනි දින තෙක් දීර්ඝ කරනු ලැබේ. එම නිවේදනය යටතේ දැනටමත් අයදුම්පත් එවා ඇති අයදුම්කරුවන් නැවත වරක් අයදුම්පත් නො එවිය යුතුය.

3. අයදුම්පත් 1968.11.29 දින දරණ ගැසට් නිවේදනයෙහි දක්වා ඇති ආදර්ශ ආකෘති පත්‍රය අනුව පිළියෙල කර ලියා පදිංචි තැපෑලෙන් එවිය යුතුය.

4. 1969.2.14 වැනි දිනට පසුව ලැබෙන අයදුම් පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

ඩී. ජී. දයාරත්න,
ස්ථිර ලේකම් හා අධ්‍යාපන අධ්‍යක්ෂ ජනරාල්.

පාප/12/267.
1969 ජනවාරි මස 16 වැනි දින,
කොළඹ 2, මලයි විදියේ,
අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේදීය.

1–973—69.1.24 දින අංක 14,838 දරන ගැසට් පත්‍රය

## ලංකා ගුවන් විදුලි සංස්ථාව

### පුරප්පාඩු

පහත සඳහන් තනතුරු සඳහා ලාංකිකයන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

(1) අධ්‍යක්ෂ, ප්‍රවෘත්ති හා ප්‍රකාශන.

(2) සේවා ප්‍රධානියා (වැඩ සටහන්) ඉංග්‍රීසි.

(3) II ශ්‍රේණියේ නිවේදක—ඉංග්‍රීසි.

**1. අධ්‍යක්ෂ, ප්‍රවෘත්ති හා ප්‍රකාශන**

**සුදුසුකම් :**

(අ) පිළිගත් විශ්ව විද්‍යාලයක ගෞරව හෝ පංතියක් සහිත උපාධියක් හෝ ඊට සමාන වෘත්තීය සුදුසුකමක් හා රජයේ සේවයේ හෝ පෞද්ගලික අංශයේ කළමනාකාර තත්ත්වයේ 10 වසක පළපුරුද්ද

ප්‍රවෘත්ති පත්‍ර කලාව පිළිබඳ පළ පුරුද්දක් ඇති අය කෙරෙහි වැඩි සැළකිල්ලක් දක්වනු ලැබේ.),

**හෝ**

පිළිගත් ප්‍රවෘත්ති පත්‍රයක හෝ ගුවන් විදුලි ආයතනයක කර්තෘ මණ්ඩලයක යටත් පිරිසෙයින් 10 වසක පළපුරුද්ද සහිතව පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධියක්,

**හෝ**

පිළිගත් ප්‍රවෘත්ති පත්‍රයක කතෘ මණ්ඩලයේ හෝ ගුවන් විදුලි ආයතනයක ප්‍රවෘත්ති කාර්ය මණ්ඩලයේ හෝ යටත් පිරිසෙයින් 15 වසක පළපුරුද්ද සහිතව, පිළිගත් විශ්ව විද්‍යාලයක මධ්‍ය පරීක්ෂණය හෝ ඊට සමාන විභාගයක්.

(ගුවන් විදුලි ප්‍රචාර පිළිබඳ අවුරුදු 20කට නොඅඩු පළ පුරුද්දක් ඇති ගුවන් විදුලි දෙපාර්තමේන්තුවේ/සංස්ථාවේ සේවකයින් යටත් පිරිසෙයින් ලන්ඩන් මැට්රිකියුලේෂන් විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් සමත් වී ඇතොත් ඒ අය වෙනුවෙන් ඉහත සඳහන් අධ්‍යාපන සුදුසුකම් නොබලපානු ඇත.)

**සහ**

(ආ) සිංහල හා ඉංග්‍රීසි පිළිබඳ මනා දැනුමක්. දෙමළ පිළිබඳ දැනුම අමතර සුදුසුකමක් ලෙස සලකනු ලැබේ.

(ඇ) දේශීය හා විදේශීය තත්කාලීන සිදුවීම් පිළිබඳ මනා දැනුමක්.

(ඈ) කළමනාකාරීත්වය හා ප්‍රකාශන නිෂ්පාදනය පිළිබඳ දැනුම.

වැටුප් ක්‍රමය : මාසිකව රු. 1,250—1,750 (50×5) රු. 1,350 ට පෙර කාර්යක්ෂමතා කඩඉමකි.

වයස : අවුරුදු 30—45 දක්වා.

**2. සේවා ප්‍රධානියා (වැඩ සටහන්) ඉංග්‍රීසි**

**සුදුසුකම් :**

(අ) රජයේ හෝ පෞද්ගලික අංශයේ විධායක තත්ත්වයේ අවුරුදු 5 ක පළපුරුද්ද සහිතව, පිළිගත් විශ්ව විද්‍යාලයක නියමිත උපාධියක් හෝ ඩිප්ලෝමාවක් සහ පිළිගත් ගුවන් විදුලි ආයතනයක ගුවන් විදුලි ප්‍රචාරකයකු වශයෙන් අඩු වශයෙන් තුන් වසක අඛණ්ඩ පළපුරුද්දක්,

**හෝ**

ගුවන් විදුලි ප්‍රචාරය සහ වැඩ සටහන් පාලනය පිළිබඳව අඩු වශයෙන් 10 වසක පළපුරුද්ද සහිතව, පිළිගත් විශ්ව විද්‍යාලයක මධ්‍ය පරීක්ෂණය,

**හෝ**

පිළිගත් ගුවන් විදුලි ආයතනයක වැඩ සටහන් අංශයක අවුරුදු 12ක වැඩ කිරීමේ පළපුරුද්දක් සහිතව අංක ගණිතය/ගණිතය හා සිංහල/දෙමළ/ඉංග්‍රීසි යන විෂයයන්ගෙන් ලද සාමාර්ථය සහිතව එකවර විෂයයන් 6 කින් සාමාර්ථය ලැබූ අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගය හෝ ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගය හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයක්,

**සහ**

(ආ) ලංකාව හා ලංකාවේ කටයුතු හා එහි සංස්කෘතිය පිළිබඳ පුළුල් දැනුමක්, සාහිත්‍යය හෝ සංස්කෘතිය පිළිබඳව මනා පසුබිමක්.

වැටුප් ක්‍රමය : මාසික රු. 720—1120 (40×7—50×4) රුපියල් 920ට පෙර කාර්යක්ෂමතා කඩඉමකි.

වයස : අවුරුදු 30—45 දක්වා.

**3. II ශ්‍රේණියේ නිවේදක—ඉංග්‍රීසි.**

**සුදුසුකම් :**

(අ) ඉංග්‍රීසි භාෂාවෙන් සම තත්ත්වයේ සාමාර්ථයක් සහිතව පිළිගත් විශ්ව විද්‍යාලයක හෝ ආයතනයක යෝග්‍ය මධ්‍ය පරීක්ෂණය හෝ ඊට සමාන විභාගයක්,

**හෝ**

පිළිගත් ගුවන් විදුලි ආයතනයක සහන නිවේදකයකු වශයෙන් යටත් පිරිසෙයින් 3 වසක පළපුරුද්ද සහිතව, ඉංග්‍රීසි භාෂාවෙන් ලද සාමාර්ථයක්ද ඇතුව, ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගය හෝ ඊට සමාන විභාගයක්,

**හෝ**

වැඩ සටහන්වලට නිවේදනය කිරීම ඇතුළු වී ඇති ගුවන් විදුලි දෙපාර්තමේන්තුවේ/ලංකා ගුවන් විදුලි සංස්ථාවේ කොන්ත්‍රාත් නිලධාරියකු වශයෙන් 3 වසකට නොඅඩු අඛණ්ඩ සේවාවක් සහිතව ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගය හෝ ඊට සමාන විභාගයක්,

**සහ**

(ආ) මනා සාහිත්‍යමය හෝ සංස්කෘතික පසුබිමක්, නිර්මාණ ශක්තිය හා තත්කාලීන සිදුවීම් පිළිබඳ දැනුම.

(ඇ) මයික්‍රෆෝනයට සුදුසු කටහඬක් හා මනා ස්වීයත්වයක්, පිළිගත හැකි උච්චාරණ ශෛලියක්, සියල්ලම හොඳ තත්ත්වයේ විය යුතුයි.

**විශේෂ නියමය :** 8 වසකට නොඅඩු සේවාවක් ඇති ගුවන් විදුලි දෙපාර්තමේන්තුවේ/සංස්ථාවේ සේවකයන් වෙනුවෙන් ඉහත (අ) හි සඳහන් අධ්‍යාපනික සුදුසුකම් නොබලපානු ඇත.

වැටුප් ක්‍රමය : මාසික රු. 450—675 (20×5—25×5) රුපියල් 510ට පෙර කාර්යක්ෂමතා කඩඉමකි.

වයස : අවුරුදු 23—40 දක්වා.

මෙම දැන්වීම අග ඇති ආකෘතිය අනුව සැපයිය යුතු අයදුම්පත් 1969 පෙබරවාරි මස 8 වැනි දිනට පෙර ලැබෙන සේ ලියා පදිංචි කළ තැපැලෙන් කොළඹ 7, ලංකා ගුවන් විදුලි සංස්ථාවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත එවිය යුතුයි. ලිපි කවරයේ ඉහළ වම් කෙළවරේ “අධ්‍යක්ෂ ප්‍රවෘත්ති හා ප්‍රකාශන/සේවා ප්‍රධානියා (වැඩ සටහන්) ඉංග්‍රීසි/II ශ්‍රේණියේ නිවේදක—ඉංග්‍රීසි” යන්න පැහැදිලිව ලිවිය යුතුයි.

නෙවිල් ජයවීර,
අධ්‍යක්ෂ ජනරාල්.

1969 ජනවාරි 15.

### ආදර්ශ ආකෘති පත්‍රය

1. සම්පූර්ණ නම :————.
2. ලිපිනය :————.
3. ජාතිය :————.
4. අයදුම්කරු උපන් දිනය. ස්ථානය (උප්පැන්න සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුයි) :————.
5. අයදුම්කරුගේ පියා උපන් ස්ථානය :————.
6. අධ්‍යාපනික සුදුසුකම් :—

   සිංහල :————.

   දෙමළ :————.

   ඉංග්‍රීසි :————.
7. අමුණා ඇති චරිත සහතික ලබාගත් අයගේ නම් සහ ලිපින : ————. (චරිත හා අධ්‍යාපනික සහතිකවල පිටපත් ඇමිණිය යුතුයි).
8. ඉහතින් යෙදී සිටි රැකියා පිළිබඳ විස්තර :————.
9. වෙනත් සුදුසුකම් :————.

මා ඉහතින් ප්‍රකාශ කොට ඇති කරුණු නිවැරදි සත්‍ය තොරතුරු බවත්, මා ලංකා ගුවන් විදුලි සංස්ථාවේ සේවයට පත් වුවහොත් මා විසින් ඉහතින් දෙන්නට යෙදුණ අසත්‍ය හෝ වැරදි තොරතුරක් වෙතොත් ඒ හේතුවෙන් සේවයෙන් පහකිරීමේ දඬුවම් ලැබීමට මා සුදුස්සකු වන බවත් විශේෂයෙන්ම මීට පෙර යෙදී සිටි රැකියාවල් පිළිබඳ හෝ මීට අදාළ වැදගත් කිසියම් කාරණාවක් පිළිබඳව හෝ හිතාමතා වසන් කිරීම නිසා එවැනිම දඬුවමකට මා සුදුසුවවන බවත් මා වටහාගත් බව මෙයින් ප්‍රකාශ කර සිටිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

1–926—69.1.24 දින අංක 14,838 දරන ගැසට් පත්‍රය

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## 1968 ජූලි මාසයේ පවත්වන ලද නොතාරිස් ප්‍රාරම්භ විභාගය

1968 ජූලි මස 1 වෙනි දින පැවැත්වුනු නොතාරිස් ප්‍රාරම්භ විභාගයේ ප්‍රතිඵල අනුව පහත නම් සඳහන් අපේක්ෂකයන් ද නොතාරිස් ධුරයට සුදුසුකම් ලැබීම සඳහා ප්‍රතිඥත ලිපිකරුවන් වශයෙන් ඇතුළත් කරගැනීමට තෝරාගනු ලැබූ බව මෙයින් නිවේදනය කරමි.

| විභාග අංකය | අපේක්ෂකයාගේ නම | කටයුතු කිරීමට අදහස් කර ඇති භාෂාව |
|---|---|---|
| 1 | අබ්දෙණිය, ඒ. ඩී. | සිංහල |
| 6 | අබයසිංහ, ඩී. ඊ. එන්. | එම |
| 17 | ඇලෙක්සැන්ඩර්, ඒ. පී. ඒ. | එම |
| 18 | අල්ගම, ඩී. ඩබ්. පී. | එම |
| 38 | ආරියදාස, ජී. | එම |
| 39 | ආරියදාස, කේ. | එම |
| * 47 | බාලමහත්මයා, ජේ. එම්. | එම |
| 64 | චන්ද්‍රලතා, ඒ. බී. | එම |
| *78 | චන්ද්‍ර වස්තු බණ්ඩාර, එස්. එම්. | එම |
| 84 | චාර්ල්ස් සිංඤෝ, පී. | එම |
| *86 | සිරිල්, පී. කේ. ජේ. | එම |
| 101 | දයාවතී, එම්. ඩබ්. | එම |
| 104 | ද සිල්වා, කේ. ඩී. | එම |
| *109 | ධනපාල, එස්. එම්. | එම |
| 118 | ධර්මවර්ධන, ඩබ්. එස්. | එම |
| 119 | ධර්මවංස, එස්. ආර්. | එම |
| *121 | ඩයස්, පී. ජී. සිරිල් | එම |
| 126 | දෙන්දීනු, ඩබ්. එල්. | එම |
| 131 | එදිරිසිංහ, ඩී. ජේ. | එම |
| 135 | ඒකනායක, ඊ. ඒ. එස්. | එම |
| 145 | ප්‍රනාන්දු, ඒ. ඇම්. | එම |
| 158 | ප්‍රනාන්දු, ඩබ්. ඒ. | එම |
| 161 | පොන්සේකා, පී. ඩී. ආර්. සී. | එම |
| 178 | ගුණදාස, එම්. ඩී. ඒ. | එම |
| 180 | ගුණපාල, කේ. ඩී. | එම |
| *186 | ගුණරත්හාමි, යූ. එල්. | එම |
| 194 | ගුණසේකර, එච්. එම්. ජේ. | එම |
| *203 | ගුණතුංග, ඊ. පී. | එම |
| *228 | හෙට්ටි ආරච්චි, එච්. ඒ. | එම |
| *239 | ජයකොඩි, ජේ. ඒ. | එම |
| 243 | ජයමාන්න, එස්. | එම |
| 251 | ජයසිංහ, ඩී. | එම |
| 263 | ජයතිලක, කේ. ජී. පී. ඩබ්. | එම |
| 268 | ජයවර්ධන, එන්. ටී. ජී. | එම |
| 277 | ජිනවරදාස, එම්. ඒ. ඩී. | එම |
| 284 | කල්දේරා, ආර්. කේ. ආර්. එෆ්. එන්. ඩබ්. | එම |
| *285 | කළුආරච්චි, ඩබ්. | එම |
| *294 | කරුණාජීව, ඩබ්. පී. ඇම්. | එම |
| 325 | කුමාරරත්න, එම්. කේ. එස්. පී. | එම |
| 331 | කුසුමාවතී, කේ. පී. කේ. | එම |
| *335 | ලැන්ටිස් අබේදීර, ඒ. | එම |
| *365 | මැන්දිස්, ඩබ්. ජේ. | එම |
| 384 | නානායක්කාර, එච්. පී. පී. | එම |
| 388 | නාවරත්න, ඩී. එච්. | එම |
| 390 | නිමලරත්න, එච්. ඒ. පී. | සිංහල |
| 399 | පතිරාජ, පී. ඇම්. ටී. | එම |
| 406 | පෙරේරා, බී. එස්. | එම |
| 415 | පෙරේරා, එම්. එස්. | එම |
| 432 | පීරිස්, කේ. එම්. ඩී. | එම |
| 445 | පියදාස, එන්. ඒ. ඩී. | එම |
| *446 | පියදාස, පී. වී. | එම |
| 449 | පියසීලි, එම්. ඩී. | එම |
| 452 | පියසේන ජී. ඩී. | එම |
| 461 | පොන්වීර, ජේ. බී. | එම |
| 467 | ප්‍රේමලතා, වයි. ආර්. ඒ. | එම |
| 469 | ප්‍රේමරත්න, ජී. | එම |
| 479 | පුංචිසිංඤෝ, පී. කේ. | එම |
| 483 | රාජකරුණා, එස්. | එම |
| 485 | රාජපක්ෂ සමරණායක, ඩී. පී. | එම |
| 493 | රණසිංහ, බී. | එම |
| *497 | රණසිංහ, ආර්. ඇම්. ටී. බී. | එම |
| 513 | රත්නවතී, යූ. | එම |
| 518 | සාමවතී, එම්. ඩී. | එම |
| *525 | සමරසේකර, ටී. ආර්. | එම |
| 527 | සමරසිංහ, ඊ. ඇල්. එම්. | එම |
| 530 | සමරසුන්දර, එස්. ඒ. පී. | එම |
| 531 | සමරතුංග, ඩී. | එම |
| *534 | සමරවීර, ඩබ්. | එම |
| *539 | සපුකොටන, ඒ. | එම |
| 551 | සේනාරත්න, ඩී. ජේ. | එම |
| 552 | සේනාරත්න, ඩී. එම්. | එම |
| 553 | සේනාරත්න, එස්. ඩී. ඩී. | එම |
| *555 | සෙනෙවිරත්න, ජේ. පී. | එම |
| *568 | සිල්වා, ඩබ්. ඒ. ජේ. ඊ. | එම |
| 569 | සිල්වීනු, ඩබ්. ඩී. | එම |
| *571 | සිම්යොන් සිංඤෝ, ඇස්. ඒ. | එම |
| *572 | සෝමසිරි සිරිපාල, ඩී. ඩී. | එම |
| 592 | සෝමපාල, ආර්. ඩී. | එම |
| 598 | සෝමාවතී, ආර්. ජී. | එම |
| 603 | සුබේහාමි, ඒ. ඩබ්. | එම |
| 627 | උඩකුඹුර, ඩී. | එම |
| 628 | උඩවත්ත, ඩී. ඩබ්. | එම |
| 644 | වීරසිංහ, සී. ඒ. | එම |
| 655 | වික්‍රමරත්න, කේ. එච්. එස්. | එම |
| 673 | විජේන්ද්‍ර, ඒ. | එම |
| 688 | විල්බට් සිල්වා, ඒ. | එම |
| 689 | විල්ප්‍රඩ්, ඩබ්. ඒ. | එම |

* නොතාරිස් ලිපිකරු.

රො. සමරසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

1969 ජනවාරි මස 12 දින,
කොළඹ රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලයේදීය.

1-830—69.1.24 දින අංක 14,838 දරන ගැසට් පත්‍රය

# ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම්

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව–වව්නියා උප කොටස

වවුනියා උප කොට්ඨාශයට අයත් පහත සඳහන් වැඩ සඳහා ටෙන්ඩර් අයදුම් පත් උතුරු කොට්ඨාශය භාර, වවුනියාවේ ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් 1969 පෙබරවාරි 18 වෙනි අඟහරුවාදා පෙරවරු 10.00 දක්වා බාරගනු ලැබේ. ටෙන්ඩර් විවෘත කිරීම එවෙලේම සිදුකෙරේ.

2. වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ රු. 50,000 කට නොඅඩු ගණනකට ලියාපදිංචි ඇති, ලාංකික වූ කොන්ත්‍රාත්කරුවන්, සමුපකාර සමිති හා ග්‍රාමසංවර්ධන සමිති පමණක් පහත සඳහන් වැඩ සඳහා ටෙන්ඩර් අයැදුම්පත් එවීමට සුදුස්සෝ වෙති.

| වැඩ විස්තරය | ටෙන්ඩර් ඇපමුදල | | දෙපාර්තමේන්තුව විසින් සපයන ද්‍රව්‍ය |
|---|---|---|---|
| කොත්තන්කුලම ඉදිකිරීම— | | | |
| | රු. | | |
| 1 වන කොටස—ටෙන්ඩර් අංක 1... | 100 | ... | සිමෙන්ති පමණයි |
| 2 වන කොටස—ටෙන්ඩර් අංක 2... | 100 | ... | නැත |

3. 1969.2.13 වන දිනතෙක් කාර්යාල වෙලාවන් තුලදී වවුනියාව, වවුනිකුලම, මුලතිව්, යාපනය, මන්නාරම යන වාරිමාර්ග ඉංජිනේරු කාර්යාලවලින් ලබා ගත හැකි පෝර්මවල ටෙන්ඩර් අයැදුම්පත් සකස් කළ යුතුයි. ටෙන්ඩර් පෝර්ම සඳහා ඉල්ලුම් කිරීමේ දී ඒ සඳහා ඉදිරිපත් වන ටෙන්ඩර් කරුවන් ඔවුන්ගේ ලියාපදිංචි පොත් හා දනට ඔවුන් දෙපාර්තමේන්තුවේ කරන වැඩ සහ ඒවායේ වටිනාකම් දක්වන ප්‍රකාශයන්, ඔවුන්ට ටෙන්ඩර් කිරීමට ඉඩ ලැබිය යුතුද නැද්ද යන්න සලකා බැලීම සඳහා වාරිමාර්ග ඉංජිනේරු තැන වෙත ඉදිරිපත් කළ යුතුය.

4. පෝර්ම නිකුත් කිරීමට ප්‍රථම ඉහත නියමිත කළ පරිදි තැන්පත් මුදලක් ඉහත සඳහන් වාරිමාර්ග කාර්යාලවල හෝ කච්චේරියක වාරිමාර්ග අධ්‍යක්ෂ වෙනුවෙන් තැන්පත් කර ඒ වෙනුවෙන් ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතුයි.

5. ඉහත සඳහන් පරිදි සිමෙන්ති පමණක් වවුනියාවේ දෙපාර්තමේන්තු මහා ගබඩාවෙන් සපයනු ලැබේ. මීට අමතරව වෙනත් උපකරණ සහ ද්‍රව්‍ය මේ වැඩ සඳහා සපයනු නොලැබේ.

6. මේ සඳහා වැඩි විස්තර වවුනියා උප කොට්ඨාශයේ වාරිමාර්ග ඉංජිනේරු කාර්යාලයෙන් කාර්යාල වේලාවන් තුලදී ලබාගත හැක.

එස්. ඕ. ජී. සෝමනාදර්,
වාරිමාර්ග ඉංජිනේරු,
වවුනියාව උප කොට්ඨාශ.

වවුනියාව, 1969.1.7.

1–818—69.1.24 දින අංක 14,838 දරන ගැසට් පත්‍රය

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

පානදුර බොල්ගොඩ වැඩ ඒකකයේ පහත සඳහන් වැඩ සඳහා ටෙන්ඩර් අයදුම් පත් 1969 පෙබරවාරි මස 11 වැනි අඟහරුවාදා පෙරවරු 11 දක්වා කොළඹ 5, ජාවත්ත පාරේ, බස්නාහිර කොටසේ ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් බාරගනු ලැබේ. ටෙන්ඩර් විවෘත කිරීම එවලේම සිදුකෙරේ.

2. පහත සඳහන් ඒ ඒ වැඩ අනුව සඳහන් කර ඇති ගණන්වලට වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වූ කොන්ත්‍රාත්කරුවන්ට, සමුපකාර සමිතිවලට සහ ග්‍රාම සංවර්ධන සමිතිවලට පමණක් මෙම වැඩ සඳහා අයදුම් පත් ඉදිරිපත් කළ හැක.

3. 1969 පෙබරවාරි 5 වැනි දින සිට 1969 පෙබරවාරි 8 වැනි දින දක්වා කායඪාල වේලාවන්හිදී පානදුර, බොල්ගොඩ වැඩ ඒකකයේ/කළුතර/කොළඹ/ගම්පහ හෝ රත්නපුර උප කොට්ඨාශවල වාරිමාර්ග ඉංජිනේරුවරුන්ගෙන් ලබාගත හැකි ටෙන්ඩර් පෝර්මවල ටෙන්ඩර් අයදුම්පත් සකස් කළ යුතුය. ටෙන්ඩර් පෝර්ම සඳහා ඉදිරිපත් වන ටෙන්ඩර් කරුවන් ඔවුන්ගේ ලියාපදිංචි පොත් සහ ඔවුන් දනට කරන වැඩ හා ඒවායේ වටිනාකම දක්වෙන ප්‍රකාශයක් ඔවුනට ටෙන්ඩර් කිරීමට ඉඩදිය යුතුද ? නැද්ද ? යන්න සලකා බැලීම සඳහා වාරිමාර්ග ඉංජිනේරු තැන වෙත ඉදිරිපත් කළ යුතුයි. පෝර්ම නිකුත් කිරීමට පෙර එකී වැඩ සඳහා පහත සඳහන් කර ඇති පරිදි ටෙන්ඩර් තැන්පත් මුදල් කළුතර/කොළඹ/ගම්පහ/රත්නපුර උප කොටස්වල වාරිමාර්ග ඉංජිනේරුවරුන්ගේ කායඪාලවලදී හෝ ඕනෑම කච්චේරියක තැන්පත් කොට ඒ වෙනුවෙන් ලබාගත් කුවිතාන්සිය 1969 පෙබරවාරි 8 වැනි දින හෝ ඊට පෙර කායඪාල වේලාවන් තුලදී ඉදිරිපත් කළ යුතුයි.

4. මෙම වැඩ ගැන සියළුම විස්තර, සැලසුම් ආදිය කායඪාල වේලාවන්හිදී පානදුර, බොල්ගොඩ වැඩ ඒකකයේ කායඪාලයෙන් ලබාගත හැක.

| වැඩයේ නම | කොන්ත්‍රාත්කරු ලියාපදිංචි විය යුතු ගණන | | | ටෙන්ඩර් තැන්පත් මුදල | |
|---|---|---|---|---|---|
| | රු. | ශ. | | රු. | ශ. |
| අළුත් ඇලේ 3 වැනි සැතපුම ප්‍රතිසංස්කරණය කිරීම සහ මඩ පස් ඉවත් කිරීම | 60,000 | 0 | ... | 100 | 0 |
| අළුත් ඇලේ 4 වැනි සැතපුම ප්‍රතිසංස්කරණය කිරීම සහ මඩ පස් ඉවත් කිරීම | 50,000 | 0 | ... | 100 | 0 |
| අළුත් ඇලේ 5 වැනි සැතපුම ප්‍රතිසංස්කරණය කිරීම සහ මඩ පස් ඉවත් කිරීම | 75,000 | 0 | ... | 100 | 0 |
| අළුත් ඇලේ 6 වැනි සැතපුම ප්‍රතිසංස්කරණය කිරීම සහ මඩ පස් ඉවත් කිරීම | 65,000 | 0 | ... | 100 | 0 |

වී. ඇම්. රාජකුරෙයි,
වාරිමාර්ග ඉංජිනේරු,
බොල්ගොඩ වැඩ ඒකකය, පානදුර.

පානදුර, 1968.12.29.

1–820—69.1.24 දින අංක 14,838 දරන ගැසට් පත්‍රය

---

## කච්චේරිය—වවුනියාව

### සංවර්ධන වැඩ

1969. 1. 9 වෙනි දින ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළකරන ලද ටෙන්ඩර් කැඳවීමේ දිනය අවසාන කාලසීමාව 1969 පෙබරවාරි මස 6 වන බ්‍රහස්පතින්දා දවල් 12 තෙක් දීර්ඝ කරන ලදී. 1969. 2. 5 වෙනි දින පස්වරු 3 තෙක් ටෙන්ඩර් පෝර්ම නිකුත් කරනු ලැබේ.

බී. සී. පෙරේරා,
වවුනියා දිස්ත්‍රික්කයේ දිසාපතී.

1969 ජනවාරි මස 15 වෙනි දින,
වවුනියාව කච්චේරියේ දී ය.

1–884—69.1.24 දින අංක 14,838 දරන ගැසට් පත්‍රය

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව—අම්පාර උප කොටස

පහත දැක්වෙන වැඩ කිරීම සඳහා ඉදිරිපත්කරනු ලබන ටෙන්ඩර් අයදුම්පත් 1969 පෙබරවාරි මස 18 වෙනි අඟහරුවාදා පෙරවරු 10.00 දක්වා මඩකළපුව නැගෙනහිර කොට්ඨාශයේ ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් භාරගනු ලැබේ. ටෙන්ඩර් විවෘත කිරීම එවලේම එහිදී සිදුකෙරේ.

2. වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ එම වැඩ ඉදිරියේ දක්වා ඇති අයුරු හෝ ඊට වැඩි ගණන් වලට ලියා පදිංචිවූ කොන්ත්‍රාත්කරුවන්ට, සමූපකාර සමිතිවලට හා ග්‍රාම සංවර්ධණ සමිති වලට පමණක් මෙම වැඩ සඳහා අයදුම්පත් ඉදිරිපත් කළහැක.

| | වැඩයේ නම | ලියාපදිංචිවූ ගණන රු. | කැන්පත් මුදල රු. |
|---|---|---|---|
| ඒ/13/68–69 | ගල්ඔය වම් ඉවුරේ නාමල්ඔය සයිපනයේ අළුත්වැඩියා කිරීම | 25,000 ... | 25 |
| ඒ/14/68–69 | ගල්ඔය වම් ඉවුරේ එල්. බී. ඇලේ අංක 15 ව ප්‍රකෘතිමත් කිරීම | 20,000 ... | 25 |

1969 පෙබරවාරි මස 12වෙනි බදාදා සවස 4.00 දක්වා අම්පාර කල්මුණ හා වෙන්කල්අඩි උප කොට්ඨාශයන්හි වාරිමාර්ග ඉංජිනේරුවරුන්ගේ කායඞාල යන්ගෙන් කායඞාල වේලාවන් තුළදී ලබාගත හැකි ආකෘති පත්‍රවල ටෙන්ඩර් අයදුම්පත් සකස් කොට එවිය යුතුය. ටෙන්ඩර් ආකෘති පත් සඳහා ඉල්ලුම් කිරීමේදී, ඒ සඳහා ඉදිරිපත්වන ටෙන්ඩර්කරුවන් ඔවුන්ගේ ලියාපදිංචිවීමේ පොත් සහ දනට ඔවුන් කරන දෙපාර්තමේන්තුවේ වැඩ සහ ඒවායේ වටිනාකම පිළිබඳව ප්‍රකාශයක් ඔවුන්ට ටෙන්ඩර් කිරීමට ඉඩ තිබේද යන්න සලකා බැලීම සඳහා වාරිමාර්ග ඉංජිනේරු තැන වෙත ඉදිරිපත් කළ යුතුය. ටෙන්ඩර් ආකෘති නිකුත් කිරීමට පෙර, වාරිමාර්ග ඉංජිනේරු තැනගේ කායඞාලයේ ඉහත සඳහන් ප්‍රකාර ටෙන්ඩර් තැන්පත් මුදල් තැන්පත් කළයුතුව ඇති අතර, එසේ නැතහොත් දිසාපති කායඞාලයක එවැනි තැන්පත් කිරීමක් කල බවට ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතුය.

3. මෙම ටෙන්ඩර් පිළිබඳව වැඩි විස්තර අම්පාර උප කොටසේ වාරිමාර්ග ඉංජිනේරු තැනගේ කායඞාලයෙන් කායඞාල වේලාවන් තුලදී ලබා ගත හැක.

ජී. එම්. චන්ද්‍රදාස,
වාරිමාර්ග ඉංජිනේරු තැන,
අම්පාර උප කොට්ඨාශය.

1969 ජනවාරි මස 7 වෙනි දින,
උප කොට්ඨාශ වාරිමාර්ග කායඞාලයේදීය,
අම්පාර.

1–812—69.1.24 දින අංක 14,838 දරන ගැසට් පත්‍රය

---

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

### ශීතකර කාමරයක් පිණිස ද්‍රව්‍ය සහ උපකරණ සැපයීම හා ඉදිකිරීම සඳහා ටෙන්ඩර්

ටෙන්ඩර් අංකය : **සී. ඊ. 686902.**

පහත සඳහන් ද්‍රව්‍ය සැපයීම සඳහා ටෙන්ඩර් 1969 මාර්තු මස 31 වෙනි දින ප. ව. 2.30 වන තෙක් පේරාදෙනියේ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් භාරගනු ලැබේ :—

ඒ. (1) දළ වශයෙන් අඩි 60× අඩි 60× අඩි 12ක ප්‍රමාණයේ පිටස්තර පරිමානයක් සහිත ශීත කාමරයක බිත්ති සහ සිලිම සඳහා සැකසුණු සම්පීඩනය කළ (Prefabricated stressed) ද්‍රව්‍ය.

(2) පැරන් හයිට් අංශක 35ක උෂ්ණත්වයක් නඩත්තු කල හැකි, අඩි 60× අඩි 60× අඩි 12 පරිමානයන්ගෙන් යුත් ශීත කාමරයක් සඳහා ශීතකර උපකරණ.

(3) යථෝක්ත කාමරය සඳහා තෙත් වායුමාපකයක්.

බී. සිතංඑළිය අල ගොවිපලේ, ගොඩනැගිල්ල ඉදිකිරීම හා ශීතකර යන්ත්‍රාගාරය, තෙත් වායු මාපකයක් යථාදිය ස්ථාපනය කිරීම.

2. ටෙන්ඩර් ඉදිරිපත් කල යුත්තේ පේරාදෙනියේ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය අධ්‍යක්ෂ (ඉංජිනේරු) තැනගෙන් ලබා ගත හැකි ආකෘති පත්‍රවලය.

3. ටෙන්ඩර් පිටපත් තුනකින් ඉදිරිපත් කල යුතු අතර, ඒවා අත්සන් කොට එකම කවරයක බහා ලියුම් කවරයේ වම් උඩ කෙලවරේ "ශීතකර කාමරයක් ඉදි කිරීම පිණිස ද්‍රව්‍ය හා උපකරණ සැපයුම—ටෙන්ඩර අංකය සී. ඊ. 686902" යන්න සඳහන් කොට පේරාදෙනියේ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිතුමා වෙත එවිය යුතුයි.

4. ගැසට් පත්‍රයේ මෙම දැන්වීම පලවන දින සිට සති හයක කාලයක් තුල ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කරනු ලැබේ. ඊට පසු ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු නොලැබේ. ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු ලබන්නේ රුපියල් 200 තැන්පත් කල බවට පේරාදෙනියේ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ හෝ ඕනෑම කච්චේරියක හෝ කොළඹ යෝක් වීදියේ ලංකා බැංකුවේ කෘෂිකර්ම අධ්‍යක්ෂකගේ අංක 37 දරණ ගිණුමට බැර කිරීමෙන් හෝ ඉදිරිපත් කරනු ලබන කුවිතාන්සියක් ඉදිරිපත් කලහොත් පමණි.

5. වැඩිමනත් විස්තර පේරාදෙනියේ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය අධ්‍යක්ෂ (ඉංජිනේරු) වෙතින් ලබා ගත හැක.

ඇල්. ආර්. ඇල්. පෙරේරා,
කෘෂිකර්ම අධ්‍යක්ෂ වෙනුවට.

69.1.16 වෙනි දින,
පේරාදෙනියේ,
කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේදීය.

1–975—69.1.24 දින අංක 14,838 දරන ගැසට් පත්‍රය

---

## ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව

### ට්‍රැක්ටර් 10ක් හා ට්‍රේලර් 10ක් ප්‍රන්ස නිෂ්පාදනයන්ගෙන් සැපයීම සඳහා

කොළඹ, එච්ලන් චතුරශ්‍රයේ, ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් පහත සඳහන් ට්‍රැක්ටර් සහ ට්‍රේලර් සැපයීම සඳහා ටෙන්ඩර් 1969.3.28 දින පෙරවරු 11 තෙක් භාර ගනු ලැබේ :—

**අවශ්‍ය ට්‍රැක්ටර් :**

| | | |
|---|---|---|
| අශ්ව බල ප්‍රමාණය 40—50 | ... | ට්‍රැක්ටර් 5 යි. |
| අශ්ව බල ප්‍රමාණය 60—70 | ... | ට්‍රැක්ටර් 5 යි. |
| ටොන් 5 හේ ට්‍රේලර් | ... | 10 යි. |

2. 1969.3.25 වෙනි දින දාවල් 12 තෙක් ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ තැනගෙන් ලබා ගත හැකි ටෙන්ඩර් පෝර්මයක අනු පිටපතකුත් සමග ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුයි.

3. කොළඹ, එච්ලන් චතුරශ්‍රයේ, ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවේදී 1969.3.28 වැනි දින පෙරවරු 11ට ටෙන්ඩර් විවෘත කරනු ලැබේ. කැමති ටෙන්ඩර්කරුවන්ට ඒ අවස්ථාවේදී පෙනී සිටිය හැක.

4. කිසියම් ප්‍රශ්න කිරීමක් නොමැතිව ටෙන්ඩරයක කොටසක් හෝ සම්පූර්ණයෙන්ම හෝ ප්‍රතික්ෂේප කිරීමේ හෝ ටෙන්ඩරයේ කොටසක් පිළි ගැනීමේ අයිතිය රජය සතුය.

5. වැඩි විස්තර සඳහා ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ තැන විමසන්න.

පී. රත්නසිංහම්
ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ වෙනුවට.

ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තු කාර්යාලය,
කොළඹ,
1969.1.15.

1–977—69.1.24 දින අංක 14,838 දරන ගැසට් පත්‍රය

## රාජකීය ලංකා ගුවන් හමුදාව

රාජකීය ලංකා ගුවන් හමුදා මධ්‍යස්ථානයේ චීනවරායේ අහස් යානා මාර්ගයේ කලින් මිශ්‍ර කරන ලද තාර දැමීම සඳහා ටෙන්ඩර් පත්‍ර 1969 පෙබරවාරි 14 වෙනි දින පෙරවරු 10 දක්වා කොළඹ 2 කේ, ශ්‍රීමත් චිත්තම්පලම් ගාර්ඩිනර් මාවතේ, තැ. පෙ. 594, රාජකීය ලංකා ගුවන් හමුදා මූලස්ථානයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තුමා විසින් භාරගනු ලැබේ.

2. කොළඹ 2 කේ, ශ්‍රීමත් චිත්තම්පලම් ගාර්ඩිනර් මාවතේ, රාජකීය ලංකා ගුවන් හමුදා මූලස්ථානයේ ප්‍රධාන වැඩ නිලධාරීන්ගෙන් ලබා ගන්නා ආකෘති පත්‍රවල පිටපත් දෙකක් සහිතව ටෙන්ඩර් පත් ඉදිරිපත් කළ යුතුයි. අවශ්‍ය විස්තර එතුමාගෙන් ලබා ගත හැක. 1969 පෙබරවාරි 13 වෙනි දින දහවල් 12 වනතුරු ටෙන්ඩර් පත්‍රිකා නිකුත් කරනු ලැබේ. අත්සන් කර පිටපත් දෙකකින් යුක්තව ඉදිරිපත් කළ යුතු ටෙන්ඩර් සීල් තබා, "රාජකීය ලංකා ගුවන් හමුදාවට අයත් චීනවරායේ අහස් යානා මාර්ගයේ කලින් මිශ්‍ර කරන ලද තාර දැමීම පිළිබඳ ටෙන්ඩර්" යනුවෙන් කවරයේ වම් පැත්තේ උඩ කෙළවරේහි ලියා, "සභාපති තැන. ටෙන්ඩර් මණ්ඩලය, රාජකීය ලංකා ගුවන් හමුදාව, තැ. පෙ. 594, කොළඹ", යන ලිපිනයට එවිය යුතුය.

3. පහත සඳහන් ලියකියවිලි ඉදිරිපත් කරන්නා වූද, ඒ හා සමාන වැඩ සඳහා රු. 7,00,000 කට නොඅඩු රජයේ කොන්ත්‍රාත්තු සම්බන්ධයෙන් ලියාපදිංචි වී සිටින ටෙන්ඩර්කරුවන් පමණක් ටෙන්ඩර් එවීමට සුදුස්සෝ වෙති :—

(අ) ලියා පදිංචි වීම ඔප්පු කිරීමට ලියවිලි සහ ;

(ආ) ආපසු ලබාගත හැකි රු. 250ක තැන්පත් ටෙන්ඩර් මුදලක් සඳහා සහ ආපසු ලබා ගත නොහැකි රු. 5 ටෙන්ඩර් ගාස්තු ගාස්තුවක් සඳහා කුවිතාන්සි ඉදිරිපත් කළ විට,

4. පහත සඳහන් අය ආපසු ගෙවන තැන්පත් මුදලෙන් නිදහස් වෙති :—

(අ) සමූපකාර තොග ගබඩා ආයතනය.

(ආ) වෙනත් ආණ්ඩුවල රජයේ වාණිජ සංස්ථා.
උදාහරණයක් වශයෙන් : චීනයේ ජාතික යන්ත්‍රෝපකරණ ආයතන සංස්ථාව ;

(ඉ) සමූපකාර සමිතිවල රෙජිස්ට්‍රාර් තැන විසින් පිළිගත් ග්‍රාම සංවර්ධන සමිති ;

(ඊ) සමූපකාර සමිතිවල රෙජිස්ට්‍රාර් තැන විසින් පිළිගත් සමූපකාර සමිති ;

5. ටෙන්ඩර් තැන්පත් මුදල හා ටෙන්ඩර් ගාස්තුව කොළඹ 2 කේ, ශ්‍රීමත් චිත්තලම්පලම් ගාඩිනර් මාවතේ, රාජකීය ලංකා ගුවන් හමුද මූලස්ථානයේ, සිවිල් පාලක හා ගණකාධිකාරි තැනට ගෙවිය යුතුය.

ඇම්. ඇස්. මාරුප්,
බලගත නායක,
ගුවන් හමුදාධිපති වෙනුවට.

1–899—69.1.24 දින අංක 14,838 දරන ගැසට් පත්‍රය

---

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

**සත්ව ගොවිපල්වලට ගොඩනැගිලි උපකරණ සැපයීම හා ගෙන ගොස් භාරදීම**

1968. 12. 27 දින අංක 14,834 දරණ ගැසට් පත්‍රයේ පළවූ දැන්වීමට අමතරවයි. ඉහත සඳහන් කාරණය පිළිබඳව ටෙන්ඩර් භාර ගැනීම 1969. 2. 3 වැනි දින පස්වරු 2.30 දක්වා කල් දමා ඇත. 1969. 2. 3 වැනි දින දවල් 12 තෙක් ටෙන්ඩර් ෆෝර්ම නිකුත් කරනු ලැබේ.

ඒ. බණ්ඩාරනායක,
නියෝජ්‍ය අධ්‍යක්ෂ.
(සත්ව පාලන හා සෞඛ්‍ය)

1969. 1. 12 වැනිදා,
කොළඹ 1, ඩියුක් වීදියේ,
සත්ව පාලන හා සෞඛ්‍ය කාර්යාලයේදී.

1–898—69.1.24 දින අංක 14,838 දරන ගැසට් පත්‍රය

---

## ගොවිජන සේවා දෙපාර්තමේන්තුව

කොළඹ, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවතේ අංක 42 ස්ථානයේ ගොවිජන සේවා දෙපාර්තමේන්තු ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින්, මරදානේ වියුනීසියා ගබඩාවට පහත සඳහන් හොඳ පරණ ගිස්ගෝනි සැපයීමට කැඳවනු ලබන ටෙන්ඩර් 1969 පෙබරවාරි 7 වැනි සිකුරාදා ප. ව. 2.30 වනතෙක් භාරගනු ලැබේ.

බුසල් 2½ (දෙකහමාරේ) ගෝනි 400,000 ක් හාල් මැනීමට.
බුසල් 3½ (තුනහමාරේ) ගෝනි 50,000 ක් වී මැනීමට.

2. කොළඹ ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ අංක 60 හෝර්ටන් පෙදෙස කාර්යාලයේ ගණකාධිකාරී තැනට හෝ දිවයිනේ කච්චේරියකට රු. 200 ක තැන්පත් මුදලක් ගෙවා ලබ ගන්නා ලද කුවිතාන්සියක් ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ අංක 42 ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවතේ කාර්යාලයේ නි. මී. යෝ. ක්‍රා. හා වී කෙ. අංශයට ඉදිරිපත් කර ටෙන්ඩර් පත් ලබාගෙන අනු පිටපතක්ද සහිතව පුරවා එවිය යුතුය. 1969 පෙබරවාරි 7 වැනි සිකුරාදා දවල් 12 වනතෙක් ටෙන්ඩර් පත් නිකුත් කරනු ලැබේ.

3. වැඩි විස්තර පහත සඳහන් කාර්යාලයෙන් හෝ වියනීසියා ගබඩාවේ සැපයීම් අංශයේ ගණකාධිකාරි තැනගෙන් විමසා දැනගත හැක.

ව්. තී. නවරත්න.
ගොවිජන සේවා කොමසාරිස් වෙනුවට.

1969 ජනවාරි 16 වැනිදා,
කොළඹ 7, තැ. පෙ. 537,
ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේදී.

1–881—69.1.24 දින අංක 14,838 දරන ගැසට් පත්‍රය

---

## කැලෑ දෙපාර්තමේන්තුව

චීන වරායේ, ශ්‍රී ලංකා වන විද්‍යාලයට කිලෝ වෝට්ස් 25 ක ජෙනරේටරයක් සපයා සවිකිරීම සඳහා ටෙන්ඩර් 1969 පෙබරවාරි මස 19 වෙනිදා පෙරවරු 10 දක්වා කොළඹ 2, කැලෑ දෙපාර්තමේන්තුවේ, ටෙන්ඩර් මණ්ඩල සභාපති විසින් බාරගනු ලැබේ.

2. 1969 පෙබරවාරි මස 19 වෙනිදා පෙරවරු 10 ට ටෙන්ඩර් විවෘත කරණ අවස්ථාවේදී, පැමිණ සිටීමට ටෙන්ඩර් කරුවන්ට අවසර දෙනු ලැබේ.

3. තමන්ගේ ටෙන්ඩර්පත් ලේඛනගත තැපෑලෙන් නොඑවන ටෙන්ඩර්කරුවන්, මුද්‍රා තැබූ ටෙන්ඩර්, කොළඹ 2, වන සංරක්ෂක ගේ කාර්‍යාලයේ, අංක 7 දරණ කාමරයේ සිටින, වන සංරක්ෂක ගේ කාර්‍යාල සහකාර. ජී. ජී. එන්. ද සිල්වා මහතාට 1969 පෙබරවාරි මස 19 වෙනිදා පෙරවරු 10 ට පෙර, පෞද්ගලිකව බාරදී, ඒ බවට ලියවිල්ලක් ලබාගත යුතුය.

4. ටෙන්ඩර්, කොළඹ 2, වන සංරක්ෂකගේ කාර්‍යාලයෙන් ලබා ගන්නා ආකෘතිපත්‍ර මත පිටපත් දෙකකින් සකස් කළ යුතුය. ටෙන්ඩර් පිළිබඳ විස්තර කොළඹ 2, වන සංරක්ෂකගේ කාර්යාල යෙන් ලබාගත හැක.

5. ඉල්ලුම් කිරීමට අදහස් කරණ. ලංකාවේ සිටින ටෙන්ඩර් කරුවන්, වන සංරක්ෂකගේ නමින් රු. 250 ක මුදලක් තැන්පත් කර ඒ වෙනුවෙන් වූ කුවිතාන්සියක් ඉදිරිපත් කර ටෙන්ඩර් ආකෘතිපත්‍ර ලබාගත යුතුය. ටෙන්ඩර් ආකෘතිපත්‍ර නිකුත් කරනු ලබන්නේ 1969 පෙබරවාරි මස 18 වෙනි අඟහරුවාදා පස්වරු 4.30 දක්වා පමණි.

6. ටෙන්ඩර් තැන්පත් මුදල්. කොළඹ 2 වන සංරක්ෂකගේ අංක 34 දරන ගිණුමට බැර කිරීම සඳහා. කොළඹ 1 යෝර්ක් වීදියේ, ලංකා බැංකුවේ හෝ ඕනෑම කච්චේරියක තැන්පත් කර කුවිතාන්සියක් ලබාගත යුතු අතර ටෙන්ඩර් ආකෘතිපත්‍ර ලබා ගැනීම සඳහා එය ඉදිරිපත් කළ යුතුයි.

ඒ. ජී. කේ. තිස්සවීරසිංහ.
වැඩ බලන වන සංරක්ෂක වෙනුවට.

තැ. පෙ. 509,
කොළඹ 2.
1969 ජනවාරි මස 14 දා.

1–897—69.1.24 දින අංක 14,838 දරන ගැසට් පත්‍රය

## කෘෂිකම් දෙපාතීමේන්තුව

### කුඩු ඉසිනයන් සහිත සහිත විදුලි බලයෙන් ක්‍රියා කරවන නැප් සැක් ස්ප්‍රේ යර් 10 ක් සඳහා ටෙන්ඩර් කැඳවීමයි

විදුලි බල ක්‍රියාකාරී නැප් සැක් ස්ප්‍රේ යර් යන්ත්‍ර 10 ක් කුඩු ද්‍රව්‍ය ඉසිනයන් සහිතව පහත සඳහන් අවශ්‍යතාවයන් අනුකූලව සිතාඑලියේ ගොවිපලේ කළමනාකාර තැන වෙත සැපයීම සඳහා ටෙන්ඩර් පත්‍ර පේරාදෙනියේ කෘෂිකම් අධ්‍යාපන සහ ගොවිපලවල් අංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 1969 පෙබරවාරි මස 25 වෙනි දින පස්වරු 2 වන තුරු භාරගනු ලැබේ.

> ඇන්ජින් යන්ත්‍රය ද්විත්ව ප්‍රහාරික ක්‍රියාකාරී බල වේග සහිත ඒකාබද්ධ සහ බර සැහැල්ලු වූ එකක් විය යුතුයි. මෙය සියලුම අවශ්‍ය අංගෝපාංගයන්ගෙන් යුතු සම්පූර්ණ නියම පරිදි ක්‍රියා කරන ඉසිනයන් ද ආයුධද මීට අදාල උපදෙස් මාලාව ඇතුලත් විය යුතුයි.

2. ටෙන්ඩර්කරුවන් ඔවුන්ගේ ටෙන්ඩර්වල මේ ඩස්ටර් සහිත ස්ප්‍රේ යර් යන්ත්‍ර පිළිබඳ සම්පූර්ණ විස්තර අඩංගු කළ යුතුයි. තෝරා ගත් ටෙන්ඩර්කරු තමා ඉදිරිපත් කරන යන්ත්‍රයේ ක්‍රියා කාරිත්වය සීතාඑලිය ගොවිපල කළමනාකාර තැන වෙත ප්‍රදර්ශනය කර දක්විය යුතුයි.

3. බණ්ඩාරවෙල ගොවිපල් පාලන හා නිෂ්පාදන කාර්යාලයේ පරිපාලන නිලධාරිගෙන් ලබා ගන්නා ලද ආකෘති පවත්‍රල සියලුම ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුය. සෑම ටෙන්ඩරයක්ම පිටපතකින් යුතුව අත්සන් තබා මුද්‍රා කරන ලද කවරවල බහා කවරයේ ඉහළ කෙළවරේ "කුඩු ඉසිනයන් සහිත බල වේග ක්‍රියාකාරී නැප් සැක් ස්ප්‍රේ යර් සැපයීමට ටෙන්ඩර්" යනුවෙන් සඳහන් කර ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති වෙත යැවිය යුතුය. කවරයේ පහත කෙළවරේ ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනය පැහැදිලිව සඳහන් විය යුතුය.

4. සෑම ටෙන්ඩරයකටම රුපියල් 50 ක් තැන්පත් කළ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට 1969 පෙබරවාරි මස 23 වන දින පෙ. ව. 10 වනතුරු ටෙන්ඩර් පත් නිකුත් කෙරේ. යම්කිසි කච්චේරියක හෝ පේරාදෙනියේ කෘෂිකම් දෙපාතීමේන්තුවේ හෝ කොළඹ යෝක් වීදියේ ලංකා බැංකුවේ අධ්‍යක්ෂකගේ අංක 37 දරන ගිණුමට හෝ මේ තැන්පත් කිරීම කළ හැකි වේ. බැංකුවේ තැන්පත් කරන විටද පොදු 118 ආකෘතිපත්‍රයේ මුදල් ගෙවීමේ තුණ්ඩුව පුරවා දිය යුතුය.

5. ටෙන්ඩර්පත්‍ර පේරාදෙනියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ තිබෙන ටෙන්ඩර් පෙට්ටියේ බහා ලීමට හෝ ලේඛනගත තැපෑලෙන් එවිය හැකිය.

6. ටෙන්ඩර් විවෘත කරන විටදී ටෙන්ඩර්කරුවන්ට කැමැති නම් පැමිණ සිටිය හැක. ටෙන්ඩර් භාර ගැනීමට නියමිත අවසන් දින හා වේලාවේ දී පේරාදෙනියේ කෘෂිකම් දෙපාතීමේන්තුවේදී ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ.

7. නියමිත ආකෘතිපත්‍රයේ ලියා නැති හෝ එහි නියමිත කොන්දේසි සපුරා නැති ටෙන්ඩර්පත් පිළිගනු නො ලැබේ. ටෙන්ඩර් ප්‍රමාණයන් හා ගණන් තීන්තෙන් පැහැදිලි ලෙස ලකුණු කළ යුතු පමණක් නොව ටෙන්ඩර්පතෙහි කෙරෙන වෙනස් කිරීම් වෙතොත් ඒ තැන් ටෙන්ඩර්කරුගේ කෙටි අත්සනද යෙදිය යුතුවේ. ටෙන්ඩර් කරන මිළ ගණන ඉලක්කමෙන් මෙන්ම අකුරෙන් ද ලියා තිබිය යුතුයි.

8. ටෙන්ඩර්කරුවන් ඔවුන් විසින් ඉදිරිපත් කොට ඇති මිළ ගණන් පිළිගැනීම සඳහා සති 4 ක් යනතුරු විවෘතව තබා ගත යුතු වෙයි.

9. ටෙන්ඩරය පිළිගත් බව දන්වා සති හතරක් ඇතුළත දී එය සපුරාලීමට අපොහොසත් වුවහොත් ඔහුගේ ටෙන්ඩර් තැන්පත් මුදල රාජසන්තක වනවා පමණක් නොව ඔහුගේ නම වැඩ පැහැර හරින කොන්ත්‍රාත් කරුවන්ගේ ලැයිස්තුවට ඇතුලත් වීමට ද ඉඩ තිබේ.

10. පේරාදෙනියේ කෘෂිකම් අධ්‍යාපන හා ගොවිපල් අංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් යම් කිසි ටෙන්ඩරයක් හෝ ටෙන්ඩරයකින් කොටසක් හෝ සියලුම ටෙන්ඩර් හෝ ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය තමා වෙත තබා ගන්නවා ඇත.

11. කොන්ත්‍රාත් කරුවන්ට භාර දිය යුතු සියලුම දැන්වීම් ඔහුගේ අතට දුනහොත්, හෝ ඔහු විසින් සඳහන් කර ඇති ලිපිනයට තැපෑලෙන් යැව්වොත් ඔහු අතටම භාර දුන්නා සේ සලකනු ලැබේ.

12. මේ සම්බන්ධව වැඩි විස්තර බණ්ඩාරවෙල ගොවිපල් පාලන හා නිෂ්පාදන කාර්යාලයේ පරිපාලන නිලධාරිගෙන් විමසන්න.

පී. ටී. ජිනේන්ද්‍රදාස,
නියෝජ්‍ය අධ්‍යක්ෂ,
(කෘෂි. අධ්‍යා. හා ගොවිපල).

1969. 1. 13 වැනි දින.

1–893—69.1.24 දින අංක 14,838 දරන ගැසට් පත්‍රය

---

මගේ අංකය : එල්. එම්. 1505

## මහනුවර දිස්ත්‍රික්කයේ තැනීම් වැඩ

මහනුවර දිස්ත්‍රික්කයේ පහත සඳහන් තැනීම් වැඩ සඳහා 1969 පෙබරවාරි 27 වැනි දින පස්වරු 2.30 දක්වා, කොළඹ, තැ. පෙ. අංක 500, ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් ටෙන්ඩර් පත් භාරගනු ලැබේ :—

| වැඩෙහි ස්වභාවය | ලියා පදිංචි විය යුතු මුදල |
|---|---|
| 1. පොරෝමාරුව ජනපද පාර දීර්ඝ කිරීම | රු. 20,000.00 |
| 2. ගෝමරේ ජලනල ව්‍යාපාරය | රු. 30,000.00 |

2. ඉහත සඳහන් වැඩ ඉදිරියෙන් සඳහන් කර ඇති ප්‍රමාණයට හෝ ඊට වැඩි ගණනකට රජයේ දෙපාර්තමේන්තුවල කොන්ත්‍රාත් කරුවන් වශයෙන් ලියා පදිංචි වී ඇති ග්‍රාම සංවර්ධන සමිති, කම්කරු සමිති සහ සමූපකාර සමිති වලට සහ ලියා පදිංචි වී ඇති කොන්ත්‍රාත් කරුවන්ට ද 1969 පෙබරවාරි මස 23 වැනි දින දවල් 12 තෙක් ටෙන්ඩර් ෆෝර්ම මහනුවර කච්චේරියෙන් නිකුත් කරනු ලැබේ.

3. ටෙන්ඩර් ෆෝර්ම අපේක්ෂකයන් විසින් මහනුවර කච්චේරියේ වැඩය වෙනුවෙන් රු. 100ක මුදලක් තැන්පත් කොට ලබා ගත් කුවිතාන්සියක් මහනුවර දිසාපති වෙත ඉදිරිපත් කළ විට ටෙන්ඩර් ෆෝර්ම නිකුත් කරනු ලැබේ. ග්‍රාම සංවර්ධන සමිති, කම්කරු සමිති හා සමූපකාර සමිති ටෙන්ඩර් ෆෝර්ම ලබා ගැනීමට මුදල් තැන්පත් කිරීම අනවශ්‍ය ය. චෙක්පත්, මුදල් ඇණවුම්, තැපැල් ඇණවුම් ආදිය භාරගනු නොලැබේ.

4. ටෙන්ඩර් ෆෝර්ම සම්පූර්ණකර පිටපත් දෙකකින් යුක්තව ලේඛනගත තැපෑලෙන් යැවිය යුතුයි. ටෙන්ඩර් බහා එවන කවරය මුද්‍රා තැබිය යුතු අතර කවරයේ වම් උඩ කෙළවරේ වැඩෙහි නම ලියා තිබිය යුතුයි. ටෙන්ඩර් ෆෝර්ම තැපෑලෙන් නො එවන්නේ නම් ගාළු මෝදර මහ ලේකම් කාර්යාලේ අංක 357 දරණ කාමරයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියෙහි තැන්පත් කල යුතුයි.

5. 1969 පෙබරවාරි මස 27 වැනි දින පස්වරු 2.30 ට ඉහත කී අංක 357 දරණ කාමරයේ දී ටෙන්ඩර් විවෘත කරනු ලැබේ.

6. මේ කොන්ත්‍රාත්තුව යටතේ වූ වැඩ කරවා ගැනීමට පුහුණු හා නුපුහුණු දෙවර්ගයේම ලාංකික කම්කරුවන් පමණක් යෙදවීමට එකඟ විය යුතු අතර එවැනි කම්කරුවන් හැකි තරම් දුරට බඳවා ගත යුත්තේ වැඩය කෙරෙන ප්‍රදේශයේ සිටින අය අතුරෙනි.

මේ කොන්ත්‍රාත්තුවේ කොන්දේසි සපුරාලීමට කොන්ත්‍රාත්කරු යම්කිසි විධියකින් අසමත් වුවහොත් කොන්ත්‍රාත්තුව අවලංගු කිරීමට එය තුඩු දෙනවා ඇත. එහෙත් කොන්ත්‍රාත්තුවට එළඹෙන ලද නිලධාරියා විසින් විශේෂ අවස්ථාවලදී ඉඩම් ව රි මාර්ග සහ විදුලි බලය පිළිබඳ අමාත්‍ය වරයාගේ එකඟත්වය ඇතිව නිශ්චිත ලිය විල්ලකින් එකී නිලධාරියා විසින් අනුමත කරන ලද ලාංකික නොවන කම්කරුවන් නියුක්ත කරවීමට කොන්ත්‍රාත්කරුට බලය දිය හැකිය.

එවැනි ලිඛිත බලයක් හා එකඟත්වයක් නොමැතිව ලාංකික නොවන කම්කරුවන් යෙදවීම තහනම් වන අතර එය කොන්ත්‍රාත්තුව කඩ කිරීමක් ලෙස සලකනු ලැබේ.

මෙම කොන්ත්‍රාත්තුවේ අභිප්‍රාය සඳහා "ලාංකික" සන්තෙන් පරම්පරාවේ හෝ ලියා පදිංචි කිරීමෙන් ලංකාවේ රටවැසියෙකු අදහස් කරන අතර එවැන්නක් එකී පාඨයට ඇතුලත් වේ.

මේ කොන්ත්‍රාත්තුවේ කටයුතු සඳහා යොදවනු ලබන සෑම කම්කරු කොට්ඨාශයකටම සාධාරණවූද කම්කරුවන්ට වේතන ගෙවීම සම්බන්ධයෙන් දැනට බලපවත්වන සහ මින්පසු ක්‍රියාත්මක විය හැකි සියළුම රෙගුලාසි වලට අනුකූලවූද වේතනයක් ගෙවීමට කොන්ත්‍රාත්කරු එකඟ විය යුතුයි.

කොන්ත්‍රාත්කරු විසින් එකී වැඩය කෙරෙහි යොදවනු ලැබූ කම්කරුවන් හා සම්බන්ධ ඔහුගේ පතපොත, චෙක්රෝල් පොත්, පෙරෙට්ටු පොත් සහ අනිකුත් ලිපි ලේඛන පරීක්ෂාකර බැලීමට ඉඩම් කොමසාරිස් විසින් විධිමත් පරිදි බලය දෙනු ලැබූ ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ ඕනෑම නිලධාරියෙකුට ඒවා පරීක්ෂා කිරීමට ඉඩ දීමට කොන්ත්‍රාත්කරු බැඳී සිටී.

7. ටෙන්ඩර්කරුවන්ට අවශ්‍ය වෙනත් තොරතුරු ඉල්ලුම් කළවිට මහනුවර දිසාපතිගෙන් ලබා ගත හැකිය.

ඇම්. බී. තෙන්නකෝන්,
මහනුවර දිසාපති වෙනුවට.

1969 ජනවාරි මස 10 වැනි දින,
මහනුවර කච්චේරියේ දීය.

1–891—69.1.24 දින අංක 14,838 දරන ගැසට් පත්‍රය

## ගොවිජන සේවා දෙපාර්තමේන්තුව

### මණින පටි සහ මණින දම්වැල් සැපයීම සඳහා ටෙන්ඩර්

කොළඹ ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවතේ අංක 42 ස්ථානයේ ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 1969 පෙබරවාරි 25 වෙනි අඟහරුවාදා පෙ. ව. 10 වනතෙක් අඩි 50 මණින පටි 500 ක් හා අඩි 100 මණින දම්වැල් 250ක් සැපයීම සඳහා ටෙන්ඩර් භාරගනු ලැබේ.

කොළඹ 7 ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ අංක 60, හෝර්ටන් පෙදෙසේ ගණකාධිකාරී වෙත රු. 50 ක ටෙන්ඩර් තැන්පත් මුදලක් ගෙවා ලබා ගත් කුවිතාන්සියක් කොළඹ 10, මරදාන දුම්රියංගනයේ විදුලිබල මධ්‍යම ගබඩාවේ ගණකාධිකාරී වෙත ඉදිරිපත් කොට ලබා ගත හැකි ටෙන්ඩර පෝර්මවල පිටපත් දෙකකින් යුක්තව සියලුම ටෙන්ඩර ඉදිරිපත් කල යුතුවේ.

ටෙන්ඩර් පෝර්ම 1969 පෙබරවාරි 22 වැනි දින ප. ව. 4 දක්වා නිකුත් කරනු ඇත.

වැඩිවිස්තර විදුලිබල මධ්‍යම ගබඩාවේ ගණකාධිකාරී වෙතින් ලබා ගත හැක.

වී. ඊ. තම්රත්න,
ගොවිජන සේවා කොමසාරිස් වෙනුවට.

ගොවිජන සේවා දෙපාර්තමේන්තුව,
විදුලිබල මධ්‍යම ගබඩාව,
තැ. පෙ. 1506, කොළඹ 10,
1968.12.3.

1–913—69.1.24 දින අංක 14,838 දරන ගැසට් පත්‍රය

---

## ග්‍රාම සංවර්ධන හා කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව

1969.1.9 දින පළවූ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළවූ රේයෝන් නූල් සැපයීම සඳහා අවසාන දිනය 1969 අප්‍රේල් 17 දින නොව 1969 පෙබරවාරි 25 දින වේ.

පී. එච්. පී. ද සිල්වා,
ග්‍රාම සංවර්ධන හා කුඩා කර්මාන්ත අධ්‍යක්ෂක.

යොමුව : සීඒ/සී/25/44 (1/69)
ග්‍රාම සංවර්ධන හා කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව,
කොළඹ 7. 1969.1.15.

1–900—69.1.24 දින අංක 14,838 දරන ගැසට් පත්‍රය

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

### මොණරාගල උප කොටස

මොණරාගල උප කොටසේ "වාන හා පිවිසුම් පාර තැනීම—කිවුල් වැව ප්‍රතිසංස්කරණය කිරීම" සඳහා ටෙන්ඩර්පත්‍ර 1969 පෙබරවාරි මස 26 වෙනි බදාදා පෙරවරු 10 වන තෙක් බණ්ඩාරවෙල ඌව කොට්ඨාශයේ ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් භාරගනු ලැබේ.

2. වාරි මාර්ග දෙපාර්තමේන්තුවේ රුපියල් 30,000 හෝ ඊට වැඩි මුදලකට ලියාපදිංචි වී ඇති කොන්ත්‍රාත්කරුවන්ට, සමුපකාර සමිතිවලට, හා ග්‍රාම සංවර්ධන සමිතිවලට පමණක් මෙම වැඩය සඳහා ටෙන්ඩර් ඉදිරිපත් කළ හැක. 1969 පෙබරවාරි මස 22 වෙනි දින දහවල් 12 දක්වා කාර්යාලීය වේලාවන් තුළදී මොණරාගල, බදුල්ල සහ මහියංගණය යන වාරිමාර්ග ඉංජිනේරුවරුන්ගේ කාර්යාලවලින් ලබාගත හැකි පෝරමවල ටෙන්ඩර් අයදුම්පත් සකස් කළ යුතුයි. ටෙන්ඩර් පෝරම කොළ ඉල්ලුම් කිරීමේදී ඒ සඳහා ඉදිරිපත් වන ටෙන්ඩර්කරුවන් ඔවුන්ගේ ලියාපදිංචි වාර්තා පොත් හා දැනට ඔවුන් කරන වාරිමාර්ග වැඩ හා ඒවායේ වටිනාකම දක්වෙන ප්‍රකාශනයක් ඔවුනට ටෙන්ඩර් කිරීමට ඉඩ දිය යුතුද නැද්ද යන්න ගැන සලකා බැලීම සඳහා වාරිමාර්ග ඉංජිනේරුතැන වෙත ඉදිරිපත් කළ යුතුයි. පෝරම නිකුත් කිරීමට පෙරාතුව මෙම වැඩය වෙනුවෙන් රුපියල් 50 ක (පනහක) ටෙන්ඩර් තැන්පත් මුදලක් වාරිමාර්ග ඉංජිනේරුතැනගේ කාර්යාලයේ හෝ ඕනෑම කච්චේරියක තැන්පත් කොට ඒ වෙනුවෙන් ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතුයි.

3. මෙම වැඩය ගැන සියළුම විස්තර කාර්යාලීය වේලාවන් තුළදී මොණරාගල උප කොටස භාර වාරිමාර්ග ඉංජිනේරුතැනගෙන් ලබා ගත හැකියි.

ඒ. එෆ්. මහගමගේ,
වාරිමාර්ග ඉංජිනේරු,
මොණරාගල උප කොටස.

1969 ජනවාරි 12 වෙනි දින,
මොණරාගල වාරිමාර්ග කාර්යාලයේ දීය.

1–902—69.1.24 දින අංක 14,838 දරන ගැසට් පත්‍රය

---

## රජයේ වැඩ දෙපාර්තමේන්තුව

මහව, පොලිස් මහෙස්ත්‍රාත් නිවාසය තැනීම සඳහා වූ ටෙන්ඩර් පත්, කොළඹ 1, ර. වැ. දෙ. ප්‍රධාන කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිවරයා විසින් වර්ෂ 1969 පෙබරවාරි මස 19 වැනි බදාදා පෙරවරු 11 වන තෙක් භාරගනු ලැබේ.

2. මහව, රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ විධායක ඉංජිනේරුවරයාගෙන් ලබාගත් ආකෘති පත්වල ටෙන්ඩර් පත් පිළියෙල කොට අනු පිටපතක්ද සහිතව ඉදිරිපත් කළ යුතුයි. මේ පිළිබඳ සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබා ගතහැකි වන අතර, සැලැස්මද ඔහුගේ කාර්යාලයේදී බලා ගැනීමට පිළිවන.

3. ර. වැ. දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රුපියල් 1,10,000 කට නොඅඩු ගණනකට ලියා පදිංචිවූ කොන්ත්‍රාත්කරුවන් පමණක් ඉහත සඳහන් ඉංජිනේරුවරයා වෙත ටෙන්ඩර් පත් තැන්පත් මුදල වන රු. 200 ක් තැන්පත් කර ලබා ගත් කුවිතාන්සිය වර්ෂ 1969 පෙබරවාරි මස 7 වෙනි සිකුරාදා පස්වරු 4.30 ට පෙර ඉදිරිපත් කළ විට මේ සඳහා ටෙන්ඩර් පත් එවීමට සුදුසු වනවා ඇත. ටෙන්ඩර් පත් සඳහා ප්‍රමාද වී අයදුම් කරන්නන් විසින් එක් දිනකට හෝ ඉන් අඩකට රු. 10 බැගින් ආපසු ගෙවනු නොලබන පමාවීමේ ගාස්තුවක් නිකුත් කරන නිලධාරි තැනට ගෙවා ඒ සඳහා කුවිතාන්සියක් ලබාගත යුතුයි.

4. ටෙන්ඩර් පත් නිකුත් කිරීමට පෙර අයදුම්කරු විසින් කොන්ත්‍රාත්කරුගේ සටහන් පොත හෝ පිරික්සුම් ලිපිය ඉදිරිපත් කළ යුතුවේ.

5. ටෙන්ඩර් ලබාගැනීමට බලාපොරොත්තුවන අය, ටෙන්ඩර් තැන්පත් මුදල් කුවිතාන්සිය ඉදිරිපත් කරන අවස්ථාවේදී, දැනට කරගෙන යන වැඩ පිළිබඳ සියලු විස්තර අඩංගු කළ යුතු ආකෘති පත්‍ර, නිකුත් කරන නිලධාරියාගෙන් ලබාගෙන නියමිත ටෙන්ඩර් මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතුය.

6. ටෙන්ඩර් තැන්පත් මුදල කොළඹ කොටුවේ ර. වැ. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේදී හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියකදී හෝ තැන්පත් කළ හැක.

ටී. ගුණරත්නම්,
රජයේ වැඩ අධ්‍යක්ෂ වෙනුවට.

ර. වැ. දෙ. ප්‍රධාන කාර්යාලය, කොළඹ 1.,
1969. 1. 16.

1–878—69.1.24 දින අංක 14,838 දරන ගැසට් පත්‍රය

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව–කුරුණෑගල උප කොට්ඨාශය

කුරුණෑගල උප කොට්ඨාශයේ පහත සඳහන් ඉදිකිරීම් වැඩ සඳහා ටෙන්ඩර් පත් 1969.2.18 වෙනි අඟහරුවාදා පෙ.ව. 10 දක්වා කුරුණෑගල වයඹ කොට්ඨාශයේ ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් භාරගනු ලැබේ. ටෙන්ඩර් විවෘත කිරීම එවෙලේම එහිදී සිදු කෙරේ.

| | වැඩ විස්තරය | | කොන්ත්‍රාත්කරුගේ ලියාපදිංචි මුදල රු. | | ටෙන්ඩර් තැන්පත් මුදල රු. |
|---|---|---|---|---|---|
| 1. | මාරපහඹිය අමුණ ඉදි කිරීම | ... | 35,000 | ... | 50 |
| 2. | මොරාත් ඔය අමුණ ඉදි කිරීම | ... | 35,000 | ... | 50 |
| 3. | කදිරගල ඇල හරහා මුවන්වැල්ලේ අමුණ | | 25,000 | ... | 25 |
| 4. | කොසපොතුඔය හරහා වැලිකුඹුර අමුණ | ... | 35,000 | ... | 50 |
| 5. | කොසපොතුඔය ඇලවල් සැ.0 සිට සැ. 1 | ... | 30,000 | ... | 50 |
| 6. | කොසපොතුඔය ඇලවල් සැ. 1 සිට සැ. 2 | | 25,000 | ... | 25 |
| 7. | කොසපොතුඔය ඇලවල් සැ. 2 සිට සැ. 2 අඩි 4,050 දක්වා. | | 35,000 | ... | 50 |

2. වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ඉහතින් දක්වෙන ප්‍රමාණයට ලියාපදිංචිවූ කොන්ත්‍රාත්කරුවන්ට, සමුපකාර සමිති හා ග්‍රාම සංවර්ධන සමිති වලට පමණක් මෙම වැඩය සඳහා ටෙන්ඩර් අයදුම් පත් ඉදිරිපත් කළ හැකිය.

3. 1969.2.14 වෙනි සිකුරාදා (එදින ඇතුළුව) කාර්යාල වේලාව තුළදී කුරුණෑගල/නිකවැරටිය/පුත්තලම උප කොට්ඨාශ භාර වාරිමාර්ග ඉංජිනේරු තැනගේ කාර්යාලයෙන් ලබාගත හැකි ආකෘතිපත් වල ටෙන්ඩර් අයදුම් පත් සකස් කළ යුතුයි. ටෙන්ඩර් ආකෘති පත්‍ර සඳහා ඉල්ලුම් කිරීමේදී ඒ සඳහා ඉදිරිපත්වන ටෙන්ඩර්කරුවන් ඔවුන්ගේ ලියාපදිංචි පොත් සහ ඒවායේ වටිනාකම දක්වෙන ප්‍රකාශනයක් ඔවුනට ටෙන්ඩර් කිරීමට ඉඩ ලැබිය යුතුද ? නැද්ද ? යන්න සළකා බැලීම සඳහා වාරිමාර්ග ඉංජිනේරු තැන වෙත ඉදිරිපත් කළ යුතුය. ටෙන්ඩර් ආකෘති පත් නිකුත් කිරීමට ප්‍රථම ඉහත දක්වෙන ප්‍රමාණවලට ටෙන්ඩර් තැන්පත් මුදල් වාරිමාර්ග ඉංජිනේරුතැනගේ කාර්යාලයේ හෝ ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කොට ඒ වෙනුවෙන් කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතුය.

4. මෙම ටෙන්ඩරය ගැන සියළුම විස්තර, ගිවිසුම, වැඩය පිළිබඳ සැළසුම, විශේෂ විස්තර යනාදිය කාරයාල වෙලාවන් තුළදී කුරුණෑගල උප කොටසේ වාරිමාරග ඉංජිනේරු තැනගෙන් ලබාගත හැක.

එල්. හරිදාස,
වාරිමාරග ඉංජිනේරු,
කුරුණෑගල උප කොට්ඨාශය.

1969 ජනවාරි මස 10 වෙනි දින,
කුරුණෑගල වාරිමාර්ග කාරයාලයේ දීය.

1–839—69.1. 24 දින අංක 14,838 දරන ගැසට් පත්‍රය

---

## රජයේ විදුලිය දෙපාර්තමේන්තුව

### ත්‍රිකුණාමලය රෝහලේ සූතිකාගාර වාට්ටුව සඳහා ඇඳන් ගෙන යන විදුලි සෝපානයක් සපයා ඉදිකිරීම

රජයේ විදුලි දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කළමනාකාර තැන වෙත ඉහත සඳහන් කාර්යය භාර ගැනීම සඳහා ටෙන්ඩර් පත්‍ර වර්ෂ 1969 ක්‍රි වූ මාර්තු මස 19 වන බදාදා පූ. භා. 10 දක්වා රජයේ විදුලි දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන (තැ. පෙ. 540, කොළඹ) විසින් භාර ගනු ලැබේ.

2. ටෙන්ඩර් පත්‍ර සම්බන්ධව ලියකියවිලි කොළඹ පාසන්ස් පාරේ පිහිටි කොන්ත්‍රාත් හා සැපයීම් භාර විදුලි ඉංජිනේරු තැනගේ කාර්යාලයෙහිදී කියවා බලා ගත හැක. ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කිරීමට අදහස් කරන් අයවලුන් විසින් රු. 100 ක මුදලක් ටෙන්ඩර් තැන්පත් මුදල වශයෙන් ද, රු. 5 ක මුදලක් ටෙන්ඩර් ෆෝරම සැපයීමේ ගාස්තුව වශයෙන් ද, රජයේ විදුලි දෙපාර්තමේන්තුවේ සරප් තැන වෙත ගෙවා ලබාගත් කුවිතාන්සි කොන්ත්‍රාත් හා සැපයීම් භාර විදුලි ඉංජිනේරු තැන වෙත ඉදිරිපත් කළ විට ටෙන්ඩර් ෆෝරම නිකුත් කරනු ලැබේ. ටෙන්ඩර් ෆෝරම සැපයීමේ ගාස්තුව වන රු. 5හේ මුදල ආපසු ගෙවනු නොලැබේ. ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 100 ටෙන්ඩර් කොන්දේසි උඩ ආපසු ගෙවනු ලැබේ.

3. ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කළ යුත්තේ ඉහත කී අයුරු ලබාගත් ටෙන්ඩර ෆෝරම්වලය. වර්ෂ 1969 ක්‍රි වූ මාර්තු මස 16 වන දින දවල් 2 වන තෙක් ටෙන්ඩර් ෆෝරම නිකුත් කරනු ලැබේ.

4 වෂී 1969 ක්‍රි වූ මාර්තු මස 19 වන බදාදා පූ. භා. 10 ට රජයේ විදුලි දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැනගේ කාර්යාලයෙහිදී ටෙන්ඩර් පත්‍ර විවෘත කරන අවස්ථාවේදී ටෙන්ඩර් කරුවන්ට පෙනී සිටීමට අවසර ඇත.

ඇම්. අයි. අසීස්,
රජයේ විදුලි දෙපාර්තමේන්තුවේ
වැ. බ. ප්‍රධාන කළමනාකාර තැන.

තැ. පෙ. 540,
කොළඹ,
1969 ක්‍රි වූ ජනවාරි මස 24 වෙනි දින දීය.

1–819—69.1.24දින අංක 14,838 දරන ගැසට් පත්‍රය

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව—මාතලේ උප කොට්ඨාශය

මධ්‍යම කොට්ඨාශය භාර නත්තරම්පොත, කුණ්ඩසාලේ වාසී ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තුමා විසින් මාතලේ උප කොට්ඨාශයේ පහත සඳහන් වැඩ සඳහා ටෙන්ඩර් අයදුම්පත් 1969 පෙබරවාරි 12 වැනි බදාදා පෙ. ව. 10 දක්වා භාරගනු ලැබේ. ටෙන්ඩර් විවෘත කිරීම එවෙලේම එහිදී සිදු කෙරේ.

2. මෙම දෙපාර්තමේන්තුවේ පහත සඳහන් වැඩ වෙනුවෙන් ඒ ඒ ගණන් වලට හෝ ඊට වැඩි ගණන් වලට ලියාපදිංචි වී ඇති කොන්ත්‍රාත්කරුවන්ට, සමුපකාර සමිතිවලට හා ග්‍රාම සංවර්ධන සමිතිවලට පමණක් මෙම වැඩ සඳහා අයදුම්පත් ඉදිරිපත් කල හැක.

| | වැඩෙහි නම | ලියාපදිංචි විය යුතු මුදල රු. | ශ. | | ටෙන්ඩර් තැන්පත් මුදල රු. | ශ. |
|---|---|---|---|---|---|---|
| 1. | මාතලේ කාර්මික සහකාර නිවාසයක් ඉදි කිරීම | 33,000 | 0 | ... | 50 | 0 |
| 2. | දඹුල්ලේ කාර්මික සහකාර නිවාසයක් ඉදි කිරීම | 33,000 | 0 | ... | 50 | 0 |
| 3. | වැවතැන්න වැවේ සොරොව්ව සහ වාන ඉදි කිරීම | 20,000 | 0 | ... | 25 | 0 |

3. 1969 පෙබරවාරි 3 වෙනි දින සිට 1969 පෙබරවාරි 11 වෙනි දින දක්වා කාලය තුලදී සාමාන්‍ය කාර්යාල වේලාවන්හිදී මාතලේ, මහනුවර, හසලක සහ නුවරඑළිය උප කොට්ඨාශ භාර වාරිමාර්ග ඉංජිනේරු කාර්යාල වලින් ලබාගත හැකි ෆෝරම්වල ටෙන්ඩර් අයදුම්පත් සකස් කල යුතුය. ටෙන්ඩර් ෆෝරම සඳහා ඉල්ලුම් කිරීමේදී ඒ සඳහා ඉදිරිපත්වන ටෙන්ඩර් කරුවන් ඔවුන්ගේ ලියාපදිංචි පොත් සහ දනට ඔවුන් කරන වාරිමාර්ග වැඩ සහ ඒවායේ වටිනාකම දක්වෙන ප්‍රකාශයක්, ඔවුන්ට ටෙන්ඩර් කිරීමට ඉඩදිය යුතුද නැද්ද යන්න සලකා බැලීම සඳහා වාරිමාර්ග ඉංජිනේරු තැන වෙත ඉදිරිපත් කල යුතුය. ෆෝරම කොල නිකුත් කිරීමට පෙර ඉහත සඳහන් ගණන්වලට ටෙන්ඩර් තැන්පත් මුදල් වාරිමාර්ග ඉංජිනේරු තැනගේ කාර්යාලයේ හෝ ඕනෑම කච්චේරියක තැන්පත් කොට ඒ වෙනුවෙන් ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කල යුතුය.

4. සමුපකාර සමිති හා ග්‍රාම සංවර්ධන සමිති ටෙන්ඩර් ෆෝරම ලබා ගැනීම සඳහා මුදලක් තැන්පත් කිරීම අනවශ්‍යය.

5. මේ ටෙන්ඩර් සඳහා සියලු විස්තර කාර්යාල වේලාවන් තුළදී මාතලේ වාරිමාර්ග ඉංජිනේරු තැනගේ කාර්යාලයෙන් ලබාගත හැක.

සී. කනගලිංගම්,
වාරිමාර්ග ඉංජිනේරු, මාතලේ.

1969 ජනවාරි මස 13 වැනි දින,
මාතලේ වාරිමාර්ග කාර්යාලයේදීය.

1–976—69.1.24 දින අංක 14,838 දරන ගැසට් පත්‍රය

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

### ගරාජ් සහ අළුත්වැඩියා උපකරණ සැපයීම සඳහා ටෙන්ඩර්

පහත සඳහන් විෂයයන් සැපයීම සඳහා ටෙන්ඩර් 1969 මාර්තු මස 31 වෙනි දින ප. ව. 2.30 වන තෙක් පේරාදෙනියේ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් භාරගනු ලැබේ.

| ටෙන්ඩර් අංකය | විෂයය අංකය | සේවාව | ටෙන්ඩර් තැන්පත් මුදල රු. | ශ. |
|---|---|---|---|---|
| ඇම්එස්. 686947 ... | 1 ... | පෝටබල් අ-වැල්ඩින් ප්ලාන්ට 6 යි | 20 | 0 |
| එම ... | 2 ... | වැල්ඩින් ට්‍රාන්ස්පෝමර් ඕf්2 30 වොල්ට් මෙයින්ස් 6 යි ... | 20 | 0 |
| එම ... | 3 ... | එයර් කොම්ප්‍රෙෂර් යුනිට්ස් 10 යි | 20 | 0 |
| එම ... | 4 ... | ඔක්සිජන් සහ ඇක්ටෙලින් සෙට්ස් 10 යි | 20 | 0 |
| එම ... | 5 ... | ඔක්සිජන් සහ ඇසෙටලින් සිලින්ඩර්ස් සඳහා රෙගුලේටර්ස් ටැප්ස් 10 යි | 10 | 0 |
| එම ... | 6 ... | ස්ප්‍රේ පෙයින්ටින් යුනිට්ස් 10 යි ... | 20 | 0 |
| එම ... | 7 ... | විදුලි බලයෙන් ක්‍රියාකරන වොල් කනයිසින් යුනිට්ස් 10 යි ... | 20 | 0 |
| එම ... | 8 ... | උෂ්නත්වයෙන් ක්‍රියාකරන වොල් කනයිසින් යුනිට්ස් 10 යි ... | 20 | 0 |
| එම ... | 9 ... | ෂීට් කටින් මැෂින් 2 යි ... | 20 | 0 |
| එම ... | 10 ... | පෝර්මින් මැෂින් 2 යි ... | 20 | 0 |

2. ටෙන්ඩර් ඉදිරිපත් කල යුත්තේ පේරාදෙනියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය අධ්‍යක්ෂ (ඉංජිනේරු) තැනගෙන් ලබාගත් හැකි ආකෘති පත්‍ර වලය.

3. ටෙන්ඩර් පිටපත් තුනකින් ඉදිරිපත් කල යුතු අතර, ඒවා අත්සන් කොට එකම කවරයක බහා මුද්‍රා තබා ලියුම් කවරයේ වම් උඩ කෙළවරේ "ගරාජ් සහ අළුත් වැඩියා උපකරණ සඳහා ටෙන්ඩර්—ටෙන්ඩර් අංක ඇම්. එස්. 686947—විෂයය ........" යන්න සඳහන් කොට පේරාදෙනියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තුමා වෙත එවිය යුතුයි.

4. ගැසට් පත්‍රයේ මෙම දැන්වීම පලවන දින සිට සති හයක කාලයක් තුල ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කරනු ලැබේ. ඊට පසු ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු නොලැබේ. ටැන්ඩර් පත් නිකුත් කරනු ලබන්නේ ඉහත සඳහන්ව ඇති එක් එක් විෂයයක් සම්බන්ධයෙන් නියමිත ටෙන්ඩර් තැන්පත් මුදල් පේරාදෙනියේ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ හෝ ඕනෑම කච්චේරියක හෝ කොළඹ යෝර්ක් වීදියේ ලංකා බැංකුවේ කෘෂිකර්ම අධ්‍යක්ෂකගේ අංක 37 දරණ ගිණුමට බැර කිරීමෙන් හෝ ඉදිරිපත් කරනු ලබන කුවිතාන් සියක් ඉදිරිපත් කලහොත් පමණි.

5. වැඩිමනත් විස්තර පේරාදෙනියේ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ, නියෝජ්‍ය අධ්‍යක්ෂ (ඉංජිනේරු) වෙතින් ලබා ගත හැක.

ඇල්. ආර්. ඇල්. පෙරේරා,
කෘෂිකර්ම අධ්‍යක්ෂ වෙනුවට.

1969 ජනවාරි මස 16 වැනි දින,
පේරාදෙනියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේදීය.

1-894—69.1.24 දින අංක 14,838 දරන ගැසට් පත්‍රය

---

## රජයේ වැඩ දෙපාර්තමේන්තුව

වටවල බෙනච්චි කන්දේ වී. එච්. එෆ්. ගොඩනැගිල්ලට ඩීසල් ඇන්ජින් කාමරයක් තැනීම සඳහාවූ ටැන්ඩර් පත් මහනුවර රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ අධිකාරි ඉංජිනේරු කායභාලයේ ටැන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් වෂී 1969ක්වූ පෙබරවාරි මස 14 වැනි සිකුරාදා පෙරවරු 10.30 වන තෙක් භාරගනු ලැබේ.

2. රජවත්ත රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ විධායක ඉංජිනේරුවරයාගෙන් ලබාගත් ආකෘති පත්වල ටැන්ඩර් පත් පිළියෙලකොට අනු පිටපත්ද සහිතව ඉදිරිපත් කළ යුතුයි. මේ පිළිබඳ සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබාගත හැකි අතර සැලැස්මද ඔහුගෙන් බලා ගත හැක.

3. ර.වැ.දෙ. ගොඩනැගිලි වැඩ සඳහා රු. 20,000ට නොඅඩු ගණනකට ලියාපදිංචි වූ කොන්ත්‍රාත් කරුවන් පමණක් ඉහත සඳහන් ඉංජිනේරුවරයා වෙත ටැන්ඩර් පත් තැන්පත් මුදල වන රු. 25ක් තැන්පත් කර ලබා ගත් කුවිතාන්සිය 1969.2.7 වැනි දින පස්වරු 4.30ට පෙර ඉදිරිපත් කළවිට මේ සඳහා ටැන්ඩර්පත් එවීමට සුදුසුවනවා ඇත. ටැන්ඩර්පත් සඳහා ප්‍රමාදවී අයදුම් කරන්නන් විසින් එක් දිනකට හෝ ඉන් අඩකට රු. 10 බැගින් ආපසු ගෙවනු නොලබන පමාවීම් ගාස්තුවක් නිකුත්කරන නිලධාරි තැනට ගෙවා ඒ සඳහා කුවිතාන්සියක් ලබා ගත යුතුය.

4. ටැන්ඩර් පත් නිකුත් කිරීමට පෙර අයදුම්කරු විසින් කොන්ත්‍රාත්කරුගේ සටහන් පොත හෝ පිරික්සුම් ලිපිය නිකුත්කිරීමේ නිලධාරියාට ඉදිරිපත් කළ යුතුය.

5. ටැන්ඩර් තැන්පත් මුදල කොළඹ කොටුවේ ර.වැ.දෙ. ප්‍රධාන කායභාලයේදී හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියකදී හෝ තැන්පත් කළ යුතුය.

මධ්‍යම කොට්ඨාශයේ අධිකාරි ඉංජිනේරු තැන.

ර.වැ.දෙ. කායභාලය,
මහනුවර,
1969.1.6.

1-821—69.1.24 දින අංක 14,838 දරන ගැසට් පත්‍රය

---

# තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

### ටෙන්ඩර් ප්‍රතිඵල

### යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ සැපයීම, 1968

| විෂය අංකය | විස්තරය | ප්‍රමාණය | ලැබුණු ටෙන්ඩර් ගනණ | සාර්ථක ටෙන්ඩර්කරුගේ නම | පිළිගත් ටෙන්ඩර්වල මුදල රු. | ශ. |
|---|---|---|---|---|---|---|
| 1. | ට්‍රැක්ටර් (සැහැල්ලු ගණයේ) ... | 1 ... | 10 ... | සීමාසහිත සී. අයි. ඒ. ඇස්. ... | 1,13,296 | 09 |
| 2. | ට්‍රැක්ටර් (බර ගණයේ) ... | 1 ... | 7 ... | එම ... ... ... | 4,18,683 | 65 |
| 3. | ප්‍රන්ට් එන්ඩ ලෝඩර් ... ... | 1 ... | 12 ... | එම ... ... ... | 1,44,180 | 40 |
| 4. | මෝටර් ග්‍රෙඩර් ... ... | 1 ... | 14 ... | සීමාසහිත වෝකර් සහ පුත්‍ර සමාගම ... ... | 1,34,505 | 70 |
| 5. | එයාර් කොම්ප්‍රෙසර් සහ විදුම් උපකරණ ... | 1 ... | 17 ... | සීමාසහිත fිපෘඩන්බර්ග් සමාගම ... ... | 1,10,570 | 70 |
| 6. | කොන්ක්‍රීට් මික්සර් ... ... | 1 ... | 16 ... | සීමාසහිත යුනයිටඩ් ට්‍රැක්ටර් ඇන්ඩ් ඉක්විප්මන්ට් ... | 9,151 | 70 |
| 7. | සෙමි ට්‍රෙලර් විත් පවර් මූවර් ... | — ... | 12 ... | සීමාසහිත වෝකර් සහ පුත්‍ර සමාගම ... ... | 1,51,011 | 36 |
| 8. | පවර් සෝ ... ... | — ... | 5 ... | සීමාසහිත යුනයිටඩ් ට්‍රැක්ටර්ස් ඇන්ඩ් ඉක්විප්මන්ට් ... | 1,814 | 75 |

එල්. ඕ. දඑස්. ගුණසේකර,
වාරිමාර්ග අධ්‍යක්ෂ වෙනුවට.

වාරිමාර්ග දෙපාර්තමේන්තුව, කොළඹ 7,
1969 ජනවාරි මස 12 දින දී ය.

1-838—69.1.24 දින අංක 14,838 දරන ගැසට් පත්‍රය

## 1968–69 ටෙන්ඩර් ප්‍රතිඵල

| සැපයීමේ විස්තරය | ටෙන්ඩර් කරුවන් ගේ ගණන | උප ලේඛන අංකය | ද්‍රව්‍ය අංකය | විස්තර | සාර්ථක ටෙන්ඩර්කරුගේ නම හා ලිපිනය | පිළිගත් මිළ ගණන් | රු. | ශ. |
|---|---|---|---|---|---|---|---|---|
| (1) සුදු හා වර්ණවත් පාසල් රටහුණු සැපයීම | 6 | 1 | 1 | පාසල් රටහුණු, පෙට්ටියකට කූරු 144 බැගින්—සුදු | වොල්ස්ටන් කැමිසන් ඉන්ඩස්ට්‍රීස්, 233, පරන යෝන් වීදිය, කොළඹ 12 | ග්‍රොස් 1 පෙට්ටියක් | 1 | 40 |
| | | | 2 | එම —වර්ණවත් | | | 2 | 50 |
| (2) පැන්සල් සැපයීම | 2 | 1 | 1 | කාර්‍යාලීය පැන්සල් | සී/ස. සිලෝන් පැන්සල් සමාගම, 94, පරාක්‍රම මාවත, පෑලියගොඩ | ග්‍රොස් එකක් | 18 | 80 |
| | | | 2 | ඇඳීමේ පැන්සල් | | එම | 28 | 75 |
| | | | 3 | කොපින් පැන්සල් | | එම | 30 | 75 |
| | | | 4 | නිල් ලකුණු දමන පැන්සල් | | එම | 32 | 45 |
| | | | 5 | රතු ලකුණු දමන පැන්සල් | | එම | 32 | 45 |
| | | | 6 | කොළ ලකුණු දමන පැන්සල් | | එම | 32 | 45 |
| | | | 7 | දුඹුරු පැන්සල් | | එම | 25 | 00 |
| | | | 8 | ලයිලැක් පැන්සල් | | එම | 25 | 00 |
| | | | 9 | පාට පැන්සල්—12හේ පෙට්ටි | | එම | 2 | 65 |
| | | | 10 | පාට පැන්සල්—6යේ පෙට්ටි | | එම | 1 | 50 |
| (3) අල්පෙනෙත්ති හා ඇමුණුම් කටු සැපයීම | 5 | 1 | 1 | කඩදාසි ඇමුණුම් කටු, ග්‍රොස් 1 පෙට්ටිවලින්—ලොකු | සිලෝන් පින්ස් ඇන්ඩ් ක්ලිප්ස් මැනුෆැක්චරි, කෝට්ටේ පාර, කෝට්ටේ | පෙට්ටියක් | 0 | 45 |
| | | | 2 | එම —කුඩා | | පෙට්ටියක් | 0 | 36 |
| | | | 3 | කාර්යාලීය ඇල්පෙනෙත්ති කටු මිශ්‍ර, අවු. 2 පැකැට්ටු | | පැකැට්ටුවක් | 0 | 46 |
| (4) බහු පිටපත් පොත් සැපයීම | 5 | 1 | 1 | බහු පිටපත් පොත් කොළ 100 හා අනුපිටපත් සමග 5½″ × 8½″ | මවුන්ට් ඉන්ඩස්ට්‍රීස්, 110, කිව් පාර, කොළඹ 2 | සියයක් | 182 | 0 |
| | | | 2 | බහු පිටපත් පොත් කොළ 100 හා අනුපිටපත් සමග 8½″ × 11″ | එම | සියයක් | 334 | 0 |
| | | | 3 | ලඝුලේඛන සටහන් පොත් පිටු 400 7⅞″ × 4⅞″ | බී. ඇන්. ප්‍රනාන්දු සහ සමාගම, තැ.පෙ. 895, කොළඹ 11 | සියයක් | 163 | 50 |

**1960 අංක 31 දරණ ලංකා විශේෂ විස්තරවලට අනුකූලව**

| සැපයීමේ විස්තරය | ටෙන්ඩර් කරුවන් ගේ ගණන | උප ලේඛන අංකය | ද්‍රව්‍ය අංකය | විස්තර | සාර්ථක ටෙන්ඩර්කරුගේ නම හා ලිපිනය | පිළිගත් මිළ ගණන් | රු. | ශ. |
|---|---|---|---|---|---|---|---|---|
| (5) මෙරට සෑදූ මුද්‍රා ලාකඩ සැපයීම | 4 | 1 | — | ලිපි මුද්‍රා ලාකඩ I වර්ගය, රාත්තලට කූරු 20 බැගින් | ප්‍රසාද ඉන්ඩස්ට්‍රීස්, 72/10, අවිස්සාවේල්ල පාර, මහරගම | ටොන් එකක් | 2,890 | 0 |
| | | 2 | — | තැපැල් මලු ලාකඩ III වර්ගය, රාත්තලට කූරු 4 බැගින් | කේ. ඒ. පී. යෙනෙවිරත්න, ආදුරුප්පු වීදිය, කොළඹ 13 | | 1,095 | 0 |
| (6) විශේෂ වර්ගයේ ලියුම් කවර සැපයීම | 5 | 1 | — | ලියුම්කවර, ශක්තිමත් දුඹුරු ක්‍රාෆ්ට් කඩදාසියෙන් තැනූ, මැලියම් රහිත, අමුද්‍රිත, පැකැට්ටුවක 25 බැගින් කාඩ්බෝඩ් පෙට්ටියකට 250 බැගින් අසුරා | මවුන්ට් ඉන්ඩස්ට්‍රීස්, 110, කිව් පාර, කොළඹ 2 | කවර 1,000ක් | | |
| | | | 1 | 17″ × 14″ | | එම | 94 | 0 |
| | | | 2 | 16″ × 13″ | | එම | 88 | 0 |
| | | | 3 | 14½″ × 10″ | | එම | 58 | 0 |
| | | | 4 | 10″ × 7″ | | එම | 34 | 0 |
| | | | 5 | ලියුම් කවර, ශක්තිමත් දුඹුරු ක්‍රාෆ්ට් කඩදාසියෙන් තැනූ මැලියම් රහිත, අමුද්‍රිත, පැකැට්ටුවක 25 බැගින් කාඩ්බෝඩ් පෙට්ටියකට 250 බැගින් අසුරා (විවෘතව) | මවුන්ට් ඉන්ඩස්ට්‍රීස්, 110, කිව් පාර, කොළඹ 2 | කවර 1,000ක් | 38 | 0 |
| | | | 6 | කැපූ ජනේලය ඇති 9½″ × 4½″ ලියුම් කවර, දුඹුරු ක්‍රාෆ්ට් කඩදාසියෙන් තැනූ, මැලියම් සහිත ''රාජ්‍ය සේවය පිණිසයි'' මුද්‍රිත 12½″ × 8½″ | | කවර 1,000ක් | 49 | 50 |
| (7) මෙරට සෑදූ එක්ස්රේ (X'RAY———) කවර සැපයීම | 7 | 1 | 1 | කවර එක්ස්-රේ ශක්තිමත්, දුඹුරු ක්‍රාෆ්ට් කඩදාසියෙන් සාදන ලද, මැලියම් රහිත වහනය ඇති, අමුද්‍රිත 18'' × 15'' | මවුන්ට් ඉන්ඩස්ට්‍රීස්, 110, කිව් පාර, කොළඹ 2 | කවර 1,000ක් | 146 | 0 |
| | | | 2 | එම 16″ × 13″ | ස්ටැන්ලි ජෝෂප් මයා., 124, දේවානම්පියතිස්ස මාවත, කොළඹ 10 | කවර 1,000ක් | 96 | 40 |
| | | | 3 | එම 13″ × 11″ | | එම | 67 | 90 |
| (8) උල්පත් පෑන් තීන්ත සැපයීම | 4 | — | — | තීන්ත පවුන්ටන් පෑන්වල පාවිච්චිය සඳහා අවු. 4රේ කුප්පි බ්ලූ බ්ලැක්, ස්ථිර නිල්, රෝයල් බ්ලූ, ස්ථිර කලු, කොළ, රතු, දම් | — | මිලදී ගැනීමක් නොකරන ලදී. ලැබී ඇති ටෙන්ඩර් සියල්ල ප්‍රතික්ෂේප කරන ලදී | | |

ඇස්. ඒ. පී. රූපසිංහ,
ගබඩා අධිකාරී.

1969 ජනවාරි මස 24 වෙනි දින,
කොළඹ දී ය.

1-903—69.1.24 දින අත අංක 14,838 දරන ගැසට් පත්‍රය

# බඩු බාහිරාදිය විකිණීම්

## බන්ධනාගාර දෙපාර්තමේන්තුව

මඩකලපු බන්ධනාගාරයට අයත් පෙරියතුරෙයි පිහිටි බන්ධනාගාර ගොවිපොලේ පහත සඳහන් කුකුළන් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම 1969.2.14 වැනි දින පෙරවරු 10.30 ට සිදුකෙරේ :—

(අ) අවුරුදු 1 මාස 7ක් වයසැති කිකිළියන් 56 දෙනෙකි.

(ආ) මාස 6 ක් වයසැති මිශ්‍ර වර්ගයේ කුකුළන් 43 දෙනෙකි.

2. ඉල්ලුම්කරුවන් විසින් (අ) සහ (ආ) කොටසේ දැක්වෙන කුකුළන් සඳහා වෙන වෙනම ඉල්ලුම් කළ යුතුය. වැඩිම මිළට ඉල්ලුම් කළ ඉල්ලුම්කරු වෙන්දේසිය අවසන් වී පැය 12 ක් ඇතුලතදී මුදල් ගෙවා සතුන් ඉවත් කර ගත යුතුය.

3. සතුන් මිළදී ගැණීමට බලාපොරොත්තුවන ගැණුම්කාරයින් විසින් බන්ධනාගාර අධිකාරිගේ අවසරය පිට සතුන් පරීක්ෂා කළ හැක.

4. කිසියම් ඉල්ලුම්කරුවකු හෝ සියලුම ඉල්ලුම්කරුවන් විසින් ඉදිරිපත් කරන ලද මිළ ගණන් ප්‍රශ්නයක් නොමැතිව ප්‍රතික්ෂේප කිරීමේ බලය පහත අත්සන් කරන අය සතුවේ.

ඒ. ඇස්. නාගරත්නම්,
උප අධිකාරි,
බන්ධනාගාරය, මඩකලපුව.

බන්ධනාගාරය,
මඩකලපුව,
1969.1.15.

1–886—69.1.24 දින අංක 14,838 දරන ගැසට් පත්‍රය

---

## වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව

### දැව වෙන්දේසිය—බටහිර දිසාව

සූරියමාර, බුරුත, මිල්ල, වෙලන්, දඹ, හොර යනාදි වර්ගයන්ට අයත් ඝන අඩි 508.1 යුත් කඳන් තොග 5ක්, ඉරුම් කියත් 1ක්, ජෑරෝ 1ක් සහ කැති 1ක් රත්නපුර දිසා වන නිලධාරි විසින් 69.1.28 දින පෙරවරු 10ට ඇඹිලිපිටිය අඩවි වන නිලධාරි කාර්යාල යේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

මෙම දැව ඇඹිලිපිටිය පොලිස් ථානයේ, පුපුලකැටිය මාර්ගාසන්න දැව ගබඩාවේ සහ මකුළුතොට අතුර මාර්ගාසන්න දැව ගබඩාවේ ඇත.

වෙන්දේසියට ප්‍රථම මෙම දැව බලා සෑහීමකට පත්විය හැක. වෙන්දේසිය පිළිබඳ වැඩිදුර විස්තර රත්නපුර දිසා වන නිලධාරි ගෙන් හෝ ඇඹිලිපිටිය අඩවි වන නිලධාරිගෙන් හෝ ලබාගත හැක.

ඇස්. ඇන්. යූ. ප්‍රනාන්දු,
බස්නාහිර දිසා වන නිලධාරි.

දිසා වන නිලධාරි කායර්‍යාලය,
රත්නපුර, 1969.1.3.

1–980—69.1.24 දින අංක 14,838 දරන ගැසට් පත්‍රය

---

## වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව

### දැව වෙන්දේසිය—වග අඩවිය

හොර, මිල්ල, කොස් යනාදී වර්ගයන්ට අයත් ඝන අඩි 336.5 යුත් කඳන් තොග 4ක්, හොර, මිල්ල, කොස්, දෙල්, හම්පැලඳ, ඇටහෙරලිය යනාදී වර්ගයන්ට අයත් ඝන අඩි 145.6 යුත් ඉරු දැව තොග 3ක්, තොග 6 කින් යුත් කම්බි කොට 552ක්, තොග 1 කින් යුත් 1 පන්තියේ කණු 200ක් සහ තොග 1 කින් යුත් විදුලි කණු 320ක් රත්නපුර දිසා වන නිලධාරි විසින් 1969.2.17 දින පෙරවරු 10ට වග අඩවි වන නිලධාරි කායර්‍යාලයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

මෙම දැව දීගන, මාරඹෙකන්ද යන මාර්ගාසන්න දැව ගබඩාවල සහ ගම්පහ මහෙස්ත්‍රාත් උසාවියේ ඇත. අනෙක් සියලුම දැව වන අපරාධවලට අයත් ඒවාය.

වෙන්දේසියට ප්‍රථම මෙම දැව බලා සෑහීමකට පත්විය හැක. වෙන්දේසිය පිළිබඳ විස්තර රත්නපුර දිසා වන නිලධාරි හෝ වග අඩවි වන නිලධාරිගෙන් හෝ ලබාගත හැක.

ඇස්. ඇන්. යූ. ප්‍රනාන්දු,
බස්නාහිර දිසා වන නිලධාරි.

දිසා වන නිලධාරි කායර්‍යාලය,
රත්නපුරය, 69.1.3.

1–979—69.1.24 දින අංක 14,838 දරන ගැසට් පත්‍රය

---

# තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම්

## වවුනියා දිස්ත්‍රික්කයේ රා රේන්ද විකිණීම

**1969 මාර්තු මස 1 සිට 1969 සැප්තැම්බර් මස 30 දින කාලය දක්වා**

1969 මාර්තු මස 1 ද සිට 1969 සැප්තැම්බර් මස 30 දක්වා වූ කාලය සඳහා වවුනියාව දිස්ත්‍රික්කයේ රා තැබෑරුම්වල සිල්ලරට රා විකිණීමේ අයිතිය පමණක් විකිණීම සඳහා (පහත සඳහන් කොන්දේසිවලට යටත් කොට) සුරාබදු බලපත්‍රයනට අදළ පොදු කොන්දේසි මාලාවට යටත්ව 1968/69 කාලය සඳහා අංක 14,819 හා 1968.9.13 වැනි දින ප්‍රකාශයට පත් ගැසට් පත්‍රයේ සඳහන් කොන්දේසිවලට අනුකූලව, ටෙන්ඩර් පත් මෙයින් කැඳවනු ලැබේ.

2. පහත දක්වා ඇති උපලේඛනයේ සඳහන් කර ඇති වේලාවට කලින් වවුනියාව දිස්ත්‍රික්කයේ දිසාපතිතුමා වෙත ලැබෙන පරිදි ටෙන්ඩර් පත්‍ර "1968/69 වර්ෂය සඳහා වවුනියාව දිස්ත්‍රික්කයේ රා රේන්ද මිළයට ගැනීමේ ටෙන්ඩරය " යි සඳහන් කර 1969 පෙබරවාරි මස 8 වැනි දිනට ප්‍රථම එවිය යුතුයි.

3. එක් එක් තැබෑරුම සඳහා වෙන වෙනම ටෙන්ඩර් පත්‍රය බැගින් එවිය යුතුයි. තවද, එක් අයකු විසින් එක තැබෑරුමක් සඳහා එක ටෙන්ඩර යකට වැඩි ගණනක් නොඑවිය යුතුය. එක් තැබෑරුමක් සඳහා පස් දෙනෙකුට නොවැඩි ගණනකට සාමූහිකව ටෙන්ඩරයක් එවිය හැකිය.

4. පහත සඳහන් කොන්දේසිවලට අනුකූල නොවූ ටෙන්ඩර් පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ :—

(අ) ටෙන්ඩර් පත්‍රය එවනු ලැබූ අය පුද්ගලිකව නොපැමිණියහොත්,

(ආ) සෑම ටෙන්ඩර් පත්‍රයකටම ටෙන්ඩර්කරුගේ නිශ්චල දේපල පිහිටි කොට්ඨාශයේ ප්‍රාදේශීය ආදයම් නිලධාරියා විසින් නිකුත් කරන ලද වත්කම් සහතිකයේ මුල් පිටපතද අමුණා තිබිය යුතු අතර, එක් තැබෑරුමකට වැඩියෙන් ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කරන අවස්ථාවල මෙහි පහත දක්වා ඇති පරිදි, මුල් පිටපත සහ එහි විධිමත් ලෙස සහතික කරන ලද පිටපතක් අමුණා තිබිය යුතුය. එවැනි වත්කම් සහතිකයක් අමුණා නොමැත්තාවූද, ටෙන්ඩරයේ දක්වෙන මුදල් ප්‍රමාණ යෙන් 25% කට අඩු වටිනාකමක් ඇති වත්කම් සහතිකයක් අමුණා ඇත්තාවූද, ඕනෑම ටෙන්ඩර් පත්‍රයක් ප්‍රතික්ෂේප කළ හැකිය. තැබෑරුම් එකකට වැඩි ගණනකට ටෙන්ඩර් ඉදිරිපත් කරන ටෙන්ඩර්කරුවන් විසින් එම රේන්ද වර්ෂ යේදීම අනික් එක් ටෙන්ඩරයක් සමග වත්කම් සහතිකයේ මුල් පිටපත අමුණා යවා ඇත්නම් අනිකුත් ටෙන්ඩරවලට එම සහතිකයේ, සහතික පිටපත් අමුණා යැවිය හැකිය. එවැනි අවස්ථාවලදී මුල් වත්කම් සහතිකය අමුණා යැවූ ටෙන්ඩරයට අදළ තැබෑරුමේ පිහිටීම, නම සහ අංකය දක්වෙන සටහනක් අනික් ටෙන්ඩර්පත්‍ර සමග ඉදිරිපත් කරන සහතික පිටපත්වල තිබිය යුතුය.

5. ටෙන්ඩර්පත්‍ර ලියා පදිංචි කළ තැපැලෙන් එවීම හෝ වවුනියාව දිසාපති කාර්යාලයේ තිබෙන ටෙන්ඩර් පෙට්ටියේ දැමීම හෝ වවුනියාව දිසාපතිතුමාට හෝ එතුමාගේ කාර්යාල සහකාර තැනට හෝ පුද්ගලිකව භාරදීම කළ හැකි නමුත්, ටෙන්ඩර්පත්‍ර එවනු ලබන ලියුම් කවරයේ වම් කෙළවරේ ටෙන්ඩරය එවනු ලැබූ තැබෑරුමේ නම හා අංකය සඳහන් කර කවරය සීල් තබා එවිය යුතුය. එක් එක් ටෙන්ඩරය සම්බන්ධයෙන් එක් ලියුම් කවරය බැගින් පාවිච්චි කළ යුතු අතර, එක් එක් ලියුම් කවරයේ ඉහතින් සඳහන් කර ඇති පරිදි තැබෑරුමේ නම හා අංකය සඳහන් කළ යුතුය.

6. විකිණීමේ කොන්දේසි සපුරාලීම වශයෙන් සෑම ටෙන්ඩර් පත්‍රිකාවක් සමගම රු. 1,000ට කච්චේරි කුවිතාන්සියක් ඇමිණිය යුතුයි. සියළුම තැන්පත් කිරීම වවුනියා දිස්ත්‍රික්කයේ දිසාපති නමින් විය යුතුය. සාර්ථක වූ ටෙන්ඩර් පත්‍රිකාව ඉදිරිපත් කළ අය ඔහුට එම වරප්‍රසාදය හිමි වූ විගසම විකිණීමේ කොන්දේසිවලට අත්සන් තැබීමට ඉදිරිපත් නොවුවහොත් ඇප මුදල රාජසන්තක වේ.

7. ඕනෑම ටෙන්ඩරයක් ප්‍රතික්ෂේප කිරීමේ බලය වවුනියාව දිසාපතිතුමා සතුය.

8. සාර්ථක ලෙස ටෙන්ඩරය ඉදිරිපත් කරන ලද ටෙන්ඩර්කරු රාජේන්ද්‍ර මිළට ගත් ලෙස ප්‍රකාශයට පත්කළ වහාම වවුනියා දිසාපතිතුමා විසින් ඇප මුදල් වශයෙන් නියම කරනු ලබන මුදල වහාම දිසාපතිතුමා වෙත ගෙවිය යුතු අතර, ටෙන්ඩර්කරු විසින් අවශ්‍ය මුද්දර ඉදිරිපත් කර කොන්දේසිමාලාවකට හා කොන්ත්‍රාත්තුවකට අත්සන් තැබිය යුතුය.

9. සාර්ථක ලෙස ටෙන්ඩර් කරන ලද අය ගැනුම්කරු ලෙස ප්‍රකාශයට පත් කළ වහාම තමා විසින් තැබෑරුම පවත්වාගෙන යාමට තෝරාගත් ස්ථානය දිසාපතිතුමාට දැන්විය යුතු අතර, ඒ සඳහා එතුමාගෙන් අනුමැතිය ලබාගත යුතුය.

10. පූර්වෝක්ත විකිණීම සම්බන්ධ කොන්දේසි හා වෙනත් විස්තර සඳහා වවුනියාව දිසාපති කාර්යාලයට ලියා විමසන්න.

## උපලේඛනය

| අංකය හා ප්‍රදේශය | | තැබෑරුම් පිහිටි පළාත් පාලන කොට්ඨාශය | | ටෙන්ඩර් භාරගැනීම නවත්වන වේලාව |
|---|---|---|---|---|
| 2 වලයන්මඩම | ... | ගම්සීමාව තුළ | ... | පෙ.ව. 10.00 ට |
| 6 අලම්පිල් | ... | ගම්සීමාව තුළ | ... | පෙ.ව. 10.15 ට |

බී. සී .පෙරේරා,
වවුනියා දිසාපති.

1969 ජනවාරි මස 15 වැනි දින,
වවුනියා දිසාපති කාර්යාලයේදීය.

1–982—69.1.24 දින අංක 14,838 දරන ගැසට් පත්‍රය

## ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳ වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළකරනු ලැබේ. සිකුරාද දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදන බාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපැලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව, එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් උවමනා ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුලත් වනවාත් හැර එය සියළුදෙනාගේ පහසුවට ද හේතුවන බව සලකන්න.

ආණ්ඩුවේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දයක මුදල් භාර නොගනී. **සියළුම දයක මුදල් කොළඹ මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කෙළින්ම ගෙවිය යුතුය.**

### උපලේඛනය

### 1969

| මාසය | | පළකිරීමේ දිනය | | | ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ජනවාරි | ... | 3. 1.69 | සිකුරාද | ... | 24.12.68 | අඟහරුවාද | ප.ව. | 3.30 |
| | | 9. 1.69 | බ්‍රහස්පතින්ද | ... | 3. 1.69 | සිකුරාද | ප.ව. | 3.30 |
| | | 16. 1.69 | බ්‍රහස්පතින්ද | ... | 9. 1.69 | බ්‍රහස්පතින්ද | දවල් | 12.00 |
| | | 24. 1.69 | සිකුරාද | ... | 16. 1.69 | බ්‍රහස්පතින්ද | දවල් | 12.00 |
| | | 31. 1.69 | සිකුරාද | ... | 24. 1.69 | සිකුරාද | දවල් | 12.00 |
| පෙබරවාරි | ... | 7. 2.69 | සිකුරාද | ... | 31. 1.69 | සිකුරාද | දවල් | 12.00 |
| | | 14. 2.69 | සිකුරාද | ... | 7. 2.69 | සිකුරාද | ප.ව. | 3.30 |
| | | 21. 2.69 | සිකුරාද | ... | 14. 2.69 | සිකුරාද | ප.ව. | 3.30 |
| | | 27. 2.69 | බ්‍රහස්පතින්ද | ... | 20. 2.69 | බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |
| මාර්තු | ... | 7. 3.69 | සිකුරාද | ... | 27. 2.69 | බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |
| | | 14. 3.69 | සිකුරාද | ... | 7. 3.69 | සිකුරාද | ප.ව. | 3.30 |
| | | 21. 3.69 | සිකුරාද | ... | 14. 3.69 | සිකුරාද | ප.ව. | 3.30 |
| | | 28. 3.69 | සිකුරාද | ... | 21. 3.69 | සිකුරාද | ප.ව. | 3.30 |
| අප්‍රේල් | ... | 3. 4.69 | බ්‍රහස්පතින්ද | ... | 27. 3.69 | බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |
| | | 11. 4.69 | සිකුරාද | ... | 31. 3.69 | සඳුද | ප.ව. | 3.30 |
| | | 18. 4.69 | සිකුරාද | ... | 8. 4.69 | අඟහරුවාද | දවල් | 12.00 |
| | | 25. 4.69 | සිකුරාද | ... | 18. 4.69 | සිකුරාද | ප.ව. | 3.30 |
| | | 30. 4.69 | බදාද | ... | 23. 4.69 | බ්‍රහස්පතින්ද | දවල් | 12.00 |
| මැයි | ... | 9. 5.69 | සිකුරාද | ... | 30. 4.69 | බදාද | ප.ව. | 3.30 |
| | | 15. 5.69 | බ්‍රහස්පතින්ද | ... | 9. 5.69 | සිකුරාද | ප.ව. | 3.30 |
| | | 22. 5.69 | බ්‍රහස්පතින්ද | ... | 15. 5.69 | බ්‍රහස්පතින්ද | දවල් | 12.00 |
| | | 30. 5.69 | සිකුරාද | ... | 22. 5.69 | බ්‍රහස්පතින්ද | දවල් | 12.00 |
| ජූනි | ... | 6. 6.69 | සිකුරාද | ... | 30. 5.69 | සිකුරාද | දවල් | 12.00 |
| | | 13. 6.69 | සිකුරාද | ... | 6. 6.69 | සිකුරාද | දවල් | 12.00 |
| | | 20. 6.69 | සිකුරාද | ... | 13. 6.69 | සිකුරාද | දවල් | 12.00 |
| | | 27. 6.69 | සිකුරාද | ... | 20. 6.69 | සිකුරාද | ප.ව. | 3.30 |

**එල්. ඩබ්ලිව්. පී. පීරිස්,**
වැඩබලන ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1968 දෙසැම්බර් මස 20 වැනි දින,
**ආණ්ඩුවේ මුද්‍රණාලය, කොළඹ.**

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රපිතයි.